# පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුව

## ශ්‍රී ලංකා නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය

**2018-2021**

## වැළකුම් ක්‍රමෝපායන් මගින් නායයාම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය

## ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව

**(AIIB)**


**සකස් කරන ලද්දේ:**

**පාරිසරික අධ්‍යයන සහ සේවා අංශය**

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

**99/1,** ජාවත්ත පාර

කොළඹ **05**

පටුන

**1 වන පරිච්ඡේදය ..................................................................................................1**

1.1 ව්‍යාපෘති පසුබිම ..................................................................................................1

1.2 පාරිසරික සහ සමාජ සුරැකිතා සහ විධිනියෝග ..............................................1

1.3 ස්ථානීය පාරිසරික හා සමාජ බලපෑම් ඇගයීම හා කළමනාකරණ සැලසුම් ..................................................................................................1

1.4 නායයෑම් මඟින් වර්තමානය වන විට මතුව ඇති අවදානම ............................2

1.5 නායයෑම් ආපදා අවදානම කළමනාකරණය සඳහා ඇති ජාතික වැඩපිළිවෙල ..................................................................................................3

1.6 වර්තමාන නායයෑම් කළමනාකරණ උපායමාර්ග යටතේ නායයෑම් ආපදා අවදානම අවම වීම් ..................................................................................................7

1.7 AIIB මූල්‍ය ආධාර යටතේ සිදුකෙරෙන ශ්‍රී ලංකාවේ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය ..................................................................................................7

**2 වන පරිච්ඡේදය- ව්‍යාපෘති ප්‍රදේශයේ පොදු මූලික පාරිසරික හා සමාජීය තත්ව ..9**

2.1 සාමාන්‍ය පාරිසරික වටපිටාව ..................................................................................................9

2.2. සමාජ ආර්ථිකමය සැකැස්ම ..................................................................................................12

**3 වන පරිච්ඡේදය- පාරිසරික හා සමාජයීයනීති ව්‍යවස්ථා/ නියාමන රාමුව හා ආයතනික රාමුව ..................................................................................................18**

3.1 ජාතික මට්ටමේ රෙගුලාසි ..................................................................................................18

3.2 යෝජිත නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා බලපාන AIIB හි පාරිසරික හා සමාජයීය සුරැකිතා විධිවිධාන ..................................................................................................31

3.3 අඩුලුහුඩුතා විශ්ලේෂණය හා එම අඩුලුහුඩුතා මඟ හරවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග ..................................................................................................31

**4 වන පරිච්ඡේදය- පාරිසරික සහ සමාජයීය බලපෑම් හා අවම කිරීමේ ක්‍රම පිළිබඳ සාමාන්‍ය තක්සේරුව ..................................................................................................35**

4.1 පරිසරික හා සමාජයීය ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා මූලික තේරීම් හා එහි විෂය පථය ..................................................................................................35

4.2 AIIB හි පාරිසරික හා සමාජයීය ආරක්ෂණ ප්‍රතිපත්ති වලට අනුව ව්‍යාපෘතිය වර්ගීකරණය කිරීම ..................................................................................................36

4.3 පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් තිබීමේ අවශ්‍යතාවය ..............................36

4.4 විෂය පථ සැකසීම ..................................................................................................38

4.5 අපේක්ෂිත පාරිසරික බලපෑම් ..................................................................................................40

4.6 යෝජිත අවම කිරීමේ ක්‍රියාමාර්ග ..................................................................................................52

**5 වන පරිච්ඡේදය- වගකිව යුතු ආයතන හා අවදානමේ සිටින ප්‍රජාව සමඟ උපදේශන සේවා පැවැත්වීම සහ තොරතුරු හෙළිදරව් කිරීම .................................62**
**5.1 පාරිසරික හා සමාජයීය කළමනාකරණ ලිපිගොනු හෙළිදරව් කිරීම** ...............65
**6 වන පරිච්ඡේදය- අනුමැති/ කැමැත්ත/ යෝග්‍යතා හා එකඟතා.............................67**
**6.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතියන් ලබා ගැනීම** ............................67
**6.2 රජයේ ඉඩම්වල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කැමැත්ත ලබා ගැනීම**.....................................................................................................................67
**6.3 වෙනත් අනුමැතියන්**.......................................................................................70
**8 වන පරිච්ඡේදය- දුක්ගැනවිලි සාධනීය ලෙස විසඳීම සඳහා වන යාන්ත්‍රණය ........78**
**9 වන පරිච්ඡේදය - ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනික සැකැස්ම හා මූලික සේවක මණ්ඩලයේ කාර්යභාරය හා වගකීම් .............................................................81**
**9.1 ව්‍යාපෘතිය සඳහා මූල්‍ය පහසුකම් සපයන ආයතනය** ...........................................81
**9.2 ක්‍රියාත්මක කිරීමේ ආයතනය හා ක්‍රියාවට නැංවීමේ ආයතන**..........................81
**9.3 ව්‍යාපෘති කළමනාකරණ ඒකකය** (Project Management Unit – PMU)..........................81
**9.4 ව්‍යාපෘති අධීක්ෂණ උපදේශක අංශය** ...................................................................82
**9.5 ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු** .....................................................................................83
**9.6 ව්‍යාපෘතිය සඳහා වැදගත් වන රාජ්‍ය ආයතන හා ආයතනික යාන්ත්‍රණය**....83
i. **මධ්‍යම පරිසර අධිකාරිය** .......................................................................................83
**9.7 අදාල පාරිසරික හා සමාජයීය සුරැකිතා ලියකියවිලි**........................................84
**9.8 ධාරිතාව වර්ධනය කිරීම; පුහුණු කිරීම සහ දැනුවත් කිරීම්** ................................85
**9.9 පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම සඳහා යන වියදම නිර්ණය කිරීම**.....................................................................................................................85

## ඇමුණුම් ලැයිස්තුව

ඇමුණුම I - නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති සඳහා ස්ථානීය පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම් සැකසීම සඳහා වන කාර්ය නිර්දේශය
ඇමුණුම II - නායයෑම් අවම කිරීමේ ව්‍යුහාත්මක ක්‍රමවේද
ඇමුණුම III - එකඟතා ගිවිසුම
ඇමුණුම IV - ඉදිකිරීමේ කටයුතු අතරතුර පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සතු කාර්යය 2001 - පාරිසරික සහ සමාජයීය ප්‍රත්පත්තිය

# රූපසටහන් ලැයිස්තුව


රූපසටහන 1: ශ්‍රී ලංකාව තුල නායයෑම් පැතිරීම දැක්වෙන සිතියම; මූලාශ්‍රය NBRO................2
රූපසටහන 2: නායයෑම් හේතුවෙන් සිදු වූ මරණ; මූලාශ්‍රය NBRO ................................................2
රූපසටහන 3: ශ්‍රී ලංකාවේ නායයෑම් ආපදා කලාප සිතියම NBRO..............................................4
රූපසටහන 4: ශ්‍රී ලංකාව තුල නායයෑම ප්‍රවනතාවය සහිත දිස්ත්‍රික්ක වල උන්නතාංශය දැක්වෙන සිතියම ..........................................................................................................10
රූපසටහන 5 ශ්‍රී ලංකාවේ නායයෑමේ ප්‍රවනතාවක් තිබෙන දිස්ත්‍රික්ක තුල වනාන්තර ආවරණය විහිදී ඇති ආකාරය (මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව-2016) ........................................11
රූපසටහන 6: ශ්‍රී ලංකාවේ නායයෑමේ හැකියාවක් පවතින දිස්ත්‍රික්ක තුල වනාන්තර ආවරණය ..........................................................................................................12
රූපසටහන 7: ශ්‍රී ලංකාවේ නායයෑමේ ප්‍රවනතාවයක් පවතින ප්‍රදේශ වල ජනගහනය හා ස්ත්‍රී පුරුෂ භාවය විහිදී ඇති ආකාරය (මූලාශ්‍රය ශ්‍රී ලංකාවේ සංඛ්‍යාලේඛන 2012)..................13
රූපසටහන 8: ශ්‍රී ලංකාවේ නායයෑමේ හැකියාවක් පවතින ප්‍රදේශ තුල විහිදී ඇති ජාතීන්ගේ ප්‍රතිශතය (මූලාශ්‍ර: සංඛ්‍යාලේඛන, 2012) ..........................................................................................13
රූපසටහන 8: ශ්‍රී ලංකාවේ නායයෑමේ හැකියාවක් පවතින ප්‍රදේශ තුල විහිදී ඇති ජාතීන්ගේ ප්‍රතිශතය (මූලාශ්‍ර: සංඛ්‍යාලේඛන, 2012) ..........................................................................................13
රූපසටහන 9: ශ්‍රී ලංකාවේ නායයෑමේ ප්‍රවනතාවයක් පවතින ප්‍රදේශ වල ජන ඝනත්වය සහ ග්‍රාමීය, නාගරික, වතු අංශ වලට අයත් ජනගහනය (මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව)............14
රූපසටහන 10: ශ්‍රී ලංකාවේ නායයෑමේ ප්‍රවනතාවක් ඇති දිස්ත්‍රික්ක වල සාක්ෂරතා *අනුපාතය* (මූලාශ්‍රය; ශ්‍රී ලංකා මහ බැංකුව)..........................................................................14
රූපසටහන 11: ශ්‍රී ලංකාවේ නායයෑමේ ප්‍රවනතාවයක් පවතින දිස්ත්‍රික්ක තුල නිවාස වර්ග (2012 සංඛ්‍යාලේඛන) ..........................................................................................15
රූපසටහන 12: ශ්‍රී ලංකාවේ නායයෑමේ ප්‍රවනතාවක් පවතින දිස්ත්‍රික්ක වල මාසික මධ්‍ය අදායම් හා වියදම් තත්වය: 2016 සංඛ්‍යාලේඛන..........................................................16
රූපසටහන 13:නායයෑමේ ප්‍රවනතාවක් පවතින දිස්ත්‍රික්ක වල දරිද්‍රතා දර්ශකය සහ දිළිඳු පවුල් ඒකක ගණන :2016 සංඛ්‍යාලේඛන ..........................................................16
රූපසටහන 14: ශ්‍රී ලංකාවේ නායයෑමේ ප්‍රවනතාවක් ඇති දිස්ත්‍රික්ක වල පරිපාලන(දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය) මායිම් ..........................................................................................18
රූපසටහන 15: 1911දී වැදි ජනයාගේ ව්‍යාප්තිය ..........................................................29
රූපසටහන 16: 2010 දී වැදි ජනයාගේ ව්‍යාප්තිය ..........................................................30

# වගු

වගුව 1: නායයෑමේ අවදානම පවතින ප්‍රදේශ (මූලාශ්‍රය: NBRO) ....................................... 4
වගුව 2: විමෝචනය/ දූෂණය පාලනය සඳහා වන ජාතික පාරිසරික රෙගුලාසි ....... 20
වගුව 3: ස්වභාවික සම්පත් ආරක්ෂාව සඳහා වූ ජතික පාරිසරික රෙගුලාසි ........... 21
වගුව 4: ව්‍යාපෘතියට අදාළ වෙනත් රෙගුලාසි ............................................................... 23
වගුව 6: සෘණාත්මක පාරිසරික බලපෑම් ........................................................................... 42
වගුව 7: සමාජයීය/ වෘත්තිමය බලපෑම් ........................................................................... 47
වගුව 8: ඉදිකිරීම් අදියරේදී පාරිසරික බලපෑම් අවම කිරීම ............................................... 54
........................................................................................................................................ 57
වගුව 9: ඉදිකිරීම් අදියරේදී සිදුවන සමාජයීය/වෘත්තිමය බලපෑම් අවම කිරීම ........ 57
වගුව 10: වගකිවයුත්තන් හා උපදේශන සේවය ............................................................. 62
වගුව 11: යෝජිත තොරතුරු හෙළිදරව් කිරීමේ ක්‍රමවේද ය ................................................. 65
වගුව 12: ඉදිකිරීම් අදියරේදී පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම සඳහා කොන්ත්‍රාත්කරුගෙන් ඇති අවශ්‍යතාව ක්‍රියාත්මක කිරීම සහ දෙන ලද ස්ථානයක් වෙත එහි අදාලත්වය (ආකෘතිය) (ඇමුණුම IV බලන්න) ............................ 73
වගුව 13: ඉදිකිරීම් අදියර සඳහා සාම්ප්‍රදායික පාරිසරික ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීමේ කාලසටහනක් ....................................................................................... 76
වගුව 14: අදාල වන පාරිසරික හා සමාජයීය ආරක්ෂක ලියකියවිලි ............................ 84

# 1 වන පරිච්ඡේදය

## 1.1 ව්‍යාපෘති පසුබිම

ශ්‍රී ලංකාවේ පළාත් 6ක ඇති දිස්ත්‍රික්ක 11 ක් පුරා පැතිරී පවතින නායයෑමේ අධි අවදානමක් පවතින බෑවුම් වල නායයෑම් අවදානම අවම කිරීමට හා නායයෑම් වලක්වා ලීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙන් ණය ආධාර ලබා ගැනීමට බලාපොරොත්තු වෙයි.

මෙම ව්‍යාපෘතිය යටතේ අදාල ප්‍රදේශ වල සුලභව සිදු වන නායයෑම් වලින් මාර්ග, පාසැල්, අධි අවධානමට ලක්ව ඇති පවුල්, දුම්රිය මාර්ග සහ සේවා වැනි වැදගත් යටිතල පහසුකම් ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය නායයෑම් අවම කිරීමේ ක්‍රමෝපාය ක්‍රියාවට නැංවීම අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව ශ්‍රී ලංකා රජයට ණයාධාර ලබා දීමට සැලසුම් කරයි. මෙම ආයෝජනයේ සංරචක 3කින් සමන්විත වේ.

i. 1 වන සංරචකය- නායයෑම් අවම කිරීම සඳහා අවශ්‍ය සිවිල් වැඩ හා ඒ හා අදාල වන සැලසුම් නිර්මාණය කිරීම හා කොන්ත්‍රාත් වැඩ අධීක්ෂණය සහ කළමනාකරණය
ii. 2 වන සංරචකය - නායයෑම් කළමනාකරණයට අදාල ප්‍රතිපත්ති හා රෙගුලාසි වැඩිදියුණු කිරීම.
iii. 3 වන සංරචකය- ආයතනික ධාරිතා සංවර්ධනය

## 1.2 පාරිසරික සහ සමාජ සුරැකිතා සහ විධිනියෝග

මෙම ව්‍යාපෘතිය AIIB හි හා ශ්‍රී ලංකාවේ පාරිසරික සහ සමාජ ආරක්ෂණ සහ විධිනියෝග වලට අනුකූලව සිදු විය යුතු වේ. ව්‍යාපෘති ක්‍රියාවලියන්හි ස්වභාවයට අනුව මෙම ව්‍යාපෘතිය සඳහා පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුවක් සැකසිය යුතු බව AIIB මඟින් රජයට දැනුම් දී ඇත.

මෙම පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවෙහි අරමුණ වන්නේ ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන අතරතුර AIIB හි සුරැකිතා විධිවිධාන මෙන්ම ජාතික පාරිසරික සහ සමාජයීය විධි නියෝග ද ආශ්‍රය කරගන්නා අයුරු වෙත මාර්ගෝපදේශ සැපයීමයි. පාරිසරික සහ සමාජයීය බලපෑම් අවම වන පරිදි ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවෙන මුළු කාල සීමාව තුලදීම මෙම රාමුව යටතේ ගොඩනගා ඇති පාරිසරික සහ සමාජයීය කළමනාකරණ සැලසුම් ක්‍රියාවට නැංවෙන බව තහවුරු කරගැනීම ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ ආයතනය (ජා.ගො.ප.ස) සතුවී ඇති වගකීමකි.

මෙම පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව, 1 වන සංරචකයෙහි අඩංගු ස්ථාන 147 ටම අදාල වන අතරම ව්‍යාපෘතිය කරගෙන යෑමේදී හඳුනා ගන්නා උප ව්‍යාපෘතිවල පාරිසරික හා සමාජයීය කළමනාකරණයන් සඳහාද අදාල වේ. මෙම තේරීමේ ක්‍රියාවලිය සහ ඇගයීම AIIB හි පාරිසරික හා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති වලට මෙන්ම ණය මුදල් ලබා ගන්නා රටෙහි පාරිසරික සමාජ ආරක්ෂණ පද්ධතියටද අනුකූල වන ලදී.

## 1.3 ස්ථානීය පාරිසරික හා සමාජ බලපෑම් ඇගයීම හා කළමනාකරණ සැලසුම්

විෂයපථ අභ්‍යාසය අතරතුර දී, පාරිසරික, සමාජයීය හා සෞඛ්‍යාරක්ෂක තත්වයන් එක් එක් ස්ථානය අනුව වෙනස්වන බැවින් එම කරුණු වෙන වෙනම ස්ථාන වශයෙන් සලකා බැලිය

යුතු බව අනාවරණය වන ලදී. එමනිසා, එක් එක් ස්ථානය සඳහා ස්ථානීය පාරිසරික සහ සමාජයීය ඇගයීමක් සිදුකිරීමෙන් අනතුරුව **ස්ථානීය පාරිසරික සහ සමාජයීය කළමනාකරණ සැලසුමක්** ගොඩනැගිය යුතු බව පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුවෙන් නිර්දේශ කර ඇත. ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවෙන අතරතුර, එනම් සැලසුම්කරණය, නිර්මාණය, ඉදිකිරීම සහ මෙහෙයුම් යන මේ අවධි වලදී සලකා බැලීමට අවශ්‍ය වන පාරිසරික, සමාජයීය සහ සෞඛ්‍යාරක්ෂක කළමනාකරණ පියවර මෙම ස්ථානීය පාරිසරික සහ සමාජයීය කළමනාකරණ සැලසුමෙන් ඉදිරිපත් කෙරේ. ගැඹුරින් සිදු කල පාරිසරික හා සමාජයීයය තක්සේරුවක් පාදක කරගෙනමෙමසැලසුම් නිර්මාණය කෙරේ. මෙම තක්සේරු කිරීම් පහත කරුණු සඳහා උපයෝගී කර ගනු ලැබේ.

i. ව්‍යාපෘතිය නිසා බලපෑමට ලක්විය හැකි සංවේදී පාරිසරික සහ සමාජයීය අංග හඳුනාගැනීමට
ii. ව්‍යාපෘති ක්‍රියාමාර්ග නිසා ඇතිවිය හැකි සැලකිය යුතු තරමේ පාරිසරික සහ සමාජයීය බලපෑම් හඳුනාගැනීමට
iii. අවම කිරීමට අවශ්‍ය ස්ථානීය වශයෙන් විශේෂිත වන සෞඛ්‍ය හා ආරක්ෂක ගැටළු හඳුනා ගැනීම.
iv. සිදුවිය හැකි සියලුම බලපෑම් සඳහා අවශ්‍ය පාරිසරික, සමාජයීයය, සෞඛ්‍ය හා ආරක්ෂක බලපෑම් අවම කිරීමේ ක්‍රමවේදයන් යෝජනා කිරීම.
v. මෙම ව්‍යාපෘතියට අදාලව වන සුදුසු පාරිසරික හා සමාජීය අධීක්ෂණ අවශ්‍යතා තීරණය කිරීම.
vi. ව්‍යාපෘති හා ස්ථාන වලට අදාලව ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවෙන අතරතුර අවශ්‍ය වන සුදුසු පාරිසරික රෙගුලාසි හා ක්‍රමවේද තීරණය කිරීම.

***සියලුම ස්ථාන සඳහා ස්ථානීය පාරිසරික හා සමාජීය තක්සේරු කිරීමක් සිදු කරන අතර එමඟින් ලැබෙන දත්ත වලට අනුකූලව ස්ථානීය පාරිසරික හා සමාජීය කලමනාකරණ සැලසුම් නිර්මාණය කෙරේ.*** ස්ථානීය පාරිසරික හා සමාජීය තක්සේරු කිරීමේ කාර්යය සඳහා වන කාර්ය නිර්දේශය (Term of Reference - TOR) ඇමුණුම 1 හි දක්වා ඇත.

## 1.4 නායයෑම් මඟින් වර්තමානය වන විට මතුව ඇති අවදානම




**රූපසටහන 1: ශ්‍රී ලංකාව තුල නායයෑම් පැතිරීම දැක්වෙන සිතියම; මූලාශ්‍රය NBRO**

නායයෑම් යනු ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරය ආශ්‍රිතව බහුලව සිදුවන ස්වභාවික උවදුරක් වන අතර ජන ජීවිතයට, දේපලවලට, ගොඩනැගිලි වලට, යටිතල පහසුකම් වලට මෙන්ම ස්වභාවික පරිසරයටද හානි පමුණුවන උග්‍ර පාරිසරික ගැටළුවක් බවටද පත් වී ඇත.. ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 20% කඳුකර ප්‍රදේශ වන අතර මුළු ජනගනයෙන් 30%ක් මෙම ප්‍රදේශයේ ජීවත් වෙයි. වර්තමානය වන විට නායයෑමේ අවදානම සහිත දිස්ත්‍රික්ක දොළසක් හඳුනා ගෙන ඇති අතර ඒවා මාතලේ, නුවර, බදුල්ල, නුවරඑළිය, කෑගල්ල, රත්නපුර, කළුතර, මොනරාගල, ගාල්ල, මාතර, හම්බන්තොට හා කුරුණෑගල දිස්ත්‍රික්ක වේ. 1වන රූපසටහන මඟින් 1947 සිට 2002,2003 සහ 2007 දක්වා සිදුව ඇති නායයෑම් වල ව්‍යාප්තිය පෙන්නුම් කරයි. මෙම දත්ත වලට අනුව නායයෑමේ

අධිකතම අවදානම සහිත දිස්ත්‍රික්කය රත්නපුර ලෙස හඳුනා ගෙන ඇත. නායයෑමේ වැඩි අවදානමක් සහිත අනෙක් දිස්ත්‍රික්ක වන්නේ කළුතර, නුවරඑළිය, බදුල්ල හා මාතර යි. මිනිස් ක්‍රියාකාරකම් හා දේශගුණික විපර්‍යාස හේතුවෙන් ක්‍රමයෙන් ඉහළ යන වර්ෂාපතන තීව්‍රතාවය නිසා පසුගිය වසර 10 තුල නායයෑම් වල වර්ධනයක් පෙන්නුම් කරයි. 2 වන රූපසටහන මඟින් 1964 සිට 2017 දක්වා නායයෑම් හේතුවෙන් සිදු වු මරණ සංඛ්‍යාව නිරූපණය කෙරේ.

### 1.4.1. ප්‍රවාහන යටිතල පහසුකම් වලට සිදුවී ඇති හානි



රූපසටහන 2 නායයෑම් හේතුවෙන් සිදු වු මරණ; මුලාශ්‍රය NBRO

නායයෑම් හා අස්ථාවර බෑවුම් හේතුවෙන් වැඩි වශයෙන් හානියට පත් වී ඇත්තේ ප්‍රවාහන යටිතල පහසුකම් වේ. නායයෑම් හා අස්ථාවර බෑවුම් හේතුවෙන් වර්ෂා කාලවලදී කඳුකර ප්‍රදේශයන්හී මාර්ග භාවිතා කිරීම අනාරක්ෂිත වේ. සුන්බුන් ගලා යාම් හා පාෂාණ කුට්ටි පතිත වීම් නිසා නිරන්තරයෙන් මාර්ග වසා දැමීමට ද, රථවාහන වල ගමනාගමනය අඩාල වීම ද සිදු වන අතරම සුන්බුන් සහ පාෂාණ කුට්ටි ආදිය ඉවත් කිරීමේ කටයුතු සඳහා ක්‍රමවත් නඩත්තු කිරීම් ද අවශ්‍ය කෙරේග වේ. ජා.ගො.ප. සංවිධාන සංඛ්‍යාලේඛන අනුව වර්තමානය වනවිට මුළු මාර්ග වල දිගින් කි.මි. 15ක් පමණ නායයෑම් හා බෑවුම් අස්ථාවර විම් නිසා බලපෑමට ලක් වී ඇත.

## 1.5 නායයෑම් ආපදා අවදානම කළමනාකරණය සඳහා ඇති ජාතික වැඩපිළිවෙල

ශ්‍රී ලංකාවේ නායයෑම් ආපදා අවදානම කළමනාකරණය සඳහා ඇති ජාතික කේන්ද්‍රීය ආයතනය වන්නේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයයි. නායයෑම් ආපදා අවදානම කළමනාකරණය සඳහා ඇති මූලික ආයතනය ලෙස NBRO හඳුනා ගැනීමෙන් අනතුරුව නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘති ගණනාවක්ම ආරම්භ විය.

### 1.5.1 නායයෑම් අවදානම් කලාප සිතියම් ගත කිරීමේ ව්‍යාපෘතිය (LHMP)

නායයෑම් අවදානම් කලාප සිතියම්ගත කිරීමේ ව්‍යාපෘතියේ අරමුණ වන්නේ මධ්‍යම කඳුකරයේ පවතින නායයෑමේ ප්‍රවනතාවය සහිත ප්‍රදේශ හදුනා ගැනීමයි. විශේෂඥ කණ්ඩායමක පුළුල් අධ්‍යයනයක ප්‍රතිඵලයක් ලෙස ගොඩනගන ලද මෙම සිතියම් කිරීමේ ක්‍රමවේදයට අනුව, නායයෑම් අවදානම කලාප 4කට වර්ගීකරණය කර ඇත. 1වන කලාපය- *නායයෑම් සිදුවීමට ප්‍රවනතාවයක් නොමැත* 2වන කලාපය- මධ්‍යම වශයෙන් නායයෑමේ ප්‍රවනතාවයක් පවතී. 3 වන කලාපය- නායයෑම් අපේක්ෂා කල හැකියි. 4 වන කලාපය- නායයෑමේ වැඩි හැකියාවක් පවතී.




**රූපසටහන 1: ශ්‍රී ලංකාවේ නායයෑම් ආපදා කලාප සිතියම NBRO**

ලංකාවේ දැනට හදුනාගෙන ඇති නායයෑමේ ප්‍රවනතාවයක් ඇති දිස්ත්‍රික්ක සියල්ලම සඳහා වර්තමානය වන විට 1:50,000 පරිමාණයේ නායයෑම් අවදානම් කලාප සිතියම් නිර්මාණය කර ඇත. මෙම සිතියම් ජාතික/දිස්ත්‍රික්ක/කොට්ඨාශ මට්ටමින් පවතින නායයෑමේ ප්‍රවනතාවය පිළිබඳ ඇගයීමට මෙන්ම නායයෑම් අවදානම අවම කිරීමේ වැඩ කටයුතු සඳහා ද භාවිතා කරනු ලැබේ. ලංකාවේ දිස්ත්‍රික්ක තුල ඇති නායයෑමේ ප්‍රවනතාවයක් පවතින කලාප 3වන රූපසටහනෙන් දැක්වේ. මෙම සිතියම් ආධාරයෙන් NBRO ආයතනය නායයෑමේ ප්‍රවනතාවයක් සහිත දිස්ත්‍රික්ක තුල ඇති භූමි ප්‍රදේශයන්හී පවතින නායයෑමේ හැකියාව ඇස්තමේන්තුගත කර ඇත.

### 1.5.2. නායයෑමේ ප්‍රවනතාව ය සහිත දිස්ත්‍රික්ක තුල එක් එක් අවදානම් කලාපයට අයත් වන භූමි වපසරිය හා ප්‍රතිශතය

පහත දැක්වෙන වගුව මගින් විවිධ නායයෑම් ආපදා කලාප මට්ටම් තුලට අයත් වන භූමි ප්‍රමාණය පෙන්නුම් කරයි. මෙම දත්ත වලට අනුව, බදුල්ල, රත්නපුර, කෑගල්ල, නුවර, නුවරඑළිය, කළුතර සහ මාතලේ යන දිස්ත්‍රික්ක වල වැඩි භූමි ප්‍රමාණයක් නායයෑමේ මධ්‍යම හා අධි අවදානම් කලාප වලට අයත් වේ. කෙසේ නමුදු, සෑම දිස්ත්‍රික්කයකම නායයෑමේ අධි අවදානමක් සහිත (4 වන කලාපය) භූමි ප්‍රමාණය 10%ට වඩා අඩු වේ.

**වගුව 1: නායයෑමේ අවදානම පවතින ප්‍රදේශ (මුලාශ්‍රය: NBRO)**

| | පරාසය | 1(නායයෑම් සිදු වීමට ප්‍රවනතාවයක් නොමැති) | | 2(මධ්‍යම වශයෙන් නායයෑමේ ප්‍රවනතාවයක් පවතී | | 3 (නායයෑම් අපේක්ෂා කල හැකියි) | | 4 (නායයෑමේ වැඩි ප්‍රවනතාවයක් පවතී) | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දිස්ත්‍රික්කය | වපසරිය (වර්ග කි.මී.) | % | වපසරිය (වර්ග කි.මී.) | % | වපසරිය (වර්ග කි.මී.) | % | වපසරිය (වර්ග කි.මී.) | % |
| 1 | බදුල්ල | 677.00 | 29.00 | 1063.00 | 47.00 | 441.00 | 19.00 | 77.00 | 3.00 |
| 2 | රත්නපුර | 1812.00 | 55.00 | 799.00 | 24.00 | 568.00 | 17.00 | 91.00 | 2.00 |
| 3 | කෑගල්ල | 469.00 | 27.00 | 604.00 | 35.00 | 460.00 | 27.00 | 157.00 | 9.00 |
| 4 | නුවර | 552.00 | 29.00 | 825.00 | 43.00 | 315.00 | 16.00 | 182.00 | 9.00 |
| 5 | නුවරඑළිය | 473.00 | 27.00 | 849.00 | 50.00 | 268.00 | 15.00 | 103.00 | 6.00 |
| 6 | මාතර | 992.00 | 75.00 | 232.00 | 17.00 | 81.00 | 6.00 | 4.00 | 0.36 |
| 7 | හම්බන්තොට | 2568.00 | 97.00 | 42.00 | 1.00 | 11.00 | 0.42 | 0.57 | 0.02 |
| 8 | කළුතර | 737.00 | 44.00 | 755.00 | 45.00 | 153.00 | 9.00 | 9.00 | 0.54 |
| 9 | මාතලේ | 791.00 | 41.00 | 883.00 | 46.00 | 199.00 | 10.00 | 23.00 | 1.00 |
| 10 | ගාල්ල | 1306.00 | 80.81 | 210.00 | 13.00 | 95.00 | 5.87 | 5.00 | 0.32 |
| 11 | කුරුණෑගල | 4453.00 | 90.35 | 388.00 | 7.86 | 83.00 | 1.62 | 8.00 | 0.17 |
| 12 | මොණරාගල | 3836.00 | 66.25 | 1705.00 | 29.50 | 234.00 | 4.00 | 14.00 | 0.25 |
| 13 | ගම්පහ | 1359.00 | 95.77 | 41.00 | 2.90 | 17.00 | 1.26 | 1.00 | 0.07 |

### 1.5.3 නායයෑමේ ප්‍රවනතාවයක්ප්‍රවනතාවයක් පවතින ප්‍රදේශ වල ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා නිකුත් කෙරෙන නායයෑම් යෝග්‍යතා සහතික

2010 වර්ෂයේදී නිකුත් කළ චක්‍රලේඛයක් මඟින් නුවර, මාතලේ, නුවරඑළිය, බදුල්ල, කෑගල්ල, රත්නපුර, කළුතර, ගාල්ල, මාතර සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක නායයෑමේ ප්‍රවනතාවයක් සහිත ප්‍රදේශ ලෙස නම් කරන ලදී. මෙම දිස්ත්‍රික්ක 10 තුල සිදු කරනු ලබන සියලු ඉදි කිරීම් කටයුතු සඳහා යෝග්‍යතා සහතිකනිකුත් කිරීමේ බලය NBRO වෙත ලබා දෙන ලදී. මෙම චක්‍රලේඛයට අනුව ඉහත සඳහන් කළ දිස්ත්‍රික්ක 10 තුල සිදු කරනු ලබන සියලුම ඉදි කිරීම් කටයුතු සඳහා NBRO මඟින් නායයෑම් යෝග්‍යතා සහතිකයක් ලබා ගත යුතු වේ (මුහුදු බඩ ප්‍රදේශ සඳහා මෙය අදාල නොවේ). නායයෑමේ ප්‍රවනතාවය ඇති ප්‍රදේශ වල සිදු කරන ඉදිකිරීම් කටයුතු සඳහා මෙම සහතිකය ලබා ගැනීමේ අරමුණ වන්නේ එමඟින් නායයෑම් ආපදා අවදානම අවම කර ගැනීම හා ඉදිරියේදී ඇතිවිය හැකි බෑවුම් අස්ථාවරවීම් මඟින් ජීවිත හා දේපල වෙත සිදුවිය හැකි හානි අවම කර ගැනීමයි.

නායයෑමේ අවදානමක් පවතින ප්‍රදේශ වල සිදු කරන නව ඉදිකිරීම් සඳහා පමණක් ඉහත සඳහන් කළ යෝග්‍යතා සහතිකඅදාල වේ. මෙම ක්‍රියාවලිය සාපේක්ෂව විශාල අගයක් ගන්නා දැනටමත් සංවර්ධනය කර ඇති ඉඩම් සඳහා සහ ඉදිකර අවසන් කළ ගොඩනැගිලි සඳහා අදාල වන්නේ නැත. එමෙන්ම, බොහෝමයක් නව ඉදිකිරීම් (විශේෂයෙන්ම නිවාස) සඳහා මෙම යෝග්‍යතා සහතිකය ලබා නොගැනේ. නායයෑම් ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් කිරීම සඳහා අදාල බලධාරීන් (පළාත් පාලන ආයතන, නාගරික සංවර්ධන ආයතන) සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, අධ්‍යාපන වැඩසටහන්, පුහුණු කිරීමේ වැඩමුළු පැවැත්වුව ද, ප්‍රමාණවත් තරම් නායයෑම් ආපදා අවම වීමක් සිදුව ඇති බවක් නොපෙනේ.

මෙම ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීමේදීල පහත සඳහන් වන අයුරේ වෙනත් දුෂ්කරතාද තිබෙන බව පෙනී යන ලදී: i) කිසිදු අවසරයකින් තොරව සිදු කරනු ලබන සංවර්ධන ක්‍රියාකාරකම් ii) NBRO හි අනුමැතියෙන් තොරව සැලසුම් කමිටු විසින් ව්‍යාපෘති අනුමත කිරීම iii) සංවර්ධන ක්‍රියාවලි තුලදී NBRO මඟින් ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම iv) සමහරක් ස්ථාන ස්වභාවයෙන්ම සංකීර්ණ ස්වභාවයක් ගන්නා බැවින් ඒ ස්ථාන සඳහා යෝග්‍යතා සහතික නිකුත් කිරීමට සම්පත් අධිකව භාවිතා වන විශේෂඥ දැනුම අවශ්‍ය වීම v) තම නිර්දේශ ලබා දීම සඳහා විශේෂඥ පුද්ගලයන් හට කාල රාමුවක් ලබා දෙන බැවින් එම සීමිත කාල සීමාව

තුල ඔවුන්ගේ දැනුම හා හැකියාව උපරිමයෙන් ලබා දීමට නොහැකි විම vi) ඉදිකිරීම් සිදුකරන්නන්හට දැරිය නොහැකි තරම් ඉහල ගාස්තුවක් ක්‍රියාවලිය සඳහා වැය වීම යනාදිය. මෙම ක්‍රියාවලියට අදාලව ආයතනය තුල අවශ්‍ය දැනුමෙන් සපිරි සේවකයන් හා තාක්ෂණික දැනුම නොමැති වීමද තවත් වැදගත් කරුණකි. දැනට පවතින ව්‍යවස්ථාදායක ක්‍රියාවලියේ පවතින දුර්වලතා ආපදා අවදානම අවම කිරීමේ කාර්යය බලාපොරොත්තු වන මට්ටමට ලඟා කර ගැනීම සඳහා විශාල බාධාවක් වී තිබේ.

### 1.5.4 NBRO තුල නායයෑම් පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම

රජයේ හා UNDP හි ආධාර මත ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට නායයෑමේ අවදානමක් සහිත මාතලේ, නුවරඑළිය, කෑගල්ල, රත්නපුර, කළුතර, බදුල්ල යන දිස්ත්‍රික්ක තුල හා මාතර, ගාල්ල, හම්බන්තොට, මොණරාගල, කුරුණෑගල යන දිස්ත්‍රික්ක තුල සමහරක් අවදානම් ප්‍රදේශ වල ස්වයංක්‍රිය වර්ෂාමාන සවි කිරීමට අවස්ථාව ලැබුණි:. මෙම වර්ෂාමාන පද්ධතියෙන් සෑම විනාඩි 30කට වරක්ම NBRO ප්‍රධාන කාර්යාලය වෙත වර්ෂාපතන දත්ත ලබා දෙයි. මෙම 105ක් වන ස්වයංක්‍රිය වර්ෂාමාන වලින් ලබා දෙන තත්කාලීන දත්ත වර්ෂාපතන තිව්‍රතාව අදාල සිමා වලට පැමිණි විට නායයාම් පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීමට භාවිතා කරනු ලැබේ. අනතුරු ඇඟවීම් නිකුත් කරනු ලබන්නේ වර්ෂාපතනය මි.මී. 75, මි.මී. 100 හා මි.මී. 150 දක්වා ඉහළ පැමිණි පසුවයි. මෙම මධ්‍යස්ථානය පැය 24 මුළුල්ලේම විවෘතව පවතින අතර අවදානම් මට්ටම් 3 කදී අනතුරු ඇඟවීම් නිකුත් කෙරේ.

### 1.5.5. ව්‍යුහමයය අවම කිරීමේ ව්‍යාපෘති

### නායයෑම් අවම කිරීම සඳහා තාක්ෂණික සහයෝගීත්ව ව්‍යාපෘතිය (TCLMP)

2013 වර්ෂයේදී, ඒකාබද්ධ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (ILMP) යටතේ මූලික වශයෙන් තෝරා ගැනුණු නායයෑම් අවදානමට ලක්ව තිබූ ස්ථාන 16ක් අතුරින් නායයෑම් 4ක් JICA ආයතනය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2014 ඔක්තෝබර් මස 01 වන දින නායයෑම් අවම කිරීම සඳහා තාක්ෂණික සහයෝගීත්ව ව්‍යාපෘතිය(TCLMP) ආරම්භ විය. මෙම ව්‍යාපෘතිය යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩමාදුර ප්‍රදේශයේ පිහිටි නායක් ද, බදුල්ල දිස්ත්‍රික්කයේ බදුලුසිරිගම ප්‍රදේශයේ සිදු වූ නායක් හා මාතලේ දිස්ත්‍රික්කයේ අලගුමලේ ප්‍රදේශයේ වු ගල් පෙරලීමේ අවදානම් ස්ථානයක් නියමු වැඩබිම් ලෙස තෝරා ගන්නා ලදී. මෙහිදී සිදු කළ අවම කිරීමේ ක්‍රියාවලි සඳහා ජපානයේ හා අනෙක් සංවර්ධිත රටවල භාවිතා කරනු ලබන දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කරන ලදී. මෙම ස්ථාන 3 අතරින් උඩමාදුර හා අලගුමලේ යන ස්ථාන දෙක සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව 2017 මාර්තු මාස නැවත භාර දුන් අතර බදුලුසිරිගම නායයෑම් ස්ථානයේ පසු අධීක්ෂණ කටයුතු තවදුරටත් සිදු වෙමින් පවතී.

### දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (CRIP)

### පාසැල් වල ඇති නායයෑම් අවම කිරීමේ වැඩසටහන

2013 වර්ෂයේදී ලෝක බැංකුව හා ශ්‍රී ලංකා රජය අතර ඇති කර ගත් එකගතාව අනුව ලෝක බැංකු ආධාර මත ආරම්භ කළ දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (CRIP) යටතේ නුවර දිස්ත්‍රික්කයේ නායයෑම් අවදානමට ලක්ව තිබු පාසැල් 18ක් මෙම ආපදා අවම කිරීමේ වැඩසටහන සඳහා තෝරා ගැනුණි. 2012 වර්ෂයේදී ඒකාබද්ධ නායයෑම් අවදානම් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ වගුගත කර තිබු නායයෑම් අවදානම සහිත පාසැල30ක් අතුරින් මෙම පාසැල් 18 තෝරා ගන්නා ලදී. අධික නායයෑමේ අවදානමක් පවතින නුවර දිස්ත්‍රික්කයේ මෙම පාසැල් 18 තුල සිදුකෙරෙන මෙම නායයෑම් අවදානම අවම කිරීමේ වැඩසටහන සඳහා පිරිවැය ඩොලර් මිලියන 7කි (මෙමඟින් ආසන්න වශයෙන් සිසුන් 30,000කට ප්‍රතිලාභ සැලසේ). වර්තමානය වන විට පාසැල් බොහොමයක ඉදිකිරීම් කටයුතු අවසන් වී ඇත.

**මාර්ග වල නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය**
නුවර-මහියංගනය මාර්ගය, හක්ගල හා ගිනිගත්හේන ප්‍රදේශ සහ වෙනත් එවන් මාර්ග කොටස් , ආශ්‍රිතව ද ඇති වී තිබෙන නායයෑම් අවදානම් අවම කිරීමේ කටයුතු රාශියක් වර්තමානය වන විට සිදු වෙමින් පවතී.

## 1.6 වර්තමාන නායයෑම් කළමනාකරණ උපායමාර්ග යටතේ නායයෑම් ආපදා අවදානම අවම වීම්

වර්තමානය වන විට, මෙම අස්ථාවර බෑවුම් ඇති ප්‍රදේශ NBRO හි නායයෑම් පූර්ව අනතුරු හැඟවීමේ පද්ධතිය මඟින් ආවරණය කරනු ලැබේ. මේ යටතේ නායයෑමේ අධි අවදානම් තත්වයක් ඇති වූ විට එම ස්ථාන වලින් ඉවත් වීමට මිනිසුන් දැනුවත් කිරීම සඳහා අදාල වන අනතුරු ඇඟවීමේ තොරතුරු ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට හා පළාත් පාලන ආයතන වලට ලබා දේ. කෙසේ වුව ද, මෙම පද්ධතිය තුලින් අවදානම පවතින ස්ථානය නිශ්චිතවම පැවසීමේදී යම් අවිනිශ්චිතභාවයන් හා අඩු නිවරද්‍යතාවක් පැවතීමේ අවදානම පවතී. එම නිසා අවදානමට ලක්ව ඇති මිනිසුන්ට ඉන් සැපයෙන ආරක්ෂාව අල්ප වන අතර එම ස්ථාන කෙරෙහි ඇති සමස්ත අවදානම ඉහළ මට්ටමක වේ. මේ නිසා, ස්ථානීය ව්‍යුහාත්මක අවම කිරීමේ ක්‍රමවේද සඳහා වැයවන පිරිවැය අධික වුවත් එය වඩා යෝග්‍ය බවට හඳුනා ගන්නා ලදී.

මෙම ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලද්දේ ජන ජීවිතය සඳහා අධි අවදානම් තත්වයක් පවතින ස්ථාන වන අතර, මෙම ව්‍යාපෘතිය නොමැති නම් එම ස්ථාන අධි අවදානම් ලෙස සැලකීම එකම විකල්පය වේ. එහෙයින් මෙවැනි ස්ථාන වල ඉදිරියේදී ඇති විය හැකි බෑවුම් අස්ථාවර වීම් මඟින් සිදුවන අලාභ සඳහා වැයවන පිරිවැය, ප්‍රතිකාර්මික කටයුතු සඳහා යන පිරිවැය, තාවකාලිකව සේවා හා ආර්ථිකමය කටයුතු ආදියට බාධා පැමිණීම මෙන්ම ජන ජීවිතයට ඇතිවන මානසික ආතතිය යන අංශ ඉතා ඉහළ අගයක් ගනු ඇත. **එබැවින් නායයෑමේ ප්‍රවනතාවක් ඇති දිස්ත්‍රික්ක තුල දැනට පවතින නායයෑමේ අවදානම අවම කිරීම සඳහා මහා පරිමාණයේ ආයෝජනයක් භාවිතා කිරීම අත්‍යවශ්‍ය කාරණයක් ලෙස සැලකෙන ලදී.**

## 1.7 AIIB මූල්‍ය ආධාර යටතේ සිදුකෙරෙන ශ්‍රී ලංකාවේ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය

නායයෑමේ අවදානම ඇති දිස්ත්‍රික්ක 11ක් තුල ඇති නායයෑමේ ප්‍රවනතාවක් ඇති ස්ථාන හා අස්ථාවර බෑවුම් 147ක ව්‍යුහාත්මක අවම කිරීමේ කටයුතු මෙම ව්‍යාපෘතියේ පළවන සංරචකයට ඇතුලත් වෙයි. මඟීන්ට, පදිකයන්ට, නිවැසියන්ට, මාර්ග, සේවා පහසුකම් යනාදියට වන ආපදා සඳහා ව්‍යුහාත්මක අවම කිරීමේ ක්‍රියා සඳහා වෙන්ව ඇති ප්‍රධානතම සංරචකය මෙයයි. අධිකවර්ෂාපතනයන් හේතුවෙන් ඉහල ගොස් ඇති නායයෑම් අවදානම ජන ජීවිතයට, ආර්ථිකයට මෙන්ම සංවර්ධන ක්‍රියාවලියට ද එල්ල කර ඇත්තේ ඉමහත් තර්ජනයකි. යෝජිත අවම කිරීමේ ක්‍රමවේද, සිවිල් ඉදි කිරීම් කටයුතු වලින් සමන්විත වන අතර නායයෑම් අවදානම හැකි තරම් ප්‍රයෝගික මට්ටමකට අවම කිරීම ඒවායෙහි අරමුණ වේ. මෙම ප්‍රදේශ වල ජීවත්වන්නන්ට හා දේපල වලට අවම හානියක් සිදු වන පරිදි හා බෑවුම් වල ස්ථායිතාව දීර්ඝ කාලීනව පවතින ආකාරයෙන් මෙම ඉංජිනේරු නිර්මාණ හා ඉදිකිරීම් කටයුතු සඳහා මනා ඉංජිනේරු තාක්ෂණයක් යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

මෙසේ නායයෑම් අවම කිරීම මඟින්, පොදු ගොඩනැගිලි, යටිතලපහසුකම්, සේවා , ප්‍රතිසංස්කරණය කිරීම සහ යළි ගොඩනැගීමේ කටයුතු උදෙසා ද, නැවත පදිංචි කිරීම් සඳහා ද ආපදා සහන සේවා හා හදිසි ක්‍රියාන්විත සේවා සඳහා වැය කරනු ලබන ජාතික ධනය

සෘජුවම අවම කරනු ඇත. එසේම මෙමඟින් ආපදා ප්‍රත්‍යස්ථ පරිසරයක් ගොඩ නගනු ලබන අතර එමඟින් එම ප්‍රදේශ වල වාසය කරන පුද්ගලයන්ගේ, මඟීන්ගේ හා පදිකයන්ගේ ආරක්ෂාව සහතික කිරීමෙන් ද, මාර්ග තදබදය අවම කිරීමෙන් ද විශේෂයෙන්ම කඳුකරයේ කෘෂිකාර්මික බෝග, මූල්‍ය බෝග, වතු වගා කිරීම් හා සංචාරක කර්මාන්තය වැඩි දියුණු වීම මගින් ආපදා අවම නිර්මිත පරිසරයක් ඒ හරහා නිර්මාණය වනු ඇත.

## 1.7 ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ ක්‍රමවේදය

නායයෑම් ආපදා කළමනාකරණයේ කේන්ද්‍රස්ථානය වන NBRO විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවයි. ව්‍යාපෘතියේ සමස්ත සම්බන්ධීකරණ කටයුතු සඳහා අදාල අමාත්‍යාංශය යටතේ වෙනම ව්‍යාපෘති කළමනාකරණ අංශයක් (ව්‍යාපෘති කළමනාකරණ ඒකකය) පිහිටුවනු ලබන අතර ඊට වෙනම ව්‍යාපෘති අධ්‍යක්ෂක වරයෙකු හා මූලික සේවක මණ්ඩලයක් පත් කෙරෙනු ඇත. පාරිසරික හා සමාජයීය කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරු යටතේ විශේෂ අංශයක් ස්ථාපිත කෙරේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් අදාල වගකිව යුතු ආයතන සමඟ අන්තර් සම්බන්ධතා පවත්වා ගනී. බෑවුම් ස්ථාවර කිරීම සම්බන්ධව විශේෂිත තාක්ෂණික දැනුම ඇති දක්ෂ ව්‍යුහාත්මක ඉංජිනේරු සැලසුම් කරන්නන් හා ආයතන විසින් ව්‍යුහාත්මක අවම කිරීමේ සැලසුම් හා සිවිල් වැඩ කටයුතු සිදු කෙරෙනු ඇත. ජාතික හා අන්තර්ජාතික ලන්සු තැබීමේ ක්‍රමවේදය මඟින් ඔවුන් ව්‍යාපෘතිය වෙත බඳවා ගැනේ.

# 2 වන පරිච්ඡේදය- ව්‍යාපෘති ප්‍රදේශයේ පොදු මූලික පාරිසරික හා සමාජීය තත්ව

## 2.1 සාමාන්‍ය පාරිසරික වටපිටාව

### 2.1.1. භූ ලක්ෂණ හා ප්‍රදේශයේ භූ විෂමතාව

රට තුල පිහිටි නායයෑමේ ප්‍රවනතාවයක් සහිත සෑම දිස්ත්‍රික්කයක්ම සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් කඳුකර ප්‍රදේශයට ඇතුලත් වෙයි. ලංකාවේ කඳුකර ප්‍රදේශය මූලික වශයෙන් තෙත් කලාපයට අයත් වන අතර එය උස් පහත් වෙමින් දසත විහිදී ගොස් ඇති විචිත්‍ර කඳු පන්ති වලින් සමන්විත වේ. යෝජිත AIIB ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ කඳුකර දිස්ත්‍රික්ක 11 ක ක්‍රියාත්මක වෙයි. ඒවා නම් බදුල්ල, නුවර, මාතලේ, කෑගල්ල, නුවරඑළිය, කළුතර,රත්නපුර යන දිස්ත්‍රික්ක ද, මාතර, හම්බන්තොට, කුරුණෑගල හා මොණරාගල යන දිස්ත්‍රික්ක වල කඳු ආශ්‍රිත ප්‍රදේශද වේ.

මධ්‍යම කඳුකරය ලෙස හඳුන්වන භූමිප්‍රදේශය මුහුදු මට්ටමේ සිට මීටර් 185 ක සිට උසම ස්ථානය වන මුහුදු මට්ටමේ සිට මීටර් 2717 ක උසකින් පිහිටි පිදුරුතලාගල දක්වා විහිදේ (රූපසටහන 4). මෙම භූමිය ශීඝ්‍ර, සාමාන්‍ය ප්‍රමාණයේ හා මද බෑවුම් වලින් සමන්විත වන අතර ශාඛික ජලවහන රටාවකින් යුතු ජලධාරා පද්ධතියක් ඒ ඔස්සේ නිර්මාණය වී ඇත. මෙම දිස්ත්‍රික්ක වල භූ විෂමතාව අධික ලෙස දැදුරු වී සහ නැමී ගිය මව් පාෂාණ මස්තකයේ පිහිටි විවිධ ඝනකමින් යුතු ස්ථානීය හා සුනුපහන් පාංශු ස්ථර වලින් යුක්ත වේ. මෙම ප්‍රදේශ වල නායයෑම් සඳහා රුකුල් වන ප්‍රධාන ස්වභාවික සාධක වන්නේ සීග්‍ර බෑවුම් හා භූ විද්‍යා ත්මකව දුර්වල ස්ථර වේ.




**රූපසටහන 2: ශ්‍රී ලංකාව තුල නායයෑම ප්‍රවනතාවය සහිත දිස්ත්‍රික්ක වල උන්නතාංශය දැක්වෙන සිතියම**

### 2.1.2. දේශගුණය

රටෙහි පවතින නායයෑමේ ප්‍රවනතාවයක් පෙන්වන දිස්ත්‍රික්ක බොහොමයක දේශගුණය, ලංකාවේ පහත් හා මධ්‍ය භූමි ප්‍රදේශ වල දක්නට ලැබෙන දීර්ඝ කාලීන මධ්‍ය වාර්ෂික උෂ්ණත්වය 27°C වන අතර මධ්‍යම කඳුකරය තුල පවතින දිස්ත්‍රික්ක වල (නුවරඑලිය: මුහුදු මට්ටමේ සිට උස මීටර් 1895) දක්නට ලැබෙන්නේ 15 °C පමණ උෂ්ණත්වයකි. වයඹ හා ගිනිකොනදිග ප්‍රදේශ වල මධ්‍ය වාර්ෂික වර්ෂාපතනය මිමී. 1000ක් පමණ වන අතර මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම් වල එය මිමී. 5000 ක් පමණ වෙයි. නායයෑමේ ප්‍රවනතාවයක් පවතින බොහොමයක් ප්‍රදේශ වැඩි වර්ෂාපතනයක් ලැබෙන දිවයිනේ බටහිර බෑවුම් වල පිහිටා ඇත. වර්ෂාපතනයේ අවකාශීය පැතිරීයාම හූ විෂමතාව මත ප්‍රභලව රඳා පවතින අතර සෘතුමය සුළං රෙජීම දෙකක් දැක ගැනීමට ලැබෙයි. නිරිතදිග මෝසම මැයි සිට සැප්තැම්බර් දක්වා වන අතර ඊසාන දිග මෝසම දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා වෙයි. මීට අමතරව මාර්තු සිට අප්‍රේල් දක්වා පළවන අන්තර් මෝසම ද ඔක්තෝම්බර් සිට නොවැම්බර් දක්වා දෙවන අන්තර් මෝසම ද ලෙස අන්තර් මෝසම් දෙකක්ද දක්නට ලැබේ. නිරිත දිග මෝසම අවදානම් සහිත වන අතර මෑත අතීතයේදී මෙම කාලයේ කළුතර, කෑගල්ල, රත්නපුර, ගාල්ල හා මාතර යන දිස්ත්‍රික්ක තුල බොහෝ නායයෑම් සිදු වී ඇත. ශ්‍රී ලංකාවේ කාලගුණික වෙනස්වීමේ විශ්ලේෂණ වලට අනුව බටහිර බෑවුමේ පිහිටා ඇති දිස්ත්‍රික්ක සඳහා නිරිතදිග මෝසම් කාලයේදී වැඩි වර්ෂාපතනයක් ලැබෙන බව පෙන්නුම් කරයි. එම නිසා නායයෑමේ හා ගංවතුර ඇතිවීමේ ප්‍රවනතාව වැඩි වෙමින් පවතින බවක් අපේක්ෂා කළ හැක.

### 2.1.3. නායයෑමේ ප්‍රවනතාවයක් පවතින ප්‍රදේශ වල භූමි පරිභෝජන රටාව

මෙම දිස්ත්‍රික්ක වල ප්‍රධාන භූමි පරිභෝජන රටා වන්නේ තේ, රබර්, ගෙවතු වගා සහ කුළුබඩු බෝග වගායි. නුවරඑළිය, බදුල්ල හා රත්නපුර දිස්ත්‍රික්ක වල ප්‍රධාන බෝග වගාව වන්නේ තේ වගාවයි. උඩරට ප්‍රදේශයේ (නුවර, නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්ක වල) සිදු කරන කෘෂිකර්මාන්තය ප්‍රධාන වශයෙන් කුඹුරු හා වාණිජ එළවලු වගාවලින් සමන්විත වෙයි. මෙම බොහොමයක් දිස්ත්‍රික්ක ඉහල ජල පෝෂක ප්‍රදේශ බැවින් එම දිස්ත්‍රික්ක වල සැලකිය යුතු භූමි ප්‍රමාණයක් තවමත් ස්වභාවික වනන්තර වලින් හා වනාන්තර වැනි වගා වලින් ආවරණය වී පවතී. තැනිතලා හෝ මද බෑවුම් සහිත භූමිභාග (මූලික වශයෙන් ගම්බද) ජනාවාස ද, නගර සහ ගම්මාන බවට ද වර්ධනය වී ඇත. සමහරක් දිස්ත්‍රික්ක වල පවතින ගෙවතු වගා (වෙළඳ භෝග) අවම වශයෙන් වියන් තුනකින් වත් සමන්විත වන වනාන්තර වන් ශාඛ ගහණයක් දැක ගත හැකි වේ (උදා: කෑගල්ල, නුවර, මාතලේ දිස්ත්‍රික්ක ). මෙම සියළුම දිස්ත්‍රික්ක වල පවතින පොදු පාරසරික ගැටළු ලෙස, සිතුමතේ සිදු කරනු ලබන ඉදි කිරීම, වනාන්තර එළි පෙහෙළි කිරීම, භූමි හායනහ, පාංශු ඛාදනය, මිනිසුන් විසින් අපද්‍රව්‍ය (ඝන හා දියර අපද්‍රව්‍ය) බැහැර කිරීම හේතුවෙන් සිදු වන ජල දූෂණය(සහ කෘෂි රසායන හේතුවෙන් සිදු වන දුෂණ යනාදිය සඳහන් කළ හැක.

### 2.1.4. ස්වභාවික වෘක්ෂලතා හා වනාන්තර ආවරණය

මාතලේ, නුවර එළිය, රත්නපුර, බදුල්ල, මොණරාගල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක වල තවදුරටත් සැලකිය යුතු මට්ටමේ වනාන්තර ප්‍රමාණයක් ඉතිරිව පවතී. තවද, මෙම වනාන්තර රටෙහි දැනට ඉතිරිව ඇති වන ඝනත්වයෙන් ඉතිරිය කෙරෙහිද විශාල දායකත්වයක් ලබා දේ (රූපසටහන5).




**රූපසටහන ශ්‍රී ලංකාවේ නායයෑමේ ප්‍රවනතාවයක් තිබෙන දිස්ත්‍රික්ක තුල වනාන්තර ආවරණය විහිදී ඇති ආකාරය (මුලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව-2016)**

### 2.1.5. පාරිසරිකව සංවේදී ප්‍රදේශ

කඳුකර ප්‍රදේශ , විශේෂයන්ම නුවරඑළිය, නුවර, කෑගල්ල, මාතලේ, බදුල්ල සහ රත්නපුර යන දිස්ත්‍රික්ක හේතු රාශියක් නිසා පාරිසරිකව සංවේදී කලාප ලෙස හඳුනාගෙන ඇත. මෙම දිස්ත්‍රික්ක වල පිහිටා ඇති වනාන්තර සහිත කඳු පද්ධති වලින් රටෙහි පවතින අරීයව විහිදෙන ගංගා ජාලය නිරන්තරයෙන් පෝෂණය වෙයි. බහු වාර්ෂික ගංගා වන මහවැලි, කැළණි, කළු, දැදුරු ඔය, මා ඔය, ගිං ගඟ සහ නිල්වලා යන ගංගා වල ඉහල ජල පෝෂක ප්‍රදේශ මෙම දිස්ත්‍රික්ක වල කඳුකර ප්‍රදේශ වල පිහිටා ඇත. මෙම ජල පෝෂක ප්‍රදේශ වල තිබෙන පහත් වැසි වනාන්තර, වනාන්තර වැනි ගෙවතු වගා, උප කඳුකර සහ කඳුකර වනාන්තර පරිසර පද්ධති වල IUCN රතු ලැයිස්තුවේ සඳහන් ජීවින් හා ආවේණික තුරුලතා දැක ගැනීමට ලැබේ. කෙසේවුව ද, මෙම ජල පෝෂක ප්‍රදේශ වල පිහිටා ඇති ස්වභාවික පරිසර පද්ධති, දැව සඳහා කැලෑ එළි කිරීම, වගා කටයුතු සඳහා කැලෑ එළි කිරීම වැනි හේතු නිසා විනාශ වෙමින් පවතී. භූමි හායනය නිසා සිදුවන පාංශු ඛාදනය මෙම දිස්ත්‍රික්ක තුල පවතින සියලුම ජල පෝෂක ප්‍රදේශ වලට පොදු ගැටළුවක් වී ඇත.




**රූපසටහන 6: ශ්‍රී ලංකාවේ නායයෑමේ හැකියාවක් පවතින දිස්ත්‍රික්ක තුල වනාන්තර ආවරණය**

රූපසටහන 6 මඟින් 2010 වසර වන විට ශ්‍රී ලංකාවේ වන ගහනය පෙන්නුම් කරයි (මූලාශ්‍රය: ශ්‍රී ලංකා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව). ජාතික වනජීවී උරුම ප්‍රදේශ , සංරක්ෂිත වනාන්තර, රක්ෂිත සහ වනජීවී මායිම් මීට ඇතුලත් වේ. මේ අතරින් සිංහරාජ වනාන්තර රක්ෂිතය (වර්ගප්‍රමාණය හෙක්ටයාර 12,163.4(නොයිඳුල් වනාන්තර)), සමනළ අඩවි රක්ෂිතය (වර්ගප්‍රමාණය හෙක්ටයාර 21,360.3) සහ හෝර්ටන් තැන්න යනු සුවිශේෂී පාරිසරික තත්ව සහිත වැදගත් ස්වභාවික රක්ෂිත ලෙස නම් කළ හැකිය. ඒවා ප්‍රධාන වශයෙන් රත්නපුර හා නුවරඑළිය දිස්ත්‍රික්ක වල පිහිටා ඇත.

## 2.2. සමාජ ආර්ථිකමය සැකැස්ම

### 2.2.1. ජනවිකාස ලක්ෂණ

2012 ශ්‍රී ලංකාවේ සංඛ්‍යාලේඛන අනුව නායයෑමේ ප්‍රවනතාවයක් පවතින දිස්ත්‍රික්ක අතුරින් වැඩිම ජනගහනයක් සිටින්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන අතර එය මිලියන 1.6ක් වේ. නුවර, කළුතර, ගාල්ල හා රත්නපුර වැනි අනෙක් දිස්ත්‍රික්ක වල සිටින ජනගහනය මිලියන 1 ඉක්මවයි (රූපසටහන 7). සෑම දිස්ත්‍රික්කයකම කාන්තා ජනගහනය පිරිමි ජනගහනයට සමාන හෝ ස්වල්ප වශයෙන් වැඩි අගයක් ගනී. නායයෑමේ ප්‍රවනතාවයක් පවතින දිස්ත්‍රික්ක වල සිංහල, ශ්‍රී ලාංකික දමිළ, ඉන්දියානු දමිළ සහ ශ්‍රී ලංකික මුස්ලිම් යන ජන වර්ග ඇතුලත් වේ. නුවර එළිය හැර අනෙකුත් සියළුම නායයෑමේ ප්‍රවනතාවයක් පවතින ප්‍රදේශ වල 70% කට වඩා ජිවත් වන්නේ සිංහල ජනතාවයි. මෙම දිස්ත්‍රික්ක වල ජිවත් වන දෙවෙනුවට වැඩි ජනගහනය වන්නේ ඉන්දියානු දමිළ ජනතාවයියි. කලාපිය වතු අංශය මඟින් ලබා දුන් නිවාස වල මොවුන් බොහෝ විට ජිවත් වෙයි.



රූපසටහන 7: ශ්‍රී ලංකාවේ නායයෑමේ ප්‍රවනතාවයක් පවතින ප්‍රදේශ වල ජනගහනය හා ස්ත්‍රී පුරුෂ භාවය විහිදී ඇති ආකාරය (මූලාශ්‍රය

**රූපසටහන 7: ශ්‍රී ලංකාවේ නායයෑමේ හැකියාවක් පවතින ප්‍රදේශ වල ජනගහනය හා ස්ත්‍රී පුරුෂ භාවය විහිදී ඇති ආකාරය (මූලාශ්‍රය ශ්‍රී ලංකාවේ සංඛ්‍යාලේඛන 2012)**




**රූපසටහන 8: ශ්‍රී ලංකාවේ නායයෑමේ හැකියාවක් පවතින ප්‍රදේශ තුල විහිදී ඇති ජිවීන්ගේ ප්‍රතිශතය (මූලාශ්‍ර සංඛ්‍යාලේඛන, 2012)**

## 2.2.2. අංශ පාදක කරගත් ජනගනන ව්‍යාප්තියට අනුව ජන ඝනත්වය

නායයෑමේ ප්‍රවනතාවයක් ඇති දිස්ත්‍රික්ක අතුරින් වැඩිම ජන ඝනත්වයක් පවතින්නේ නුවර, කළුතර, ගාල්ල හා මාතර යන දිස්ත්‍රික්ක වලයි. අනෙක් දිස්ත්‍රික්ක වල ජන ඝනත්වය සාපේක්ෂව අඩු අතර එයට හේතු ලෙස තේ හා රබර් වගාව සඳහා භූමිය යොදා ගැනීම ද, මාර්ග, ජලය වැනි යටිතල පහසුකම් එතරම් සංවර්ධනය වී නොමැති වීම, අධ්‍යාපනය,

සෞඛ්‍ය වැනි සේවා වෙත ඇති ප්‍රවේශය අඩු වීම, අදායම් ඉපැයීමේ අවස්ථා අඩු වීම දැක්විය හැක. එමෙන්ම කඳුකර භූමි ප්‍රදේශ වීමත්, වාසයට නුසුදුසු බෑවුම් ප්‍රදේශ සහ නායයෑම් වැනි




මාරාන්තික ආපදා වලට නිරාවරිත ප්‍රදේශ වීමත් එසේඅඩු ජනගහනයක් සිටීමට සැලකිය යුතු තරමකට හේතු වී ඇත. නුවර එළිය හැර අනෙක් සෑම දිස්ත්‍රික්කයකම ජනගහනයෙන් 70% කට අධික ප්‍රමාණයක් ග්‍රාමීය ජනතාව වෙයි. නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්ක වල වතු අංශවල ජනගහනය මුළු ජනගහනයෙන්පිළිවෙලින් 53% ක් හා 19%ක් වෙයි. (රූපසටහන 9)

අඩු අදායම් තත්වය, අඩු ජනගහනය, දුප්පත්කම, අවම සංවර්ධන කටයුතු හා යටිතලපහසුකම් තත්ව යන කරුණු මෙම දිස්ත්‍රික්ක සඳහා විශේෂිත ලක්ෂණ වුවද ඒවායේ සාක්ෂරතා අනුපාතයය, ඉහලම සාක්ෂරතාවයක් පෙන්නුම් කරන දිස්ත්‍රික්ක වලටම බොහෝ වශයෙන්සමාන වේ. එමෙන්ම සංඛ්‍යාලේඛන වලට අනුව ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම සමාන සාක්ෂරතාවයකින් යුතු වේ. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ රජය මඟින් 1වන ශ්‍රේණියේ සිට විශ්ව විද්‍යා ලය දක්වා නිදහස් අධ්‍යාපනය ලබා දීමයි. රටෙහි සිටින සියලුම සිසුන් උදෙසාරජය 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයක් පවත්වයි. මෙම විභාගයෙන් සමත් වන සිසුන්ට රටෙහි ඇති උසස්ම පාසැල් වල අධ්‍යාපනය හැදෑරීමේ අවස්ථාව හිමි වේ. මේ හේතුව නිසා බොහෝ දුප්පත් ග්‍රාමීය ජනතාව තම දරුවන් පාසැල් යැවීමට ද ඔවුනට යහපත් අධ්‍යාපනයක් ලබා දීමට ද උත්සාහ කරයි.

**රූපසටහන 9: ශ්‍රී ලංකාවේ නායයෑමේ ප්‍රවනතාවයක් පවතින ප්‍රදේශ වල ජන ඝනත්වය සහ ග්‍රාමීය, නාගරික, වතු අංශ වලට අයත් ජනගහනය (මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව)**




**රූපසටහන 10: ශ්‍රී ලංකාවේ නායයෑමේ ප්‍රවනතාවක් ඇති දිස්ත්‍රික්ක වල සාක්ෂරතා *අනුපාතය* (මූලාශ්‍රය; ශ්‍රී ලංකා මහ බැංකුව)**

### 2.2.3 සංවර්ධන හා යටිතලපහසුකම් සැකැස්ම

මධ්‍යම පන්තියේ මිනිස් ප්‍රජාවක් වාසය කරන මෙම ප්‍රදේශ වල සංවර්ධනය ගම්බද සිට අර්ධ නාගරීක දක්වා වෙනස් වේ. භූවිෂමතාව සහ බෑවුම් සහිත භූවිෂමතා හේතුවෙන් මෙම ප්‍රදේශ වල පොකුරු ආකාරයේ සංවර්ධන ව්‍යාප්තියක් දක්නට ලැබේ. කෙසේ වුවද මාර්ග දෙපස තීරු ආකාරයේ සංවර්ධනයක් සියළුම දිස්ත්‍රික්ක වල පොදු ලක්ෂණයක් ලෙස දැකගත හැක. දෙමව්පියන් සතු ඉඩකඩම් විවාහපත්‍රදරුවන් අතර බෙදා දීම හරහා ඉඩම් අනුබෙදුමසාමාන්‍ය සිරිත වී ඇත . ඒක පුද්ගල ඉඩම් ප්‍රමාණය අඩු වීම, ශාක ආවරණය ඉවත් වීම, බෑවුම් නවීකරණය වීම නිසා පාංශු ඛාදනය වැඩි වීම, භූමි හායනය, බෑවුම් අස්ථාවර වීම මෙහි ප්‍රතිඵලයි. එමෙන්ම මෙම ජනාවාස වල සිටින බොහෝ දෙනෙකු ඥාතීන් වන අතර පොකුරු ගම් සැලැස්මකට අනුව ජීවත් වෙයි.

මාර්ග පද්ධතිය හා ප්‍රවේශ මාර්ග බොහෝ වශයෙන් සමෝච්ච රේඛා වලට ඔස්සේ සකස් වී තිබේ. ගම්මාන තුලින් දිවෙන මංමාවත් යාබද ගම් ද කුඩා නගර ද එකට සම්බන්ධ කරන අතරම ග්‍රාමීය-ප්‍රාදේශීය වානිජමය හා පොදු පහසුකම් හා පරිපාලන සේවා වලට ප්‍රවේශය සපයා දෙයි. රටෙහි ප්‍රධාන අපනයන බෝගයක් වන තේ, තේ වතු වලින් හා නිෂ්පාදනාගාර වලින් ප්‍රවාහනය කිරීම සඳහා මේ මාර්ග පද්ධතිය විශාල ලෙස සහය වේ.

### 2.2.4 නිවාස සංවර්ධන හා යටිතල පහසුකම් සේවා

නායයෑමේ ප්‍රවනතාවයක් පවතින දිස්ත්‍රික්ක තුල නිවාස ව්‍යාප්තිය 11 වන රූපසටහන




**රූපසටහන 11: ශ්‍රී ලංකාවේ නායයෑමේ ප්‍රවනතාවයක් පවතින දිස්ත්‍රික්ක තුල නිවාස වෘ (2012 සංඛ්‍යාලේඛන)**

දේශීය වශයෙන් ගත් කල, නිවාස වල අවකාශීය ව්‍යාප්තිය තනි නිවෙස් වලින් සෑදුනු පොකුරු (ගම්බද ප්‍රදේශ වල) හෝ තීරු ආකාරයේ සංවර්ධනයන් වේ. නාගරික ප්‍රදේශ වල පොදු ලක්ෂණය වන්නේ වඩා විශාල නිවාස පොකුරුය . බොහෝ විට නිවාස මාර්ග දෙපස පිහිටා තිබෙන අතර අනෙක් අවස්ථා වලදී මෙම නිවාස වලට පිවිසීමට පුද්ගලික හෝ පොදු පිවිසුම් මාර්ග පවතී. ප්‍රජාවෙන් බොහොමයකට පුද්ගලික සනීපාරක්ෂක සේවා (සමහර අවස්ථාවලදී පොදු සේවාද පවතී. උදා: වතු නිවාස) සහ ජලවිදුලි පහසුකම් පවතී. කඳුකර ප්‍රදේශයන්හී නගර වෙත පමණක් ජාතික ජල සම්පාදන අධිකාරිය මඟින් ජලය සපයනු ලැබේ. ජනගහනයෙන් බහුතරය පොදු ජල සැපයුම් මඟින් හෝ උල්පත්, ගංගා සහ ළිං ආදී පුද්ගලික ජල සැපයුම් මඟින් යැපේ.

### 2.2.5 අදායම/ වියදම හා දුප්පත්කම

අදායම් මාර්ග තනි පුද්ගලයන්ගේ හෝ ප්‍රජා වල සමාජයීය- ආර්ථික ලක්ෂණ මත බොහෝ වශයෙන් වෙනස් වන අතර එය ගොවිතැන, වතු ශ්‍රම බලකාය, අවිධිමත් අංශය, යැපුම් ගොවිතැන හෝ වාණිජ කෘෂිකාර්මික ගොවිතැන, පුහුණු හෝ නොපුහුණු ශ්‍රමයආදී ලෙස විවිධ වේ. පුද්ගලික අදායමින් සැලකිය යුතු කොටසක් ගෙවතු වගා මඟින් ලැබෙන අතර වාණිජ බෝග (කුළුබඩු) සහ තේ (කුඩා තේ වතු හිමියන්) නිවාස මට්ටමින් වගා කරනු ලබයි. සැලකිය යුතු මට්ටමේ ශ්‍රම බලකායක් ප්‍රාදේශීය, දිස්ත්‍රික්ක සහ පළාත් පරිපාලන අංශ නියෝජනය කරයි. නුවර හා නුවර එළිය දිස්ත්‍රික්ක වල සංචාරක කර්මාන්තය හා ඒ ආශ්‍රිත රැකියා ද ජීවනෝපයක් ලෙස භාවිතා වේ. මැණික් ගැරීමේ කර්මාන්තය හා ඒ ආශ්‍රිත වෙනත් කර්මාන්ත රත්නපුර නගරයේ ප්‍රධාන අදායම් මාර්ගයක් වේ. 2016 සංඛ්‍යාලේඛන වලට අනුව නායයෑමේ ප්‍රවනතාවක් ඇති දිස්ත්‍රික්ක වල මධ්‍ය මාසික වියදම රුපියල් 35,000 සිට 60,000 දක්වා පමණ වේ. මධ්‍ය ගෘහස්ථ අදායම රුපියල් 20,000-30,000 පරාසයක වේ. ආදායම හා වියදම අතර වෙනසට හේතු වී ඇත්තේ ප්‍රජා විසින් තොරතුරු ලබා දුන් ආකාරයයි (රූපසටහන 12).




**රූපසටහන 12: ශ්‍රී ලංකාවේ නායයෑමේ ප්‍රවනතාවක් පවතින දිස්ත්‍රික්ක වල මාසික මධ්‍ය අදායම් හා වියදම් තත්වය: 2016**

මෙම දිස්ත්‍රික්ක වල බොහෝ ගම්බද ප්‍රජා තුල දුප්පත්කම පොදු ලක්ෂණයක් ව ඇත . නායයෑමේ ප්‍රවනතාවක් පවතින දිස්ත්‍රික්ක අතුරින් නුවර, කෑගල්ල, බදුල්ල, රත්නපුර සහ මොණරාගල යන දිස්ත්‍රික්ක වල දුප්පත් ජනතාව වැඩි ප්‍රතිශතයක් පෙන්නුම් කෙරේ.




**රූපසටහන 13:නායයෑමේ ප්‍රවනතාවක් පවතින දිස්ත්‍රික්ක වල දරිද්‍රතා දර්ශකය සහ දිළිඳු පවුල් ඒකක ගණන .2016**

## 2.2.6 සේවා පහසුකම් සහ සේවා වෙත ප්‍රවේශය

මේ සඳහා දේශීය මාර්ග පද්ධතිය, දුම්රිය මාර්ග, ප්‍රවාහන පද්ධති, විදුලිය, පුද්ගලික/කණ්ඩායම් හෝ ප්‍රජා ජල සැපයුම්, විදුලි සංදේශ රැහැන්, පාසැල්, සෞඛ්‍ය සේවා, බැංකු, වෙළෙඳසැල් සහ වෙනත් වාණිජ සේවා සහ පරිපාලන සේවා අයත් වේ.

ග්‍රාම නිලධාරී කොට්ඨාශ තුල, ජනතාවගේ මූලික ජීවන අවශ්‍යතා සපුරාලීම සඳහාසෞඛ්‍ය සේවා, පාසැල්, බැංකු හා ප්‍රාදේශීය වාණිජ සේවා, වන්දනාමාන කටයුතු සඳහා අවශ්‍ය ස්ථාන (ජන වර්ගය අනුව බෞද්ධ පන්සල්, හින්දු කෝවිල්, මුස්ලිම් පල්ලි හා ක්‍රිස්තියානි පල්ලි) සහ සුසාන භූමි යන පොදු පහසුකම් සපයා දී ඇත. පැය කිහිපයකදී ලඟා විය හැකි දුරකින් පිහිටා ඇති ප්‍රාදේශීය මට්ටමින් හෝ වෙනත් දිස්ත්‍රික්ක වලින් (නාගරික මධ්‍යස්ථාන පිහිටා ඇති) මෙම ප්‍රජා වෙත වඩා යහපත් සේවා ලබා ගැනීමට හැකියාව තිබේ.

කඳුකර ප්‍රදේශයේ තිබෙන සියළුම ගම්වල ජීවත් වන ප්‍රජාවන් සාපේක්ෂව හොඳ මාර්ග පද්ධතියකින් ද යම් අවස්ථා වලදී දුම්රිය මඟින් ද එකිනෙකට සම්බන්ධ වේ. සැලකිය යුතු මට්ටමේ නිවාස ප්‍රමාණයක යතුරුපැදි හෝ ත්‍රී වීලර් වැනි පුද්ගලික ප්‍රවාහන පහසුකම් පවතී. ගම්බද ප්‍රදේශ වල සිට නගර මධ්‍යයන් වෙත යෑමට හා ඒමට, කාර්යාල හා පාසැල් වේලා වලදී පොදු බස් රථ ධාවනය වෙයි. මේ නිසා ජනයා හට තම අවශ්‍යතාවට සහ දැරිය හැකි මුදලට සරිලන පරිදි මිනිත්තු කිහිපයක සිට පැය කිහිපයක් දක්වා කාලයක් අතරතුර විවිධ මට්ටමේ සේවාවන් වෙත ලඟා විය හැක.

### 2.2.7 ස්වභාවික ආපදා

නිරිතදිග මෝසම සහ අන්තර් මෝසම් කාලවල ඇතිවන අධික වර්ෂාව හේතුවෙන් ප්‍රේරණය වන නායයෑම් මෙම දිස්ත්‍රික්ක වල පවතින වඩාත්ම විනාශකාරී ආපදාව වෙයි. කෙසේ වෙතත් කළුතර, රත්නපුර, ගාල්ල හා මාතර යන දිස්ත්‍රික්ක වල ගංවතුර ඇති වීමද ජීවිත තර්ජන ඇති කරන ආපදාවක් බවට පත් වී තිබේ. අන්ත්‍ය කාලගුණික තත්වයන්හීදී මෙම දිස්ත්‍රික්ක වෙත ගංවතුර හා නායයෑම් දෙකටම එකවර මුහුණ දීමට සිදුවන්නේබරපතල ආපදා තත්වයක් ඇතිකරවමිනි. කාලගුණය හේතුවෙන් මෙම දිස්ත්‍රික්ක වල ඇතිවන වෙනත් ආපදා ලෙස අධික සුළං තත්වයන් හා අකුණු ගැසීම් දැක්විය හැකිය. බොහෝ නායයෑමේ ප්‍රවනතාවක් පවතින ප්‍රදේශ විසින් මුහුණ දෙනඅවදානම් තත්වය වන්නේ නායයෑම් හා ගංවතුර දෙකම එකවර ඇතිවීම නිසා අධික ව්‍යසනයක් සිදු වීමත් ඒ සමඟම ප්‍රවේශ මාර්ග සියල්ල වැසී යාමත් ය. මේ හේතුවෙන් ජනතාවට මේ ප්‍රදේශ වලින් ඉවත් වීමේදී ද පීඩාවට පත් වූ ජනතාවට සහන සැලසීමේ කණ්ඩායම් වලට පැමිණීමේදී ද නොයෙකුත් බාධා ඇති වේ. රත්නපුර හා කළුතර යන දිස්ත්‍රික්ක වලට මෙය වඩා දැඩි අයුරින් බලපායි.

### 2.2.8 පරිපාලන ව්‍යුහය




රූපසටහන 14: ශ්‍රී ලංකාවේ නායයෑමේ ප්‍රවනතාවක් ඇති දිස්ත්‍රික්ක වල පරිපාලන( දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය) මායිම්

කුඩාම අවකාශීය ඒකකය වන්නේ ගමයි. ගම්මාන කිහිපයක් එකතු වීමෙන් කුඩාම පරිපාලන ඒකකය වන ග්‍රාම නිලධාරී (GN) කොට්ඨාශයක් සෑදෙන අතර එය ග්‍රාම නිලධාරීවරයකු විසින් පාලනය වේ. සෑම නිවසකම සිටින පුද්ගලයෝ◌ෝ සියල්ලම පරිපාලනමය වශයෙන් ග්‍රාම නිලධාරී කොට්ඨාශයටසම්බන්ධ වේ. ග්‍රාම නිලධාරීවරයා ප්‍රාදේශීය ලේකම් වෙත වගඋත්තර සැපයිය යුතු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පොදු ජනයා හා සම්බන්ධ කිරීමේ මූලික කර්තව්‍ය සිදු වන්නේ ග්‍රාම නිලධාරීවරයා හරහායි. ග්‍රාම නිලධාරී හරහා ජනතාවට මූලික සේවා සඳහා ප්‍රවේශය ලැබෙන අතර ගම් මට්ටමින් තිබෙන සහන හා සංවර්ධන වැඩසටහන් මඟින් ඵල ප්‍රයෝජන ලබා ගැනීමට හැකි වේ. මෙම ග්‍රාම නිලධාරී කොට්ඨාශ එකතු වීමෙන් වඩා පුළුල් පරිපාලන ඒකකයක් වෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් නිර්මාණය වේ. ප්‍රාදේශීය ලේකම්වරු විෂයභාර අමාත්‍යංශ වල ප්‍රාදේශීය කාර්යාල සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි.

දිස්ත්‍රික්කයක් තුල ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ රාශියක් එකතු වී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් නිර්මාණය වේ. මධ්‍යම රජයට පසුව තිබෙන දෙවන මට්ටමේ පරිපාලන කොට්ඨාශය වන්නේ දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශයයි. මධ්‍යම රජය මඟින් පත් කරනු ලබන දිස්ත්‍රික් ලේකම්වරයෙක් මාර්ගයෙන් සෑම දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශයක්ම පාලනය වෙයි. දිස්ත්‍රික් ලේකම කාර්යාලයක ප්‍රධාන රාජකාරි වන්නේ මධ්‍යම රජය හා දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශ අතර සම්බන්ධීකරණය හා කාර්ය සන්නිවේදනයයි. මීට අමතරව දිස්ත්‍රික් මට්ටමේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඒවා අධීක්ෂණය කිරීම, පහල මට්ටමේ උප ඒකක වල ක්‍රියාකාරකම් වලදී ඔවුන්ට සහය දැක්වීම, අදායම් එකතු කිරීම සහ දිස්ත්‍රික්කය තුල ඡන්ද සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම දිස්ත්‍රික් ලේකම් වරයෙකුගේ රාජකාරි වේ.

# 3 වන පරිච්ඡේදය- පාරිසරික හා සමාජයීයනීති ව්‍යවස්ථා/ නියාමන රාමුව හා ආයතනික රාමුව

## 3.1 ජාතික මට්ටමේ රෙගුලාසි

### 3.1.1 ජාතික පරිසර පනත (The National Environment Act - NEA)

ලංකාවේ මූලික පාරිසරික නීති ව්‍යවස්ථාව වන්නේ අංක 47 දරණ ජාතික පරිසර පනතයි. මෙම පනත මඟින් සංවර්ධන ව්‍යාපෘති වලින් ස්වභාවික පරිසරය, ස්වභාවික සම්පත්ද මෙන්ම මිනිස් පරිසරය ද ආරක්ෂා කෙරේ. මෙය නීතිගත කරනු ලබන්නේ මධ්‍යම පරිසර

අධිකාරිය (CEA) මගිනි. අංක 47 වැනි ජාතික පරිසර පනත 1980 දී බලාත්මක වූ අතර, 1988 වසරේ දී සංශෝධිත අංක 56 දරණ ජාතික පරිසර පනත මඟින් පාරිසරික බලපෑම් තක්සේරු කිරීම හා කළමනාකරණය සඳහා ද කාලීනව හා ක්‍රමානුකූල ලෙස පාරිසරික යෝග්‍යතා ලබා ගන්නා ආකරය පිළිබඳව ද රෙගුලාසි පනවා තිබේ.

මුළු රටෙහිම පරිසර කළමනාකරණය පිළිබඳ ව්‍යවස්ථාදායක රාමුව ජාතික පරිසර පනතෙහි අඩංගු වන අතර එහි ස්වභාවික සම්පත්, ධීවර සම්පත්, වනජීවී සම්පත, වනාන්තර, පාංශු සංරක්ෂණ, පාරිසරික ගුණාත්මකභාවය, පාරිසරික ආරක්ෂණය පිළිබඳව මෙන්ම ව්‍යාපෘති අනුමත කිරීමේදී පිළිපැදිය යුතු හා ක්‍රියාවලි යනාදිය පිළිබඳව ද සඳහන් වේ. ජාතික පරිසර පනතෙහි 23Y කොටසේ සඳහන් වන පරිදි අමාත්‍යවරයා මඟින් පත් කරනු ලබන **ව්‍යාපෘති අනුමත** කිරීමේ ආයතනයක් හරහා සංවර්ධන ව්‍යාපෘති සඳහා පාරිසරික යෝග්‍යතා ක්‍රියාවලි ක්‍රියාවට නංවයි. අදාල ව්‍යාපෘතියට අනුව පාරිසරික යෝග්‍යතාලබා ගන්න අන්දම ජාතික පරිසර පනතෙහි "නියම කරන ලද ව්‍යාපෘති" පිළිබඳ සඳහන් වන 23CC හා 32 යන කොටස් වල අඩංගු වේ. අදාල ව්‍යාපෘතිය ඇගයීමෙන් අනතුරුව මධ්‍යම පරිසර අධිකාරිය මඟින් එම ව්‍යාපෘතිය "නියම කරන ලද"ව්‍යාපෘතියක්ද නැද්ද යන්න තීරණය කරයි. නියම කරන ලද ව්‍යාපෘති මඟින් පරිසරයට වන බලපෑම මත මධ්‍යම පරිසර අධිකාරිය විසින් එම ව්‍යාපෘතිය සඳහා පාරිසරික යෝග්‍යතාවය ලබා ගැනීමේදී ගත යුත්තේ පාරිසරික ගැටළු තක්සේරුකරණ වාර්තාවක්දපූර්ව පාරිසරික පරීක්ෂණ වාර්තාවක්ද යන්න හා මෙම පාරිසරික ගැටළු තක්සේරුකරණ වාර්තාව හෝ පූර්ව පාරිසරික පරීක්ෂණ වාර්තාව පරිපාලනය කිරීම සඳහා ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය වන්නේ කවුරුන්ද යන්න තීරණය කරනු ලබයි. නියම කරන ලද ව්‍යාපෘති සඳහා මධ්‍යම පරිසර අධිකාරිය මඟින් හෝ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය මඟින් පාරිසරික ගැටළු තක්සේරුණය සහ පූර්ව පාරිසරික පරීක්ෂණය සඳහා අවශ්‍ය වන කාර්ය නිර්දේශ නිකුත් කරනු ලබයි. 1993 ජූනි 24 වන දින නිකුත් කළ අංක 772/22 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි විෂය භාර ඇමතිවරයා විසින් ප්‍රකාශ කරන ලද නියම කරන ලද ව්‍යාපෘති (PP) සඳහා පමණක් පාරිසරික ගැටළු තක්සේරුකරණ ක්‍රියාවලිය බල පැවැත්වෙන බව ජාතික පරිසර පනතෙහි අංක 23 Z කොටසෙහි දැක්වෙයි. 1999 නොවැම්බර් මස 5 වෙනිදා නිකුත් කළ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් නියම කරන ලද ව්‍යාපෘති ලැයිස්තුව සංශෝධනය කරන ලදී.

1993 ජූනි 24 වනදා නිකුත් කළ අංක 772/22 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය හා එහි පසුකාලීන සංශෝධන මඟින් ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා වගකිව යුතු අනුමත කරන ආයතනය මඟින් පාරිසරික යෝග්‍යතාවය ලබා යුතු බව සඳහන් වේ. AIIBහි ආයෝජන වැඩසටහන් විෂය පථයට අනුව ඊට මහාමාර්ග වල, දුම්රිය මාර්ග වල සහ පොදු ස්ථාන වල පවතින අස්ථාවර බෑවුම් ව්‍යුහාත්මක ක්‍රම මඟින් ස්ථාවර කිරීම ඇතුළත් වේ. කෙසේ වෙතත් මෙම පනතෙහි නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති ලැයිස්තුගත කර නොමැත. එම නිසා, මෙම ආයෝජන වැඩසටහන යටතේ පවතින ව්‍යාපෘති සඳහා පාරිසරික යෝග්‍යතාවය ලබා ගැනීම සඳහා පාරිසරික ගැටළු තක්සේරුකරණ හෝ පූර්ව පාරිසරික පරීක්ෂණ වාර්තා පිලියෙළ කිරීමට අවශ්‍ය නොවේ.

කෙසේ වෙතත්, වනාන්තර ආඥාපනතේ (451 වන පරිච්ඡේදය) 1988 අංක 3 දරණ ජාතික උරුම වන භූමිපනත යටතේ නම් කර ඇති ප්‍රදේශයක හෝ ඒවායේ සීමාවේ සිට මයිලයක් දුරින් පිහිටන ස්ථානයක ද, පාංශු සංරක්ෂණ පනත මඟින් ප්‍රකාශයට පත් කර ඇති ඕනෑම ඛාදනය විය හැකි ස්ථානයක ද රජයේ ඉඩම් ආඥාපනතට අනුව ඕනෑම ස්ථානයක පළල මීටර් 25කට වඩා ඉහල පොදු ගංගාවක ඉවුරේ සිට මීටර් 60ක දුරකින් ඉදි කිරීම් කටයුතු කිරීම සඳහා අනුමැතිය අවශ්‍ය වේ. අවශ්‍ය යෝග්‍යතාවන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ලබා ගත යුතුය. ව්‍යාපෘති ප්‍රදේශයේ සංවේදීතාවය මත වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ඒ ඒ අදාල උප ව්‍යාපෘතිය සඳහා පාරිසරික ගැටළු

තාක්සේරුකරණ හෝ පූර්ව පාරිසරික පරීක්ෂණ අධ්‍යයනයක් කරන ලෙස ඉල්ලීමක් කරනු ඇත.

නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ජාතික රජය පනවන රෙගුලාසි වලට අවනතව ක්‍රියාත්මක කෙරෙනු ඇත. ඒ අනුව, අදාල ව්‍යාපෘති ක්‍රියා ජාතික පාරිසරික රෙගුලාසි වලට අනුව සිදු කෙරෙනු ඇත. මෙම ව්‍යාපෘතියට අදාල වන ප්‍රධාන රෙගුලාසිය වන්නේ ජාතික පරිසර පනතයි. ව්‍යාපෘති ක්‍රියාවන්ගේ ස්වභාවය අනුව වෙනත් අවශ්‍ය කරන ඌණපූරක නීති ව්‍යවස්ථා ද මෙම ව්‍යාපෘතිය සඳහා අදාල වේ.

### 3.1.2. විමෝචනය/ දූදූෂණය පාලනය සඳහා වන ජාතික පාරිසරික රෙගුලාසි

නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා අදාල වන පාරිසරික සහ වෙනත් රෙගුලාසි පහත දක්වා ඇත.

**වගුව 2: විමෝචනය/ දූෂණය පාලනය සඳහා වන ජාතික පාරිසරික රෙගුලාසි**

| | රෙගුලාසි | විෂය පථය | නියාමකයා |
|---|---|---|---|
| i. | ජාතික පරිසර පනතෙහි 32 &<br>23A, 23B වගන්ති යටතේ 2008 අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදන අංක 1534/18 සහ අංක 1533/16 යටතේ ජාතික පාරිසරික<br>ආරක්ෂණ හා ගුණාත්මක රෙගුලාසි | පරිසරයට මොනයම් හෝ අන්දමේ කසල හෝ විමෝචනයක් සිදුකිරීම මෙමගින් නියාමනය වන අතර ව්‍යාපෘති ක්‍රියාව අනුව පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීමට අවශ්‍ය බව නියම කර ඇත. | මධ්‍යම පරිසර අධිකාරිය |
| ii. | 1990 පෙබරවාරියේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදන අංක 595/16 හි පළකරන ලද 1990 අංක 1 දරන ජාතික පාරිසරික (ආරක්ෂාව හා තත්වය) රෙගුලාසිය | ව්‍යාපෘති ක්‍රියා අතරතුර මිරිදිය ජලාශ්‍ර වලට අපජලය මුදා හැරීම සම්බන්ධයෙන් ප්‍රමිතීන් පනවයි<br>***ව්‍යාපෘතිය මෙම විමෝචන තත්ත්ව වලට අනුකූල විය යුතුය.*** | මධ්‍යම පරිසර අධිකාරිය |
| iii. | 1994 අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදන අංක 850/4 හි පළකරන ලද 1994 දෙසැම්බර් මස අංක 850/4 දරන ජාතික පාරිසරික (සංසරණ වායුගෝලීය ගුණාත්මක ප්‍රමිතීන් ) රෙගුලාසි<br>සහ 2008 අංක 1562/22 දරන සංශෝධනය | ව්‍යාපෘති ක්‍රියා අතරතුර පරිසරයට වායු විමෝචනය කිරීම හා සම්බන්ධ ප්‍රමිතීන් ඉදිරිපත් කරයි.<br>***ව්‍යාපෘතිය මෙම විමෝචන තත්ත්ව වලට අනුකූල විය යුතුය.*** | මධ්‍යම පරිසර අධිකාරිය |
| iv. | 1996 අංක 1 දරන ජාතික පාරිසරික<br>(ශබ්දය පාලනය) රෙගුලාසි සහ එහි සංශෝධන | යෝජිත ව්‍යාපෘති ක්‍රියා අතරතුර අවසර ඇති උපරිම ශබ්ද මට්ටම නියාමනය කරයි<br>***ව්‍යාපෘතිය මෙම තත්ත්ව වලට අනුකූල විය යුතුය.*** | මධ්‍යම පරිසර අධිකාරිය |
| v. | යන්ත්‍ර සූත්‍ර, ඉදිරිකිරීම් කටයුතු සහ රථවාහන ගමනාගමනය නිසා | කම්පන වලින් විවිධ ආකාරයේ නිර්මිත ව්‍යුහ ආරක්ෂා කිරීමට පනවා ඇති භූ කම්පන සීමා | මධ්‍යම පරිසර අධිකාරිය |

| | | | |
|---|---|---|---|
| | ඇතිවන කම්පන තත්වයන් සඳහා වන අන්තර්කාලීන ප්‍රමිති, මධ්‍යම පරිසර අධිකාරිය | | |
| vi. | 2011 ජාතික පාරිසරික (රථවාහන නලා) රෙගුලාසි අංක 1 | යෝජිත ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අතරතුර මහාමාර්ග වල හෝ වෙනත් මාර්ග වල මොනයම් හෝ රථ වාහනයක් භාවිතයේදී නිකුත් කෙරෙන නලා හඬට පැවතිය හැකි උපරිම හඬ මට්ටම නියාමනය කරයි. ***ව්‍යාපෘති ක්‍රියාකාරකම් මෙම තත්ව වලට අනුව සිදු විය යුතු වේ.*** | මධ්‍යම පරිසර අධිකාරිය |
| vii. | ජාතික පාරිසරික (නාගරික ඝන අපද්‍රව්‍ය) රෙගුලාසිය, 2009 අංක 1 | යෝජිත ව්‍යාපෘති ක්‍රියාකාරකම් අතරතුර ජාතික මහාමාර්ගයක දෙපස හෝ අදාළ ප්‍රාදේශීය බලධාරීන් විසින් ඒ වෙනුවෙන්ම නම් කර ඇති ස්ථාන වල හැරුණු කොට වෙනත් ස්ථානයන් වෙත නාගරික ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම නියාමනය කරයි. ***ව්‍යාපෘතිය මෙම තත්ත්ව වලට අනුකූල විය යුතුය.*** | මධ්‍යම පරිසර අධිකාරිය |

### 3.1.3. ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික පාරිසරික රෙගුලාසි

පහත දැක්වෙන්නේ ස්වභාවික සම්පත් වලට අදාලව ඇති ජාතික ව්‍යවස්ථායි.

**වගුව 3: ස්වභාවික සම්පත් ආරක්ෂාව සඳහා වු ජතික පාරිසරික රෙගුලාසි**

| | රෙගුලාසි | විෂය පථය | නියාමකයා |
|---|---|---|---|
| i. | තුරු ලතා ආරක්ෂණ පනත(FFPO) 1937 අංක 2, 1993 හා2009 සංශෝධනය කරන ලදී | පනත විසින් නම් කර ඇති ජාතික රක්ෂිතයකට සැතපුම් එකක් දුරින් සිදු කරන ඕනෑම සංවර්ධන කටයුත්තක් සඳහා පාරිසරික යෝග්‍යතාවයක් ලබා ගත යුතු බව කියවෙන අතර ඉන් ශ්‍රී ලංකාවේ ගස්වැල් සහ සතා සිවුපාවන් ද ඔවුන්ගේ වාසභූමි ආරක්ෂා වීම, ශ්‍රී ලංකාවේ ජෛවවිවිධත්වය සුරැකීමට ඒවා අවභාවිතයෙන් වලක්වා ගැනීමට සහ ඊට අදාළ වන ඒ හා බැඳුණු වෙනත් කරුණු සඳහා සුරක්ෂිතතාවය සපයා දෙයි. ***මෙම පනත යටතට වැටෙන රක්ෂිත ප්‍රදේශ වල ව්‍යාපෘතිය සිදු කෙරේ නම් ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට ප්‍රථම දෙපාර්තමේන්තුවෙන් යෝග්‍යතාවය ලබාගත යුතුය*** | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| ii. | 1951 අංක 34 දරණ වනාන්තර පනත | දැව සඳහා ගස් කැපීම සහ ප්‍රවාහනය සහ ඊට අදාළ වෙනත් කරුණු ආදිය පාලනය කිරීම සඳහා වනාන්තර සහ වන සම්පත් සංරක්ෂණය, සුරැකීම සහ කළමනාකරණය සඳහා අදාළ වන නීති සම්පිණ්ඩනය කිරීමට සහ සංශෝධනය කිරීමට මෙම පනත පනවා ඇත. ***(නම් කරන ලද/ නොලද) රක්ෂිත ප්‍රදේශ තුළ ව්‍යාපෘති ක්‍රියා සිදු කෙරේ නම් ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට ප්‍රථම*** | වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| | | ***දෙපාර්තමේන්තුවෙන් යෝග්‍යතාවය ලබාගත යුතුය*** | |
| iii. | 1951 අංක 9 දරණ ගස් කැපීම පිළිබඳ පනත. 1953 අංක 30 දරණ පනත මඟින් සංශෝධනය කරන ලදී | රට තුල නම් කරන ලද ශාඛ වර්ග (මූලික වශයෙන් එම නම් කරන ලද ශාඛ හිතුමතේ කපා දැමීම වැලැක්වීමට) කපා දැමීම තහනම් කිරීමට සහ පාලනය කිරීමට මෙම පනත යොදාගැනේ.<br><br>***පනතේ නම් කර ඇති ගස් වර්ග පවතී නම් සහ ඉවත් කිරීමට අවශ්‍ය වන්නේ නම් ගස් කපා දැමීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්වරයාගෙන් යෝග්‍යතාවය ලබාගත යුතු වේ.*** | දිස්ත්‍රික් ලේකම්/වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව/ දැව සංස්ථාව |
| iv. | ජල සම්පත් මණ්ඩල පනත, 1964 අංක 29(සංශෝධනය), 1999 අංක 42 | මෙම පනත ජලාශ වල සංවර්ධනය (සංරක්ෂණ හා භාවිතයට ගැනීමේ කටයුතු ඇතුළුව), ඇළ දොළ ගංගා සහ වෙනත් ජල සම්පත් දූෂණය වීම වැලැක්වීම, ජල සම්පත් පාලනය සහ පරිහරණයට අදාළ ජාතික ප්‍රතිපත්ති ගොඩනැගීම ආදිය පාලනය සහ නියාමනය කරයි.<br><br>***දූෂක විමෝචන තරයේ පාලනය කරමින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් මෙම පනතේ රෙගුලාසි පිළිපැදිය යුතුවේ.*** | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය |
| v. | පස සංරක්ෂණය කිරීමේ පනත, 1951 අංක 25 සහ 1996 අංක 24 සංශෝධනය | මෙම පනත මගින්, පසෙහි ඵලදායී ධාරිතාව ඉඅහල නැංවීමට, පාංශු ඛාදනය වලක්වාලීමට සහ අවම කිරීමට හායනය වී ඇති ඉඩම් යතාතත්වයට පත් කිරීමට, පාංශු සම්පත සංරක්ෂණය කිරීමට සහ ගංවතුරෙන් ලවණතාවය හා භාෂ්මිකතාවය ඇතිවීමෙන්, වගුරු බිම් බවට පත්වීමෙන් භූමි ආරක්ෂාකර ගැනීමට සහ ඊට අදාළ ඒ හා බැඳුණු වෙනත් කරුණු උදෙසා නීති නියෝග පනවයි.<br><br>***මෙම ව්‍යාපෘතිය මෙම රෙගුලාසි යටතේ පනවා ඇති ක්‍රියාකාරකම් වලට බොහෝ සෙයින් අනුපූරක වේ.*** | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| | **රෙගුලාසි** | **විෂය පථය** | **නියාමකයා** |
| vi. 12 | මධ්‍යම පරිසර අධිකාරිය විසින් විශේෂ ගැසට් නිවේදන යටතේ නම් කරන ලද පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශ | පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශ ලෙස නම්කර ඇති ප්‍රදේශ වල සිදුකෙරෙන ඕනෑම සංවර්ධන කටයුත්තක්, 1993.06.24 දින අංක 772/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදන සහ එහි පසු සංශෝධන | මධ්‍යම පරිසර අධිකාරිය |
| vii. 13 | 1980 අංක 47 දරන ජාතික පරිසර පනතේ 24 (c) සහ 24 (d) | ඕනෑම පාරිසරික වශයෙන් වැදගත් තර්ජනයට ලක්ව ඇති හෝ පනත යටතේ පාරිසරිකව රක්ෂිත ප්‍රදේශ ලෙස නම් කර ඇති සුරක්ෂිත කිරීමේ ඉහළ අවශ්‍යතාවයක් සහිත ප්‍රදේශ ඇතුළත සිදුකරවන ඕනෑම සංවර්ධන ක්‍රියාවලියක් | මධ්‍යම පරිසර අධිකාරිය |

| | | | | |
|---|---|---|---|---|
| viii. | 14 | පැළෑටි අරක්ෂා කිරීමේ පනත 1999 අංක 35 | ජෛව ඉංජිනේරු ක්‍රමවේද වලට කණ්ඩි අස්ථාවර කිරීමේ කටයුතු සඳහා ශාඛ හෝ බීජ ලංකාවට ආනයනය කිරීමට අවශ්‍ය වේ නම්, කෘෂිකර්ම අධ්‍යක්ෂ ජෙනරාල්වරයා වෙනුවට කටුනායක ජාතික පැළෑටි නිරෝධායන සේවයේ අතිරේක අධ්‍යක්ෂකවරයා විසින් නිකුත් කරන ලද පැළෑටි ආනයනය කිරීමේ බලපත්‍රයක් යටතේ එහි කොන්දේසි වලට අනුකූලව එය සිදු කළ යුතුවේ. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |

### 3.1.4 ව්‍යාපෘතියට අදාළ වෙනත් රෙගුලාසි

**වගුව 4: ව්‍යාපෘතියට අදාළ වෙනත් රෙගුලාසි**

| | **රෙගුලාසි** | **විෂය පථය** | **නියාමකයා** |
|---|---|---|---|
| i. | 1976 අංක 36 වැනි පුපුරණ ද්‍රව්‍ය පනත | ව්‍යාපෘතියට අදාළ පුපුරන ද්‍රව්‍ය යොදා ගැනෙන කාර්යයන් හා සම්බන්ධ කරුණු පාලනයට සහ රෙගුලාසි පැනවීමට<br>***පිපිරවීමේ කටයුතු අවශ්‍ය කෙරෙන වැඩබිම් වල පුපුරන ද්‍රව්‍ය භාවිතා කිරීමට ව්‍යාපෘතිය මගින් අවසර ගතයුතු වේ.*** | ආරක්ෂක අමාත්‍යාංශය |
| ii. | 1947 අංක 29 වැනි මහනගර සභා ආඥාපනත, 1939 අංක 61 දරන නගර සභා ආඥාපනත සහ 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනත 2010 වසරේ එහි සංශෝධනය | රජයේ නීති සහ රෙගුලාසි වලට යටත් වන ප්‍රදේශයන්හී සිදු කෙරෙන මාර්ග, බෝක්කු, පාලම්, තොටුපළ, ජල මාර්ග සහ වෙනත් දේශීය ගමනාගමන ක්‍රම වැනි සමාජ-ආර්ථිකමය සංවර්ධන කටයුතු වලට අදාළ ක්‍රියාකාරකම් සහ ඊට අදාළ වන කම්කරු වාඩි, වැඩබිම් කාර්යාල යනාදිය සඳහා භූමිය ශුද්ධ කිරීම් සහ එම ක්‍රමවේද යන මේ ක්‍රියාකාරකම් නියාමනය කිරීම සහ පාලනය කිරීම සිදුකරයි.<br>***ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සඳහා අදාළ ප්‍රාදේශීය බලධාරීන්ගෙන්/ නගරසභාවෙන් සැලසුම්කරණ කමිටු අනුමැතිය අවශ්‍ය වනු ඇත.*** | පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය |
| iii. | 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනත | ශ්‍රී ලංකාවේ රජයේ ඉඩම් ප්‍රතිපාදන සහ පවරාදීමේ කටයුතු සඳහා ද, එවන් ඉඩම් සහ වෙරළ අසබඩ භූමි කළමනාකරණය සහ පාලනය කිරීමට ද, වැව් සහ පොදු ඇළ දොළ වල ජලය භාවිතය සම්බන්ධයෙන් රෙගුලාසි පැනවීමට ද, වෙනත් අනියම් හෝ යෝජිත ව්‍යාපෘතියට අදාළ කාරණා වලට සම්බන්ධ අවශ්‍යතා සඳහා ද විධිවිධාන සලසන ආඥාපනතකි<br>***ව්‍යාපෘති ක්‍රියාකාරකම් රජයේ ඉඩම් තුළ සිදුවේ නම් ප්‍රාදේශීය ලේකම්වරයා හරහා ඊට අවසර ගත යුතු වේ.*** | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම්වරයා හරහා අයදුම්පත් යොමු කළ යුතුවේ. |
| iv. | 1940 අංක 9 දරන පුරාවස්තු ආඥාපනත සහ එහි සංශෝධන | ඕනෑම පුරාවිද්‍යාත්මක රක්ෂිතයකට ආසන්නයේ සිදුකෙරෙන ව්‍යාපෘති ක්‍රියාකාරකම් මෙම පනතෙන් නියාමනය කෙරේ.<br>***ව්‍යාපෘති ක්‍රියාකාරකම් පුරාවිද්‍යාත්මක රක්ෂිතයකට බාධා සිදු කරයි නම් පුරාවිද්‍යා*** | පුරා විද්‍යා දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| | | ***දෙපාර්තමේන්තුවේ යෝග්‍යතාවය ලබාගත යුතුවේ. මෙම ව්‍යාපෘතියේදී පුරාවිද්‍යාත්මක රක්ෂිත අවහිර කිරීමක් සිදුවීමට හැකියාවක් නොමැති තරම්ය.*** | |

වගුව 4 තවදුරටත්

| | **රෙගුලාසි** | **විෂය පථය** | **නියාමකයා** |
|---|---|---|---|
| v. | 2009 අංක 38 දරන සුරක්ෂිතතා සහ සෞඛ්‍ය පනත | කම්කරුවන්ගේ සුරක්ෂිතතාව කළමනාකරණය කිරීම සහ අනතුරු වැළැක්වීම | කම්කරු දෙපාර්තමේන්තුව (වෘත්තීය සෞඛ්‍ය කොමසාරිස්) |
| vi. | 1862 230 පරිච්ඡේදයේ අංක 15 දරන කරදර ආඥාපනත | අසල්වැසි පදිංචිකරුවන් වෙත ව්‍යාපෘති ක්‍රියාකාරකම් නිසා බාධා සිදු නොවිය යුතුය. | පළාත් පාලන ආයතන |

### 3.1.5. මෙම ව්‍යාපෘතියට අදාල භූමි වල අයිතිය සඳහා වන ව්‍යවස්ථාපිත රාමුව හා එම ඉඩම් අත්පත් කර ගැනිම

මෙම ව්‍යාපෘතිය සඳහා වන ඉඩම් බොහෝ විටෙක පුද්ගලික ඉඩම් හෝ රජයේ ඉඩම් වේ. පුද්ගලික ඉඩම් වල අයිතිකරු පෞද්ගලික පුද්ගලයෙකු වේ. ඉඩමේ හිමිකාරත්වය සඳහා වන ඔප්පු ඔවුන් සතුව පවතී. රජයේ ඉඩම් යනු විවිධ රජයේ ආයතන යටතේ පවතින ඉඩම් වේ. රජයේ ඉඩම් වල අයිතිය එම එක් එක් ආයතනය සඳහා වූ පනත් මඟින් පාලනය වේ.

### යෝජිත නායයාම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වැදගත් වන ඉඩම් හිමි රාජ්‍ය ආයතන

i. මහාමාර්ග සංවර්ධන අධිකාරිය(RDA) යටතේ පවතින මාර්ග සංරක්ෂිත
*(1981)මාර්ග සංවර්ධන අධිකාරී පනත මගින් මාර්ග සංවර්ධන අධිකාරිය පිහිටුවීම පිළිබඳවත් එහි බලතල, කාර්යභාරයන්, යුතුකම් සහ වගකීම් පිළිබඳවත් විධිවිධාන සපයයි. මෙම පනතේ II කොටසෙහි 'මාර්ග සංවර්ධනය' සඳහා භූමි වෙන්කර ප්‍රකාශයට පත්කිරීම ඇතුළත් වන අතර පනත යටතේ ඉන් අදහස් කෙරෙන්නේ නව මාර්ග ඉදිකිරීම හා පවතින මාර්ග නඩත්තු කිරීම හෝ වැඩිදියුණු කිරීම (වැඩිදියුණු කිරීම යන්නට ඕනෑම මාර්ග පුළුල් කිරීමක්, මට්ටම් කිරීමක්, අඩි පාරවල් සකස් කිරීමක්, දුහුවිලි අවම කිරීමට ප්‍රතිකර්ම යෙදීමක් හෝ සාමාන්‍ය නඩත්තු කිරීමේ කටයුතු වලට ඔබ්බෙන් ඇති වෙනත් ඕනෑම කාර්යයක් ඇතුලත් වේ යැයි සැලකේ) යනාදියයි.*

ii. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින රක්ෂිත වනාන්තර

iii. වනජීවී දෙපාර්තමේන්තුව යටතේ පවතින වනජීවී රක්ෂිත

iv. වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පවතින ගංගා රක්ෂිත හෝ දිස්ත්‍රික් ලේකම් යටතේ පවතින රජයේ ඉඩම්

v. ශ්‍රී ලංකා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම යටතේ පවතින ඉඩම්

vi. නිවාස සංකීර්ණ සඳහා නිදහස් කළ රජයේ ඉඩම්; ජයභූමි හා ස්වර්ණභූමි ඔප්පු මඟින්

### පුද්ගලික ඉඩම්:

තනි පුද්ගලයන්ට හෝ සාමාජිකයන් කිහිප දෙනෙකුට අයිති වන ඉඩම් මීට ඇතුලත් වේ. සමාගම් වලට අයිතිය තිබෙන ඉඩම්ද පවතී. තේ හා රබර් වගා භූමි වල අයිතිය බොහෝ විට පෞද්ගලික ආයතන සතු වේ.

## වෙනත් අයිතීන්:
## පන්සල් හා දේවාලගම් පනත යටතේ හිමිකාරත්වය පවතින ඉඩම්

***1931 අංක 19 වැනි බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනත:*** *මෙම ආඥාපනතේ විෂය පථයට යටත් වන පන්සල් සතු දේපල පත් කරන ලද විශ්වසදායකයන් පිරිසක් විසින් කළමනාකරණය කිරීමට පවරයි. වෙනත් කරුණු වලට අමතරව, මෙම පනතේ, පන්සල් හා දේවාල සතු ඉඩම්, පොදු කටයුතු සඳහා පවරා ගන්නා විට ඒවායෙහි භාරකරුවන් හට වන්දි ලබා ගැනීමට ඇති අයිතිය පිළිබඳවද සඳහන් වෙයි.*

### 3.1.6. 1950 ඉඩම් අත්පත් කර ගැනීමේ පනත හා පසුකාලීන සංශෝධන හා රෙගුලාසි

1950 ඉඩම් අත්පත් කර ගැනීමේ පනතෙන් පොදු අරමුණු සඳහා ඉඩම් හා සේවා පවරා ගැනීම මෙන්ම ඒහා සම්බන්ධ සහ ඊට අදාළ වන කාරණා පිළිබඳ කියැවේ. *ඉඩම් වල, ගොඩනැගිලි හා බෝග වලට ඇති වෙළඳපොළ වටිනාකමට අනුව වන්දි මුදල් ගෙවන ආකාරය පිළිබඳව එහි සඳහන් වෙයි.* දැනට පවතින පනතෙහි සංශෝධන කිහිපයක්ම සිදු වී තිබෙන අතර නවතම සංශෝධනය 1986 දී කරන ලද සංශෝධනයයි. මෙම පනතට 2008 දී ප්‍රතිශෝධන සිදු කරනු ලැබූ අතර එය 2009 ජනවාරි 20 වන අඟහරුවාදා අංක 1585/7 දරණ ගැසට් පත්‍ර නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම ප්‍රතිශෝධනයෙන් *නැවත පදිංචි කිරීම් සැලසුම්කරණයට සැලකිය යුතු බලපෑමක් තිබෙන්නේ එහි "නැවත ඉදිකිරීමේ වියදම" පිළිබඳ සඳහන් කෙරෙන බැවිනි.* ශ්‍රී ලංකාව සිදු කරනු ලබන සියලුම සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් පවරා ගැනීමේ අයිතිය දිස්ත්‍රික් ලේකම් සතු වේ.

### 3.1.7 අවතැන් වූ ප්‍රජාව නැවත පදිංචි කිරීම සඳහා වන රෙගුලාසි

ශ්‍රී ලංකාවේ 2001 ස්ව කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය නම් ප්‍රතිපත්තියක් තිබේ. මෙම ප්‍රතිපත්තිය මඟින් ඉඩම් අත්පත් කර ගැනීමේදී සිදු විය හැකි විකලතා සැලකීමට ගෙන ඇති අතර එහි අරමුණ වී ඇත්තේ ස්ව කැමැත්තෙන් තොර නැවත පදිංචි කිරීම් අවම කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගැනීම හා එය නොවැලක්විය හැකි නම් විපතට පත් ජනතාවට ඔවුන්ගේ නව ජීවන රටාවට හුරු වීම සඳහා උදව් කිරීම වේ. ඉහත ප්‍රතිපත්තියෙහි නැවත පදිංචි කිරීම සඳහා පහත සඳහන් මූලික කරුණු ඇතුලත් වන පරිදි නැවත පදිංචි කිරීමේ සැලැස්මක් ක්‍රියාවට නැංවීමේ වගකීම ඉදිරිපත් කරේ. ඒවා නම් I) ජනතාව සඳහා වන අව බලපෑම් ඉවත් කළ හැකි හෝ අවම කළ හැකි වෙනත් විකල්ප සෙවීම; ii) ඉඩම් හිමිකාරත්වයක් නොමැති පුද්ගලයින්ට වන්දි ලබා දීම; iii) අවතැන් වූ ජනතාව හා ඔවුන්ගේ සත්කාරක ප්‍රජාව සඳහා නැවත පදිංචි කිරීම සම්බන්ධ විකල්ප පිළිබඳ උපදෙස් ලබා දීම; iv) අවතැන් වූ ජනතාවේ සහ ඔවුන්ගේ සත්කාරක ප්‍රජාවෙහි සාර්ථක සමාජයීය හා ආර්ථිකමය ඒකාබද්ධතාවයක් ඇති කිරීම; සහ v) අවතැන් වූ ජනතාව සඳහා පූර්ණ සමාජයීය හා ආර්ථික පුනරුත්ථාපනයක් ලබා දීම යනාදියයි. කෙසේ වුවද, මෙම නිර්දේශ සැබෑ අවස්ථා වලදී ක්‍රියාත්මක වීම, ව්‍යාපෘතිය හෝ එහි ස්වභාවය මත බෙහෙවින් රඳා පවතින වන බවක් පෙනේ.

ශ්‍රී ලංකාවේ බොහෝ සංවර්ධන ව්‍යාපෘති වලදී ස්ව කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීම් සිදු වී ඇත. කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය, ජල විදුලි ව්‍යාපෘති සහ මාර්ග සංවර්ධන ව්‍යාපෘති වැනි ප්‍රධාන ගංගාද්‍රෝණි ව්‍යාපෘති වලදී ද සිදු වී ඇත්තේ ස්ව කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීම්ය. මේ හේතුවෙන් බලපෑමට පත් ජනතාව වෙත විවිධ සමාජයීය බලපෑම් එල්ල වී ඇති අතර සමහර සිදුවීම් පරම්පරා ගණනාවක් ගත වන තුරු ද විසඳී නොමැත. කෙසේ වුවද, වර්තමානයේ සිදු කරනු ලබන නැවත පදිංචි කිරීමේ වැඩසටහන් වලදී බොහෝ සමාජයීය බලපෑම් සැලකිල්ලට ගනු ලබන අතර විශාල වන්දි ලබා දීම මඟින් ඇති විය හැකි අව බලපෑම් අවම කර ගැනීමට ක්‍රියා කර ඇත.

**ජල සම්පත්, වාරිමාර්ග හා අපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් ස්වභාවික ආපදා හේතුවෙන් අවතැන් වූ ජනතාව සඳහා නැවත පදිංචි කිරීම සඳහා වන ක්‍රමෝපායන් සකස් කර ඇති අතර ඒවා 2016 සිට ක්‍රියාවට නැංවේ.** පහත සඳහන් වන්නේ නායයෑම් ආපදා හේතුවෙන් අවදානමට ලක්ව ඇති/විපතට පත් පවුල් සඳහා අමාත්‍යාංශය මඟින් නිර්දේශ කරනු ලැබූ නැවත පදිංචි කිරීමේ ක්‍රියාපටිපාටියයි.

ප්‍රමුඛතා පදනම මත නැවත පදිංචි කිරීම සඳහා පවුල් තෝරා ගැනේ. මේ අනුව, මුල් ප්‍රමුඛතාවය දෙනු ලබන්නේ නායයෑම් මඟින් තම නිවාස සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හානි වූ පවුල් වෙතයි. නාය හිස ආශ්‍රිත ප්‍රදේශයේ තිබෙන නිවාස වලට හා ඉරි තැලීම් වලට ලක් වූ නිවාස වලට දෙවන ප්‍රමුඛතාව ලබා දෙයි. නාය ගලන මාර්ගයේ හා සුන්බුන් තැන්පත් වන ප්‍රදේශයේ පිහිටා ඇති නිවාස වලට තෙවන ප්‍රමුඛතාව ලබා දෙයි.

නායයෑම් මඟින් විපතට පත් ප්‍රමුඛතා 1 හා 2 හි සඳහන් පවුල් සඳහා නැවත පදිංචි කිරීම් අනිවාර්ය වේ. මීට අමතරව NBRO විසින් අධි අවදානම් ලෙස නම් කරන ලද පවුල්ද නැවත පදිංචි කිරීමේදී වැඩි ප්‍රමුඛතාවක් සහිත ලෙස සලකනු ලැබේ.

පහත සඳහන් වන්නේ නැවත පදිංචි කිරීමේ විකල්පයි.

i. ඉඩමක් සහ නිවසක් මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන් 1.6ක්
ii. ඉඩමක් මිලදී ගැනීමට රුපියල් මිලියන 0.4ක් හා නිවසක් ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 1.2ක්
iii. රජය විසින් ඉඩමක් ලබා දීම සහ නිවසක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 1.2ක් ලබා දීම

මෙම ක්‍රියාවලියේදී නායයෑම් නිසා විපතට පත් වූ ජනතාව දැනුවත් කිරීම හා උපදෙස් ලබා දීම තරයේ නිර්දේශ කරනු ලබන අතර එම ජනතාව ඉඩමක් මිලදී ගෙන නිවසක් තැනීම සඳහා යොමු කිරීමට දිරිමත් කරයි. නිවාස සෑදීම සඳහා රජයේ ඉඩම් ලබා දුනහොත්, ඉදිකිරීම් සිදුකිරීමට ප්‍රථම NBRO නිර්දේශ වලට අනුකූලව සුදුසු ඉඩම් තෝරා ගැනීම, ඉඩම් කට්ටි කිරීම, ජලපරිවහනය ක්‍රමවත් කිරීම, ඛාදනය අවම කිරීම වැනි ක්‍රියාමාර්ග ගත යුතුය. එමෙන්ම නිවාස සැලසුම් කිරීම හා ඉදිකිරීම ද NBRO නිර්දේශ වලට අනුකූලව සිදු විය යුතුය. මුදල් වාරික වශයෙන් ලබා දෙන අතර ඉඩම මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 0.4ක් මූලිකව ලබා දී වාරික 4කින් නිවස සෑදීම සඳහා මුදල් ලබා දේ. ආපදා ප්‍රත්‍යාස්ථ නිවාස සෑදීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් හා දැනුවත් කිරීම් NBRO මඟින් ලබා දීමට උපදෙස් ලබා දී තිබේ.

### 3.1.8 ආදීවාසි ජනතාවගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා වන ක්‍රියාමාර්ග

ආදිවාසී ජනතාව යනු කවුරුන්ද යන්නට විශ්වීය අර්ථ දැක්වීමක් නොමැත. නමුත් පහත සඳහන් ලක්ෂණ සහිත ප්‍රජා ආදිවාසීන් ලෙස සාමාන්‍යයෙන් සලකනු ලැබේ. ඔවුන් රටෙහි ප්‍රධාන සංස්කෘතියට සාපේක්ෂව කුඩා ජනගහනයක් වේ. සාමාන්‍යයෙන් ඔවුන්ට තමන්ටම ආවේණික භාෂාවක් ඇත. ඔවුන් තවමත් භාවිතා කරන තමන්ට අවේණික සංස්කෘතික සම්ප්‍රදායන් පවතී. ඔවුන් සතුව ඔවුන්ගේම ඉඩම් හා භූමි පවතින අතර ඔවුන් ඒවා සමඟ අවේණික ක්‍රම මඟින් බැඳී පවතී.

ශ්‍රී ලංකාවේ අපට එවැනි එක් ප්‍රජාවක් දැක ගත හැකි අතර ඔවුන් ‘වැද්දන් හෝ වන්නි මිනිසුන් (වනාන්තරයේ වාසය කරන්නන්)’ ලෙස හඳුන්වයි. මෙම වැදි ප්‍රජාව පිළිබඳව තිබෙන විධිමත් සාහිත්‍යය ඉතාම අල්පය. මෙම ප්‍රජාව පිළිබඳව සඳහන් වන පළවන වාර්තාව ලැබෙන්නේ 1911 දී සෙලිග්මාන්ස් විසින් සිදු කරන ලද වැද්දන් පිළිබඳ වූ මානව විද්‍යා අධ්‍යනයෙනි. කතුවරයාට අනුව මෙම ප්‍රජාව මහවැලි හා ගල්ඔය ගංගාද්‍රෝණි ආශ්‍රිතව රටෙහි මධ්‍යම කඳුකරය හා ඊසාන ප්‍රදේශ අතර වාසය කරමින් සිට ඇත.

ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයේ ප්‍රේම කුමාර ද සිල්වා, අසිත ජී. පුංචිහේවා යන අය විසින් 2010 වර්ෂයේදී වැදි ප්‍රජාව පිළිබඳව කරන ලද සමාජයීය-මානව විද්‍යා පර්යේෂණයට අනුව ශ්‍රී ලංකාවේ වැද්දන් වර්ෂ සිය දහස් ගණනක සිට මෙම දිවයිනේ මුල් වැසියන් ලෙස වාසය කර ඇති බව පෙනේ. වැද්දන්ගේ වංශානුක්‍රමය අවුරුදු 30000කට වඩා ඈතට දිව යන අතර අවුරුදු 2500කට පෙර විජය රජු පැමිණීමට පෙර සිටම වැද්දන් මෙහි සිට ඇති බවට ඇතමෙක් විශ්වාස කරයි. වැද්දන්ගේ උරුමය අවුරුදු 34,000කට වඩා ඈතට අතීතයට දිවයන බව තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් තරම් සාධක පවතින බව පර්යේශණ වාර්තා වල පැවසේ (ද සිල්වා 1972 සහ ධර්මදාස 1990). වර්තමාන වැද්දන්ගේ මුතුන්මිත්තන් විය හැකි බලන්ගොඩ මානවයාගේ (බලන්ගොඩ මානවයා හෝ උප විශේෂයක් වන හෝමෝ සේපියන් බලන්ගොඩෙන්සිස්) සහ විජය රජුන්ට පෙර සමය පිලිබඳව අධ්‍යනයන් සිදු කර ඇත. ගෝලීය මට්ටමින් ගත් කල, ඉන්දියාව, ඔස්ට්‍රේලියාව, දකුණු හා උතුරු ඇමරිකාව සහ ලෝකයේ වෙනත් ප්‍රදේශ වල ආදිවාසී ජනතාව පිළිබඳව සිදු කර ඇති පර්යේෂණ වල ප්‍රතිඵල වලට අනුව, ශ්‍රී ලංකාවේ වැද්දන් වැනි ස්වදේශීය ආදිවාසීන් අවුරුදු 20,000ක් හෝ 30,000 ක් පමණ කාලයක සිට ජීවත් වී ඇති බව තවදුරටත් සාධාරණීකරණය කෙරේ.

ආදි කාලීන වැද්දන් දඩයම් කර ජිවත් වූ අතර ඔවුන් සම්පූර්ණයෙන්ම කැලෑවෙහි ජිවත් විය. පිරිමින් සාමාන්‍යයෙන් ඉනෙන් පහලට පමණක් ඇඳුම් ඇඳි අතර ඔවුන්ගේ රැවුල් පපුව දක්වා වවනු ලැබිය. එමෙන්ම ඔවුන් පොරවක් හා දුන්නක් මඟින් සන්නද්ධව සිට ඇත. වැදි ජනයා ඔවුන්ට අවේණික වූ වැදි භාෂාව කථා කරයි. ඔවුන් දුෂ්කර වනාන්තර ගම් වල හෝ වැසි වනාන්තර (වියලි මිශ්‍ර සදාහරිත මෝසම් වනාන්තර) ආශ්‍රිතව ජිවත් වී ඇත.

කෙසේ වුවද, වෙනත් ආදිවාසින්ට සාපේක්ෂව, පුරාණ කාලයේ සිටම වැදි ජනයා රටෙහි කලින් කලට සිදු වූ ස්වභාවික, දේශගුණික, සමාජ දේශපාලනික වෙනස් වීම් වලට හොඳින් හැඩ ගැසී ඇත. 2010 වැනි මෑත කාලයේදී සිදු කරන ලද පර්යේෂණ වලට අනුව සිංහල ප්‍රජාව, බෞද්ධ බලපෑම, ඉන්දියාවෙන් පැමිණි ආක්‍රමණිකයන්, බ්‍රිතාන්‍ය පාලකයන්, ගල්ඔය හා මහවැලි සංවර්ධන වැනි විවිධ ගංගාද්‍රෝණි සංවර්ධන වැඩසටහන්, නියං සහ සාගත, වනාන්තර එළි කිරීම්, කෘෂිකර්මාන්තය නවීකරණය වීම සහ දෙමල ඊළාම් අර්බුදය වන් බාහිර සාධක හේතුවෙන් වැදි ජනයා විශාල ලෙස පීඩනයට භාජනය වූ බව පෙන්නුම් කරයි. මේ සියල්ල හේතුවෙන් වැදි ජනයා සතුව තිබූ ස්වයං අනන්‍යතාවය කෙමෙන් අඩුවී යමින් ඔවුන් තම මුල් වාසස්ථාන අතහැර ආරක්ෂිත ප්‍රදේශ කරා සංක්‍රමණය වීමට පෙළඹී ඇත. වඩා යහපත් සමාජ පිළිගැනීමක් සඳහා ඔවුන් ප්‍රධාන වාර්ගික ප්‍රජා (සිංහල සහ දෙමළ) සමඟ මුඛ්‍යධාරාගත වී ඇති අතර ඒ සඳහා රජවරුන් සඳහා සේවය කිරීම, ප්‍රධාන ප්‍රජා වල සංස්කෘතීන්ට පුරුදු වීම සහ වෙනත් ප්‍රජාවන් සමඟ විවාහ කටයුතු සිදු කිරීම වැනි ක්‍රමවේදයන්ට අනුගත වී ඇත. ගංගාද්‍රෝණි ව්‍යාපෘති, වනාන්තර එළි කිරීම සහ වනාන්තර සහ වනජීවී සංරක්ෂණ නීති ආදිය, වැදි ජනතාවගේ සාම්ප්‍රදායික ජීවන රටාව සඳහා විශාල බලපෑමක් සිදු කර ඇත. මෙම නීති මඟින් දඩයම් කිරීම හා මස් එකතු කිරීම නීතිවිරෝධී ලෙස නම් කර ඇති බැවින් වැදි ජනයා දඩයම් කිරීම අතහැර ගොවියන් මෙන් ජිවත් වීමට පෙළඹී ඇත. වැදි ජනයාගේ සාම්ප්‍රදායික දඩයම් ජීවිකාව, මස් කර්මාන්තය උදෙසා දඩ සතුන් මැරීමට විශාල වශයෙන් අවභාවිතා වීම හේතුවෙන් රජය මෙම නීති පිළිබඳව තදින් ක්‍රියාමාර්ග ගන්නා ලදී. අතීතයේදී වැදි ජනතාව ඉතා දුප්පත් හා නූගත් වූ හෙයින් ඔවුන්ගේ දිළිඳු බව තුරන් කිරීමට හා නිදහස් අධ්‍යාපනයක් ලබා දීමට ශ්‍රී ලංකා රජය විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

ආදිවාසීන්ගේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම සඳහා විශේෂිත නීතියක් නොමැති වුවත් එක්සත් ජාතීන්ගේ සාමාජික රටක් වශයෙන් 1957 ආදිවාසී ජනතා සම්මුතිය හා නිර්දේශය යන්නට අදාලව වැදි ජනයා සඳහා ඇති අයිතීන් සුරක්ෂිත කිරීමට ශ්‍රී ලංකාව බැඳී සිටී. ලෝකයේ සිටින ආදිවාසීන් වෙනුවෙන් වූ ප්‍රථම අන්තර්ජාතික දශකය 1993 දෙසැම්බර් 21 වන දින 48/163 දරණ ප්‍රඥප්තිය මගින් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයෙන් ප්‍රකාශයට පත්

කරන ලදී. මෙම ප්‍රඥප්තියට අනුව ශ්‍රී ලංකාවේ වැදි ජනයාද ඇතුලත්ව 1995 සිට 2004 දක්වා ලෝකය පුරා සිටින මිලියන 300 කට වැඩි ආදිවාසී ජනතාවගේ තත්වය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මහා මණ්ඩලය කැපවී තිබෙන බව ප්‍රකාශ කර ඇත. මෙම සම්මුතියට අනුව වැදි ජනයාගේ ස්වයං අනන්‍යතාවය සඳහා සැලකිය යුතු බලපෑමක් සිදු වූවද, ලෝකයේ වෙනත් ආදිවාසීන් ද මුහුණ දෙන පොදු කාරණා හේතුවෙන් ඔවුන්ගේ ස්වයං අනන්‍යතාවය නැති වී යමින් පවතී.

ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය, නිදහස් අධ්‍යාපනය, රාජ්‍ය අංශයේ රැකියා අවස්ථා සහ ඔවුන්ගේ සංස්කෘතික ඉසව් සඳහා රජයේ සහය ලබා ගැනීම වැනි සේවා සඳහා ශ්‍රී ලංකාවේ වැදි ජනතාවට සමාන අයිතිවාසිකම් පවතී. ආදිවාසීන්ගේ සංස්කෘතික අංග සංචාරක ආකර්ෂණයක් වන අතර මෙය ප්‍රජාව සඳහා අදායම් මාර්ගයක් බවටද පත් වී ඇත.

1911 දී (බ්‍රිතාන්‍ය පාලන සමයේ දී), 2010 හා වර්තමානයේ වැදි ජනතාවගේ ව්‍යාප්තිය 15 සහ 16 රූපසටහන් මඟින් දැක්වේ. ආදිවාසී ජනතා සඳහා වන මධ්‍යස්ථානයක් වන "ආදිවාසී කේන්ද්‍රයට" අනුව වර්තමානය වන විට ඔවුන් ගම්මාන 62ක වාසය කරයි. මෙම ව්‍යාපෘතියට අදාල වන ස්ථාන 147 සඳහා සිදුකළ සමාජ සමාලෝචනයෙන් ඒ ස්ථාන කිසිවක් වැදි ජනතාව හා මැදිහත් නොවේ. එම නිසා, මෙම ව්‍යාපෘතිය AIIB හි ESS3 නම් වර්ගීකරණය යටතට නොගැනේ.




රූපසටහන 15: 1911දී වැදි ජනයාගේ ව්‍යාප්තිය



**රූපසටහන 16: 2010 දී වැදි ජනයාගේ ව්‍යාප්තිය**

### 3.2 යෝජිත නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා බලපාන AIIB හි පාරිසරික හා සමාජයීය සුරැකිතා විධිවිධාන

ආයෝජන ව්‍යාපෘති මූල්‍යකරණය හරහා AII බැංකුව විසින් ආධාර සපයන ව්‍යාපෘති සඳහා පැවතිය යුතු ***අනිවාර්ය අවශ්‍යතා*** ආයෝජන ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා වන පාරිසරික හා සමාජයීය ප්‍රතිපත්තියෙන් දක්වා තිබේ. මේ සඳහා, බැංකුව විසින් විශේෂිත පාරිසරික හා සමාජයීය තත්ව (ESS) ප්‍රධාන සංරචක 3ක් යටතේ (පහත විස්තර කර ඇති පරිදි) හඳුන්වා දී ඇත. මෙම සංරචක සැලසුම් කර ඇත්තේ බැංකුව මඟින් ආයෝජනය කරනු ලබන ව්‍යාපෘති වල පාරිසරික හා සමාජයීය අවදානම හා බලපෑම් ඉවත් කිරීමට, අඩු කිරීමට හෝ අවම කිරීමට හැකි වන පරිදියි. **යොමුව:** පාරිසරික හා සමාජයීය රාමුව, ආසියානු යටිතලපහසුකම් ආයෝජන බැංකුව, 2018 පෙබරවාරි

බැංකුව මඟින් ව්‍යාපෘතිය අනුමත කරන අවස්ථාව වන විට ව්‍යාපෘතියේ අඩංගු වන වැඩසටහන් හා ක්‍රියාකාරකම් වල විස්තර හඳුනාගෙන නොමැති වීම හේතුවෙන් **පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුවක්** බැංකුව විසින් ඉල්ලා සිටී. මෙහි අරමුණ වන්නේ පහත සඳහන් කාරණා වලට අනුකූලව මෙහි ක්‍රියාකාරකම් ඇගයීමට ලක් වන බව සහ ක්‍රියාවට නැංවෙන බව තහවුරු කර ගැනීමයි.

---

**ESS 1:** අවදානම් සහ බලපෑම් වලට අදාල වන **පාරිසරික හා සමාජීය ඇගයීමක් සිදු කරමින්** ඒවා වළක්වා ගැනීමට, අවම කිරීමට හිලවු කිරීමට හෝ ඒවා සඳහා හානිපූරණයට කටයුතු කිරීම. **මෙම අංශය නායයාම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියට අදාළ වේ.**
**ESS 2:** මෙම ව්‍යාපෘතිය මඟින් අකමැත්තෙන් සිදු කරනු ලබන නැවත පදිංචි කිරීමේ ක්‍රමවේදයකට යෑමට සිදු වුවහොත් එය තක්සේරු වාර්තාවේ සමාජයීය කොටසේදී ESS 2 හි සඳහන් වන පරිදි ඉතා ගැඹුරින් සාකච්ඡා කළ යුතුය. සේවාදායකයා විසින් ස්වයංව සිදු කෙරෙන නැවත පදිංචිවීම නැවත පදිංචි කිරීමේ සැලසුමක හෝ නැවත පදිංචි කිරීම් සැලසුම්කරණ රාමුවක දී ආවරණය කෙරෙන අතර, ***එය වියුක්ත ලියවිල්ලක් ලෙස හෝ ඇගයුම් වාර්තාවේ ඇමුණුමක් ලෙස හෝ අනන්‍යව හඳුනාගත හැකි අංගයක් ලෙස වාර්තාවට එකතු කර බැංකුව වෙත බාරදෙනු ලැබේ. මෙම අංශය නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ අදාළ විය හැක.***

**ESS 3:** මෙම ව්‍යාපෘතිය මඟින් ආදිවාසී ජනයාට බලපෑමක් සිදු වේ නම් එය තක්සේරු වාර්තාවේ සමාජයීය කොටසේදී ESS 3 හි සඳහන් වන පරිදි ඉතා ගැඹුරින් සාකච්ඡා කළ යුතුය. **සේවාදායකයා විසින් ස්වදේශීය ජනයා වෙත එල්ල වෙන බලපෑම් ස්වදේශීය ජනතා සැලසුමක හෝ ස්වදේශීය ජනතා සැලසුම්කරණ රාමුවක ආවරණය කරන** ***අතර එය වියුක්ත ලියවිල්ලක් හෝ ඇගයුම් වාර්තාවේ ඇමුණුමක් හෝ අනන්‍යව හඳුනාගත හැකි අංගයක් ලෙස වාර්තාවට එකතු කෙරෙන්නක් වේ. මෙය නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ අදාළ නොවේ.***

---

### 3.3 අඩුලුහුඬුතා විශ්ලේෂණය හා එම අඩුලුහුඬුතා මඟ හරවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග

#### 3.3.1 ජාතික පාරිසරික ආරක්ෂණ ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන අඩුලුහුඬුතා

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ස්වභාවධර්මයට හා මිනිසුන්ට සිදුවනු ඇතැයි බලාපොරොත්තු විය හැකි බලපෑම් වලින් ආරක්ෂා වීමට අවශ්‍ය තරම් ආවරණයක් ලබා දීම රටෙහි ජාතික පාරිසරික ආරක්ෂණ ව්‍යවස්ථා මඟින් සිදු කරනු ලබයි. ජාතික පරිසර පනත්

ව්‍යවස්ථාපිතය, AIIB හි ESS1 හි පාරිසරික සුරැකිතා මූලධර්ම වලට බොහෝ සේ සමාන වේ. ජාතික පරිසර පනතත්, එහි සංශෝධනත් ඊට ආධාරක වශයෙන් ඇති රාජ්‍ය මට්ටමේ ව්‍යවස්ථාත් නිසා මෙම ප්‍රතිපත්තිය සතුටුදායක මට්ටමේ පාරිසරික නියාමන රාමුවක් බවට පරිවර්තනය වී තිබේ.

රජයේ සංයුක්ත පාරිසරික යෝග්‍යතා ක්‍රියාවලිය මූලික වශයෙන් AIIB හි පාරිසරික ඇගයීමේ හා හෙළිදරව් කිරීමේ අවශ්‍යතා හා ගැළපේ. “නියම කරන ලද” ව්‍යාපෘති සඳහා පාරිසරික ගැටළු තක්සේරුකරණ වාර්තා හෙළිදරව් කිරීම අනිවාර්ය වේ. මෙසේ නියම කිරීමට යෝජිත ව්‍යාපෘතියේ විශාලත්වය හා ඉන් පරිසරයට ඇතිවිය හැකි අව බලපෑම් පදනම්කර ගනු ලැබේ. මධ්‍යම පරිසර අධිකාරිය සහ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය විසින් 1993 වසරේ සිට නියම කරන ලද ව්‍යාපෘති සඳහා පාරිසරික ගැටළු තක්සේරුකරණ වාර්තා සමාලෝචනය කිරීම හා අනුමත කිරීම සිදු කරන අතර ඔවුන් ඒ සඳහා විධිමත් තාක්ෂණික විශේෂඥතාවක් හා ධාරිතාවක් ගොඩ නගා ගෙන ඇත. පාරිසරික කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ කොටසක් විය යුතු බව AIIB විසින් මෙන්ම ජාතික පරිසර පනත මගින් ද නියම කර ඇත. පාරිසරික කළමනාකරණ සැලැසුම් ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය, මධ්‍යම පරිසර අධිකාරිය සහ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය යන දෙපාර්ශවයම විසින් අධීක්ෂණය කරනු ලබයි.

කෙසේ වුවද, මෙය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයේදී සැලකිය යුතු මට්ටමේ දුර්වලතා හමු වේ. මේ නිසා ස්වභාවික හා මිනිස් පරිසරය යන දෙකෙහිම ගැටළු පැන නැගිය හැකි වේ. ඒවා නම්,

I. පාරිසරික ගැටළු තක්සේරුකරණ වාර්තා පමණක් පොදු ජනයාට නිරාවරණය වන අතර පූර්ව පාරිසරික පරීක්ෂණ වාර්තා හෝ කමිටුව මඟින් ගන්නා තීරණ පොදු ජනතාවට දැන ගැනීමට නොලැබේ. මේ හේතුව නිසා බොහෝ වගකිව යුතු පාර්ශව හා ආයතන, ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ ක්‍රියාවලියේ තොරතුරු නොදනී.

II. බොහෝ විට ව්‍යාපෘති යෝජක විසින් ව්‍යාපෘතිය සඳහා අදාල වන ආයතන වෙත ප්‍රමාණවත් තරමේ තොරතුරු ලබා නොදෙන අතර ප්‍රමාණවත් තරමට පාරිසරික ගැටළු තක්සේරුකරණ වාර්තා ද හෙළි නොකරයි. මේ නිසා ව්‍යාපෘතියට අදාල පාර්ශවවලට පාරිසරික ගැටළු තක්සේරුකරණ වාර්තාව තේරුම් ගැනීමට හා අර්ථ දැක්වීමට නොහැකි වෙයි. පාරිසරික ගැටළු තක්සේරුකරණ වාර්තා පිළිබඳ මහජන මතවිමසුම් සිදුකිරීම මඟින් මෙම දුර්වලතා අර්ධ වශයෙන් මඟහරවා ගත හැක. මෙවැනි රැස්වීමකදී ව්‍යාපෘති යෝජක හා පාරිසරික බලපෑම් තක්සේරු කරනු ලබන විශේෂඥයන් විසින් ව්‍යාපෘතියේ තිබෙන ප්‍රධාන ලක්ෂණ ද, එවායින් ඇතිවන පාරිසරික හා සමාජයීය බලපෑම් ද, එම බලපෑම් මඟ හරවා ගැනීම හෝ අවම කර ගත හැකි අයුර පිළිබඳව ද, දේශීය භාෂාවකින් පැහැදිලි කර දෙනු ලැබේ. කෙසේ වුවද, මෙම බලපෑම් පිළිබඳ වූ තීරණාත්මක තොරතුරු වලින් බොහෝමයක් විනිවිදභාවයකින් යුතුව හෙළි නොකෙරෙන නිසා  මෙය ක්‍රියාවට නැංවීමෙහි ද දුර්වලතා ඇත.

*නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී මෙම දුර්වලතා මඟහරවා ගැනීම සඳහා අර්ථවත් මහජන උපදේශනය හා සහභාගිත්වය, ව්‍යාපෘති තොරතුරු නිරාවරණය කිරීම, වගකිව යුතු ආයතන මඟින් අර්ථාන්විත උපදෙස් ලබා ගැනීම යන දේ සිදු කළ යුතුය. එවැනි උපදෙස් ලබා ගැනීම, ව්‍යාපෘති සැලසුම්කරණ අවධියේ පටන් ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම යන අවධි දක්වාම වරින් වර සිදු කළ යුතුය.*

III. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ජාතික පරිසර පනතෙහි රෙගුලාසි සමග එකඟ නොවුනහොත් දූෂණය, ස්වභාවික සම්පත් වෙත හානි පැමිණීම හා සෞඛ්‍ය ගැටළු ඇති කිරීම, ප්‍රජාව අතර නොසන්සුන්බව හා ආතතිය ඇති කිරීම වැනි සෘණාත්මක බලපෑම් ඇති විය හැකිය.

IV. ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවෙන අතරතුර, නිර්දේශිත සංක්‍රමික ක්‍රියාමාර්ග සත්‍ය වශයෙන් ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය දුර්වලය. මෙය බොහෝ විට ජාතික පරිසර පනත සහ පාරිසරික හා සමාජයීය ආරක්ෂණ ක්‍රියාවලි බිඳ දැමීමට හේතු වේ.

*එම නිසා iii සහ iv කරුණු සඳහා, පරිපූර්ණ පාරිසරික සහ සමාජයීය කළමනාකරණ සැලසුමක් ද සමගින් මෙම පනත් වලින් බලාත්මක කර ඇති අවශ්‍යතා ක්‍රියාවට නැංවීමට බලය සහ වගකීම පවරන ලද ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සහිත ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් පිහිටුවීම මගින් ප්‍රතිකර්ම යෙදිය යුතුවේ.*

### 3.3.2 ඉඩම් අත්පත් කරගැනීමට අදාළ රෙගුලාසි වල අඩුලුහුඩුතා

ඉඩම් අත්පත් කරගැනීමේ පනත වැනි නීතිමය ප්‍රඥප්ති සහ වෙනත් එවන් විධිවිධාන, රෙගුලාසි සහ ඒවායේ සංශෝධන ඉඩම්, ගොඩනැගිලි සහ බෝග වල නීත්‍යානුකූල හිමිකරුවන් වෙත එම වත්කම් වෙනුවෙන් වන්දි ගෙවීම උදෙසා පනවා තිබේ. මෙම පනත් වල, නිත්‍යානුකූල හිමිකරත්වයක් නොමැතිව වසර ගණනාවක් ඉඩම් පරිභෝජනය කරන්නන් හට පිළියම් ක්‍රමවේදයක් නොමැත. මෙය සිදු විය හැකි අඩුලුහුඩුතාවක් බව හඳුනා ගෙන ඇති අතර එය මනා සමාජයීය කළමනාකරණ සැලසුමක් මඟින් විසදිය යුතු වේ.

මෙම නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම අඩංගු නොවේ. මෙයට හේතුව වන්නේ යෝජිත ස්ථාන දැනටමත් නායයෑමේ අධි අවදානම් ගණයට වැටෙන බැවින් ඒවා ඉදිරි සංවර්ධන කටයුතු සඳහා සුදුසු නොවීමයි. මේ නිසා මෙම නිවාස හෝ ව්‍යුහයන් වාසයට නුසුදුසු වන අතර ඒවායේ ජීවත් වන්නන්ට ඉන් ඉවත් වන ලෙස දැනුම් දී ඇත. මේ කාරණා යටතේ දැනටමත් ඉඩම් වල මිල නැති වී ගොස් ඇත.

වර්තමානය වන විට, වෙනත් නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති සඳහා ඉඩම් අයිතිකරු හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනය අතර, කැමැත්ත ලබා දීම/ අකමැත්තක් නොමැති බව දැක්වෙන රාජකාරිමය එකඟතාවයක් අත්සන් කෙරේ. ඉන් ව්‍යාපෘතියට වැඩබිම වෙත ප්‍රවේශ වීමට, වැඩෙහි යෙදීමට, අවම කිරීමේ ව්‍යුහ ගොඩනැගීම යනාදියට අවසර හිමිවේ. එසේ වුවද, මෙම හානිපූරණ වැඩපිළිවෙලට අනාගතයේදී මෙම ඉඩම් වල ඉදිකිරීමේ කටයුතු සිදු කිරීමට ඉඩ ලබා නොදීම, ඉදිකිරීමේ කටයුතු අතරතුර සමහර ගොඩනැගිලි ව්‍යුහ කඩා දැමීමෙන් ඒවා අහිමි වී යාම, ආර්ථිකමය ලෙස ඉඩම් භාවිතයට ගැනීමට නොහැකි වීම ආදිය මනාව ආවරණය වී නොමැත.
මෙය අඩුලුහුඩුතාවයක් ලෙස හැඳින්විය හැකිය. පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලස්මේදී වැඩිදුරටත් සකච්ඡා කළ යුතු අතර මෙය අදාල අංශ වලදී පහත සාකච්ඡා කෙරේ.

### 3.3.3 ස්ව කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමට අදාළ රෙගුලාසි වල අඩුලුහුඩුතා

වර්තමාන නායයෑම් අවම කිරීමේ ක්‍රියාවලියේ ස්ව කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීම් ඇතුලත් නොවේ. මෙයට හේතුව වන්නේ අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා අනුමත කර ඇති ස්ථාන නායයෑමේ අධි අවදානමක් සහිත ස්ථාන ලෙස හඳුනා ගෙන ඇති නිසා ඒවායේ වාසය කළ ජනතාවට එතැනින් ඉවත් වී වෙනත් ස්ථානයක පදිංචි වන ලෙස රජය මඟින් දැනුම් දී තිබීමයි. මේ සඳහා අවතැන්වූවන්ට විකල්ප දෙකක් යටතේ නැවත පදිංචි කිරීමේ අවස්ථාව ලබා දේ. I) රුපියල් මිලියන 1.6ක වන්දි මුදලක් (මිලියන 0.4ක් ඉඩම සඳහා හා මිලියන 1.2ක්

නිවසක් සෑදීම සඳහා) II) රජය මඟින් ඉදි කල ආපදා ප්‍රත්‍යස්ථ නිවසක් ලබා දීම. සමහරක් ස්ථාන වල සිටි ජනතාව රජය මඟින් මෙසේ ලබාදෙන පැකේජය පිළිගෙන හෝ තමන්ගේම වාසස්ථාන සොයා ගෙන එම ස්ථාන වලින් ඉවත් වී තිබෙන අතර ලැබෙන වන්දි මුදල ප්‍රමාණවත් නොවන බව පවසා ඇතැමුන් තවමත් අවදානම් සහිත ස්ථාන වලම ජීවත් වෙයි. මෙම ව්‍යාපෘතිය යටතේ අවම කිරීමට තෝරා ගෙන ඇති ඇතැම් ස්ථාන වලද මෙම තත්වය පවතී. මෙම හේතුව නිසා, මෙම ව්‍යාපෘතියේ නැවත පදිංචි කිරීම් හා සම්බන්ධ වෙනත් පැත්තක් තිබෙන බැවින් මෙම ව්‍යාපෘතිය යටතේ අවම කිරීමට තෝරා ගෙන ඇති ස්ථාන වල සිටින නායයාමේ අවදානමට ගොදුරු වූවන් සඳහා, දැනට පවතින ආපදා හේතුවෙන් ඉවත් කිරීමේ සහ වෙනත් ස්ථාන වල පදිංචි කිරීමේ ප්‍රවේශය හේතුවෙන් නිර්මාණය වී ඇති ගැටළු ප්‍රවේශම් සහගත ලෙස සලකා බැලිය යුතුය.

ESS2 එනම්, **ණය ලබා ගන්නන් මඟින් නැවත පදිංචි කිරීමේ සැලසුම්කරණ රාමුවක් සකස් කළ යුතු අතර එය බැංකුවට වියුක්ත ලියවිල්ලක් ලෙස හෝ ඇගයුම් වාර්තාවේ ඇමුණුමක් ලෙස හෝ අනන්‍යව හඳුනාගත හැකි අංගයක් ලෙස වාර්තාවට එකතු කර බැංකුව වෙත ලබා දිය යුතුය** යන්න ආවරණය කිරීම සඳහා මෙම ව්‍යාපෘතියට නැවත පදිංචි කිරීමේ සැලසුම්කරණ රාමුවක් AIIB මඟින් ඉල්ලා ඇත ***(ව්‍යාපෘතියට නැවත පදිංචි කිරීමේ සැලසුම්කරණ රාමුවක් පිළියෙළ කර ඇත).***

# 4 වන පරිච්ඡේදය- පාරිසරික සහ සමාජයීය බලපෑම් හා අවම කිරීමේ ක්‍රම පිළිබඳ සාමාන්‍ය තක්සේරුව

## 4.1 පරිසරික හා සමාජයීය ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා මූලික තේරීම් හා එහි විෂය පථය

ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පාරිසරික හා සමාජයීය සමාලෝචනයේ මට්ටම පිළිබඳව සොයා ගැනීම සඳහා මූලික තේරීම සිදු කරනු ලබයි. ජාතික ආරක්ෂණ විධිවිධාන හා AIIB හි සුරැකිතා විධිවිධාන වලට අනුව පාරිසරික සහ සමාජයීය කළමනාකරණ සැලැස්මක් සෑදීම සඳහා, කෙතරම් දුරකට තක්සේරුකරණය සිදුකළ යුතු ද යන්න හඳුනා ගැනීම සඳහා මෙම මූලික තේරීම භාවිතා කරයි. මෙම මූලික තේරීම i) ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල ස්වභාවය හා ප්‍රමාණය අනුව ii) ව්‍යාපෘතිය හේතුවෙන් ඇතිවිය හැකි පාරිසරික හා සමාජයීය බලපෑම් iii) ව්‍යාපෘතියට මුහුණ දීමට සිදුවිය හැකි සැලකිය යුතු බලපෑම් හෝ ව්‍යාපෘතියට බලපෑ හැකි අවදානම් තත්ත්ව iv) පාරිසරික හා සමාජීය කළමනාකරණ සැලැසුම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන ආයතනික සම්පත් තීරණය කිරීම හා එහි නිරාවරණ මට්ටම යන කරුණු වල එකතුවකි.

ජාතික පාරිසරික රෙගුලාසි සහ AIIB බැංකුවේ පාරිසරික හා සමාජයීය ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රථමයෙන් සලකා බැලීමෙන් ද ජාතික පරිසර පනතේ සහ AIIB හි පාරිසරික හා සමාජයීය ආරක්ෂණ ප්‍රතිපත්ති වලට අනුකූලව ව්‍යාපෘති යෝජනාපත්‍ර සමාලෝචනය කරමින් ද මූලික තේරීම සිදු කරන ලදී. තේරීම් හා විෂය පථ සැකසුම් ක්‍රියාවලියේදී NBRO මඟින් AIIB වෙත ලබා දෙන ලද ව්‍යාපෘති යෝජනාව පිළිබඳව ඉතා ගැඹුරින් අධ්‍යයනය කරන ලදී. මෙම ව්‍යාපෘතියේ ස්වභාවය හඳුනා ගැනීම, ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල ස්ථාන දැන ගැනීම, ව්‍යාපෘතිය මඟින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ දැන ගැනීම, ව්‍යාපෘතිය නොමැතිව දැනට මිනිසුන් මත හා ස්වභාවික පරිසරය මත පවතින අවදානම පිළිබඳ දැන ගැනීම යන කාරණා සඳහා NBRO හි නායයෑම් අධ්‍යයන හා අවදානම් කළමනාකරණ අංශයේ ව්‍යාපෘති කණ්ඩායම සමඟ සාකච්ඡා පවත්වන ලදී.

විෂය පථය නිර්මාණය කිරීමේදී NBRO සතුව දැනට පවතින තොරතුරු මත පාරිසරික සහ සමාජයීය සංවේදීතාවය සමාලෝචනය කිරීම, ඇතැම් ස්ථාන නැරඹීමට යාම, ස්ථානවල පිහිටීම දැක්වෙන සිතියම් ගූගල් ඡායාරූප, වන සංරක්ෂණ සිතියම වැනි සිතියම් සමඟ එකිනෙක මත තබා අධ්‍යයනය කිරීම වැනි ක්‍රම භාවිතා කරන ලදී. එමෙන්ම මෙම ක්‍රියාවලියේදී මධ්‍යම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී දෙපාර්තමේන්තුව වැනි පරිසරය පිළිබඳ වගකිව යුතු ආයතන සමඟ සාකච්ඡා සිදු කළ අතර එහිදී ව්‍යාපෘති ක්‍රියාකාරකම් වැටෙන පරිසර සංවේදී මට්ටම්, පාරිසරික රෙගුලාසි අවශ්‍ය කරන මට්ටම් වැනි කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී. (රත්නපුර දිස්ත්‍රික්කයේ සමහරක් වගකිවයුතු ආයතන වලින් මේ වන විටත් උපදෙස් ලබා ගෙන තිබේ).

ව්‍යාපෘති ක්‍රියාකාරකම් හා ඒවායින් ඇතිවන බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (CRIP) සහ විදේශ ආධාර මත අස්ථාවර බෑවුම් මත සිදු කෙරෙන වෙනත් අවම කිරීමේ ව්‍යාපෘති ද අධ්‍යයනය කරන ලදී. සිදු කිරීමට යනු ලබන අවම කිරීමේ ක්‍රියාවන්හි විශාලත්වය, බරපතල බව හා එහි ප්‍රමාණය, බලපෑම් නැවත හැරවිය හැකි බව,කෙටි කාලීන හා දිගු කාලීන බලපෑම් යන ඉදිරියේදී ඇති විය හැකි බලපෑම් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට අවශ්‍ය තොරතුරු සඳහා සැලසුම් කිරීමේ කණ්ඩායමේ විසින් උපදෙස් ලබා ගන්නා ලදී.

## 4.2 AIIB හි පාරිසරික හා සමාජයීය ආරක්ෂණ ප්‍රතිපත්ති වලට අනුව ව්‍යාපෘතිය වර්ගීකරණය කිරීම

ව්‍යාපෘතියේ ස්වභාවය සමාලෝචනය කිරීමෙන් අනතුරුව AIIB හි ජ්‍යෙෂ්ඨ පාරිසරික විශේෂඥයෙකු මෙම ව්‍යාපෘතිය B වර්ගයට ගැනෙන බවට නියම කරන ලදි. මේ සඳහා ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් සිදු වන පාරිසරික හා සමාජයීය බලපෑම සැලකිල්ලට ගන්නා ලද අතර එහිදී සලකන ලද කාරණා වන්නේ a) සාමාන්‍ය පාරිසරික සහ සමාජයීය බලපෑම් ස්ථානීය වන අතර ඒවා ආපසු හැරවිය නොහැක b) බලපෑම් අවම කිරීමට හා ආරක්ෂා කිරීමට දියුණු ඉංජිනේරු තාක්ෂණික ක්‍රම ඇත c) පාරිසරික හා සමාජයීය ගැටළු සඳහා ආයතනය තුලම විශේෂඥ සහ කළමනාකරණ ධාරිතාවක් පවතී d) ව්‍යාපෘතිය මූලික කර ගත් විශාල පරිමාණයේ නැවත පදිංචි කිරීමක් මෙම ව්‍යාපෘතියේ නොමැත e) වනජීවී හෝ වනාන්තර, පාරිසරිකව සංවේදී කලාප යන ඒවා තුල හෝ ඒවායේ නීතිමය සීමා ආශ්‍රිතව පිහිටා ඇති ව්‍යාපෘති ස්ථාන නොමැත f) ජාතික පාංශු සංරක්ෂණ රෙගුලාසි වල නිර්දේශ වලට සෘජුවම අනුකූල වන බැවින් ව්‍යාපෘතිය පාරිසරිකව යහපත් වේ g) රජය හා වෙනත් ආයෝජන බැංකු මඟින් සිදු කරන ලද මීට සමාන ව්‍යාපෘති වලින් දේශීය අත්දැකීම් ලබා තිබීම යන ඒවායි.

**B වර්ගයේ ව්‍යාපෘති සඳහා බැංකුවේ අර්ථකථනය:** ව්‍යාපෘතියක් B කාණ්ඩය යටතේ වර්ගීකරණය කරනු ලබන්නේ, එයින් ඇතිවන පාරිසරික හා සමාජයීය බලපෑම් අවම වූ විට; බලපෑම් පෙර නොතිබූ ඒවා නොවීම; ඒවායින් කිහිපයක් ආපසු හැරවිය නොහැකි වීම; ඒවා ව්‍යාපෘති ප්‍රදේශයට පමණක් සීමා වන විට සහ ක්‍රියාවට නැංවීමේ දී යහ භාවිතයන් සමඟ සාර්ථකව කළමනාකරණය කර ගත හැකි වීම යන මේ අවස්ථා වලදීය. සේවාදායකයා විසින් පාරිසරික හා සමාජයීය ගැටළු පිළිබඳව මූලික සමාලෝචන වාර්තාවක් සැපයිය යුතු බවට බැංකුව ඉල්ලීමක් කරයි. මෙම සමාලෝචනය පදනම් කරගෙන, ව්‍යාපෘතියේ කොටසින් කොටස ගෙන පාරිසරික හා සමාජයීය අවදානම් හා ඇතිවිය හැකි බලපෑම් පිළිබඳව තක්සේරුවක් කිරීම සඳහා භාවිතා කළ යුතු ක්‍රමවේද මොනවාද යන්න බැංකුව හා සේවාදායකයා එක්ව තීරණය කරනු ලබයි. යම් අවස්ථා වලදී පාරිසරික තක්සේරු වාර්තාවක් හෝ ඒ හා සමාන ක්‍රියාමාර්ගයක් අවශ්‍ය බව බැංකුව මඟින් තීරණය කරනු ඇත. තක්සේරු කිරීමේ ක්‍රමවේදය ව්‍යාපෘතියෙන් ව්‍යාපෘතියට වෙනස් වන අතර එය පාරිසරික හා සමාජයීය බලපෑම් ඇගයීමෙහි A වර්ගීකරණයට වඩා කුඩා වේ. A ගනයට වැටෙන ව්‍යාපෘතියකදී මෙන්ම, මෙම තක්සේරු වාර්තාවෙන් ද ව්‍යාපෘතිය මඟින් ඇතිවිය හැකි ධනාත්මක හා සෘණාත්මක බලපෑම් හා එම බලපෑම් මඟ හරවා ගැනීමට, අවම කිරීමට හෝ වන්දි ලබා දීම සඳහා ගත හැකි නිර්දේශ මෙන්ම ව්‍යාපෘතියේ පාරිසරික හැකියාව වැඩිදියුණු කර ගත හැකි ආකාරය පිළිබඳව අධ්‍යයනය කරයි.

## 4.3 පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් තිබීමේ අවශ්‍යතාවය

ජාතික පරිසර පනතට අනුව නියම කරන ලද ලෙස සඳහන් වන ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය ක් මඟින් පාරිසරික යෝග්‍යතා වාර්තාවක් අවශ්‍ය වේ. මෙහිදී ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය මඟින් තීරණය කරනු ලබන ආකාරය මත සේවාදායකයා මඟින් මූලික පාරිසරික අධ්‍යයනයක් (IEE) හෝ පාරිසරික බලපෑම් තක්සේරුවක් (EIA) සිදු කළ යුතුය. ජාතික පරිසර පනතෙහි නාయයෑම් අවම කිරීමේ ව්‍යාපෘති, නියම කරන ලද ලැයිස්තුවෙහි ලා නොසැලකේ. එම නිසා නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් තක්සේරුකරණ ක්‍රියාවලිය සෘජුවම අදාල නොවේ. නමුත් වනාන්තර/ වනජීවී හෝ ස්වභාවික සංරක්ෂණ හෝ නීතිමය මායිම් වල පිහිටා ඇති ස්ථාන සඳහා පාරිසරික තක්සේරුවක් අවශ්‍ය වේ. (උදා: වනාන්තර හෝ වනජීවී සංරක්ෂිතයක හෝ ඉන් සැතපුමක් ඇතුලත පිහිටි) එවැනි අවස්ථාවක ව්‍යාපෘති අනුමත කරනු ලබන ආයතනය මඟින්

යෝග්‍යතා වාර්තාවක් ලබා ගත යුතුය. නායයෑම් අවම කිරීමේ සමහරක් ස්ථාන ද ඉහත සඳහන් කළ ප්‍රදේශ වල පිහිටා තිබිය හැක. ජාතික පරිසර පනත ක්‍රියාත්මක කිරීම සඳහා නීතිමය බලය ඇත්තේ මධ්‍යම පරිසර අධිකාරියටයි. සියලුම ව්‍යාපෘතිවල, ව්‍යාපෘති වාර්තා සමඟ මූලික තොරතුරු ඇතුලත් ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කරන ලෙස මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඉල්ලීමක් කළ හැක. අදාල ලියකියවිලි සමාලෝචනය කිරීමෙන් පසුව මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ව්‍යාපෘතිය කරගෙන යාම සඳහා අනුමැතිය දීම හෝ ස්ථානීය වශයෙන් IEE හෝ EIA වාර්තාවක් කරන ලෙස ඉල්ලීමක් කළ හැක. දැනටමත් අස්ථාවර වී ඇති බෑවුම් වල පාංශු සංරක්ෂණ රෙගුලාසි වලට අනුකූලව සිදු කරනු ලබන ව්‍යාපෘති සඳහා, ව්‍යාපෘති වාර්තාව සමඟ මූලික තොරතුරු ඇතුලත් ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කළ පසු ඊට සෘජු අනුමැතිය ලබා ගැනීමේ හැකියාව ඇත.

AIIB හි ප්‍රධාන සුරැකිතා ප්‍රතිපත්ති වලට අනුව සියලුම ස්ථාන වල කරනු ලබන ඉදිකිරීම් කටයුතු හේතුවෙන් ස්වභාවික හා මිනිස් පරිසරය යන දෙකටම බලපෑම් එල්ල වන හෙයින් සියලුම ව්‍යාපෘති සඳහා ESS1 අදාල වේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගෙන යෑමේදී නිවාස, සේවා හෝ යටිතලපහසුකම් නැවත නව ස්ථානයකට ගෙන යාමට සිදු වුවහොත් ESS2 අවශ්‍ය වේ. මෙම කිසිදු ස්ථානයක ආදිවාසි ජනයා ජීවත් නොවන බැවින් ESS 3 අදාල නොවේ **(වැඩිදුර තොරතුරු සඳහා 3.1.8 කොටස බලන්න)**

## උප ව්‍යාපෘති සඳහා තේරීම් කටයුතු

මෙම අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා තෝරා ගෙන ඇති ස්ථාන වන්නේ විශාල ප්‍රජා වෙත ද, මහාමාර්ග, දුම්රිය මාර්ග හා සේවා වැනි යටිතලපහසුකම් වලට ද අධික අවදානමක් ඇති කරනු ලබන ස්ථාන සහ පාසැල්, බස් නැවතුම්පොළවල්, ආගමික ස්ථාන හෝ සංස්කෘතිකමය ස්ථාන වැනි මනුෂ්‍ය ජීවිත වලට අධික අවදානමක් පවතින, පොදු ස්ථානයි.

පහත සඳහන් කරුණු පදනම් කරගෙන මෙම ස්ථාන තෝරා ගනු ලැබේ. I) සියලුම ස්ථාන වලට පොදු කරුණු. උදා: නායයෑම් අවදානම් මට්ටම, සෘජු හා වක්‍ර අවදානම් තත්ත්වය, ව්‍යුහමය ක්‍රමවේද මගින් අවම කිරීමේ හැකියාව, බජටයට අනුකූල වීම ii) බොහෝ විට ස්ථානීයව විශේෂිත වන අනෙක් කාරණා උදා: පුළුල් ආර්ථිකමය හා සමාජයීය ප්‍රතිලාභ, ප්‍රජාව මඟින් පිළිගැනීම, පාරිසරික සංවේදීතාවයයනාදිය. නිර්මාණකරණ විශේෂඥයන්, ප්‍රතිසම්පාදන විශේෂඥයන්, පාරිසරික හා සමාජයීය විශේෂඥයන්, නගර සැලසුම් ශිල්පින් වැනි විශේෂඥ කණ්ඩායමක් එක්ව ව්‍යාපෘතිය පටන් ගැනීමට පෙර ස්ථාන පිරික්සීමේ සැසිවාර පවත්වනු ලැබේ. මුල් ස්ථාන 27 තෝරා ගැනීමේ ක්‍රියාවලිය දැනටමත් නිමා වී ඇති අතර ඒවායේ නිර්මාණකරණ හා ප්‍රතිසම්පාදන කටයුතු කෙරෙමින් පවතී.

**වගුව 5: උප ව්‍යාපෘති පිරික්සීම සඳහා සලකනු ලබන කරුණු**

| | කරුණ | අවශ්‍යතාවය |
|---|---|---|
| 1 | **ආපදා අවදානම අවම කිරීම** | **විය යුතු වන්නේ** |
| | මනුෂ්‍ය ජීවිත | ඉතා වැඩි |
| | යටිතල පහසුකම් හා සේවා | වැඩි/ඉතා වැඩි |
| | පරිසරය | මධ්‍යම/ වැඩි |
| 2 | **පද්ධතියේ තිරසාර බව/ ප්‍රත්‍යස්ථ බව** | **විය යුතු වන්නේ** |
| | ස්ථානීයමය (සමාජයීය/ ආර්ථිකමය/ ආගමික/ සංස්කෘතික) | ඉතා වැඩි/වැඩි |
| | ප්‍රදේශයේ තිරසාර සංවර්ධනය සඳහා ඇති දායකත්වය | ඉතා වැඩි/වැඩි |
| | දේශගුණික වෙනස් වීම් හා වෙනත් කාලගුණික වෙනස් වීම් සඳහා මුහුණ දීමට අවම කිරීමේ ක්‍රම වලට ඇති හැකියාව | ඉතා වැඩි/වැඩි |
| | ප්‍රදේශයේ සමාජ-ආර්ථිකමය/ සංස්කෘතික තිරසාර බවට දක්වන දායකත්වය | ඉතා වැඩි/වැඩි |
| | නැවත පදිංචි කිරීමේ අවශ්‍යතාවය අවම කිරීම | ඉතා වැඩි/ වැඩි/ මධ්‍යම |

| | | |
|---|---|---|
| | **ව්‍යාපෘතියේ බලපෑම්, වියදම් හා බාධක (සෘණාත්මක)** | |
| 1 | **පාරිසරික බලපෑම්** | **විය යුතු වන්නේ** |
| | ඉදිකිරීම් අවස්ථාවේදී | අඩු/මධ්‍යම |
| | භූමිය, ජලය, හා වනාන්තර යන සම්පත් මත ඇතිවන දීර්ඝ කාලීන බලපෑම | අඩු |
| | ස්වභාවික සම්පත් සඳහා සිදුවන හානි (වනාන්තර, භූමිය, ජලය) | අඩු/මධ්‍යම |
| | පොදු යටිතලපහසුකම් සඳහා සිදුවන හානි | අඩු |
| 2 | **සමාජ බලපෑම් (ව්‍යාපෘතියට අදාලව)** | **විය යුතු වන්නේ** |
| | ව්‍යාපෘතිය සඳහා සමාජ ප්‍රතිරෝධය | අඩු |
| | අවතැන් වීම (නැවත පදිංචි කිරීම)/ ඉවත් වීම | අඩු |
| | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නිසා ප්‍රජාව තුල ඇති වන පීඩනය | අඩු |
| | සංස්කෘතිකමය පුරාවිද්‍යාත්මක බලපෑම් | අඩු |
| 3 | **ආයෝජන(ව්‍යාපෘතියට අදාලව)** | **තිබිය යුතු වන්නේ** |
| | සෘජු ව්‍යාපෘති වියදම | ආර්ථික ශක්‍යතාව ඇතුලත |
| | යටිතලපහසුකම් සංවර්ධන වියදම | ආර්ථික ශක්‍යතාව ඇතුලත |
| | ක්‍රියාත්මක කිරීමේ හා නඩත්තු වියදම් | ආර්ථික ශක්‍යතාව ඇතුලත |
| | වෙනත් වියදම්- නැවත පදිංචි කිරීමේ පහසුකම්, ඉවත්වීම් | අඩු ආර්ථිකමය ශක්‍යතාවක් |
| | වන්දි වියදම් | අඩු ආර්ථිකමය ශක්‍යතාව ක් |
| 4 | **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇති වෙනත් ගැටළු** | **තිබිය යුතු වන්නේ** |
| | තිබෙන අයවැය මත අවම කිරීමේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ හැකියාව | ශක්‍යතාවය |
| | සම්පත් හිඟ වීම(ඉඩම්, මිනිස් සම්පත්. තාක්ෂණය ලබා ගැනීම) | අඩු |
| | පාරිසරික/ සමාජයීය බලපෑම් අවම කිරීමට ඇති හැකියාව | වැඩි |
| | ආයෝජන ව්‍යාපෘතිය යටතේ පවතින ස්ථාන සැලකිල්ලට ගැනීම | සැලකිල්ලට ගෙන නොමැත |

## 4.4 විෂය පථ සැකසීම

විෂය පථ සැකසීම ව්‍යාපෘතිය මුළුල්ලේම කර ගෙන යන අතර ප්‍රධාන වශයෙන් සැලසුම් කිරීම, ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම යන අවස්ථා වල පහත සඳහන් මූලික අංශ වෙත අවධානය යොමු කරනු ලැබේ. එනම් a) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ඇති වන පාරිසරික හා සමාජයීය සංවේදිතාවයන්ගේ ස්වභාවය හා ඒවායේ ප්‍රමාණය b) වගකිව යුතු ආයතන වල මැදිහත් වීම හා අවශ්‍ය කරන උපදේශන සේවය c) සලකා බැලීමට අවශ්‍ය පාරිසරික හා සමාජයීය බලපෑම් විශ්ලේෂණ මට්ටම d) අවම කිරීමට අවශ්‍ය වන සැලකිය යුතු තරමේබලපෑම් e) තක්සේරු කිරීමේදී යොදා ගත හැකි විශේෂඥ දැනුම හා භාවිතා කළ හැකි මෙවලම් f) ව්‍යාපෘතියේ පරාසය ඇතුලත භාවිතා කළ හැකි අවම කිරීමේ ක්‍රියාමාර්ග

විෂය පථය නිර්ණය කිරීමේ ක්‍රියාවලිය සඳහා AIIB හි හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ආයතනයේ විශේෂඥයන්ගෙන් යුතු කණ්ඩායමක් සහභාගී වේ. ව්‍යාපෘතියට අදාල ලියකියවිලි, රටෙහි පාරිසරික ව්‍යවස්ථාපිත ක්‍රමවේදය, මැදිහත් වන වගකිව යුතු ආයතන, අනුමැතිය සඳහා අවශ්‍ය වන දේ යනාදිය ගැඹුරින් අධ්‍යයනය කෙරේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ආයතනය හා අනෙකුත් වගකිව යුතු ආයතන අතර උපදේශන හුවමාරු වේ. සමහරක් ස්ථාන පරීක්ෂා කළ විශේෂඥ කණ්ඩායම් විසින් එම ස්ථාන සඳහා AIIB ආයෝජන

යටතේ අවම කිරීමේ ක්‍රියාවලි කළ යුතු බවට නිර්දේශ කරන ලදී. මෙම යෝජිත ස්ථාන සාම්ප්‍රදායික නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිවල පවතින පාරිසරික හා සමාජයීය ස්වභාවයන් පෙන්නුම් කරයි. පාරිසරික හා පාරිසරික හා සමාජයීය තක්සේරුකරණ විෂය පථය නිර්ණය කිරීමේ දී සහ සමාජයීය කළමනාකරණ සැලසුම් රාමු සැදීමේදී ස්ථාන පරික්ෂාව, වගකිව යුතු ආයතන වල උපදේශන ලබා ගැනීම, මුහුණට මුහුණ කරනු ලබන සම්මුඛ පරීක්ෂණ සහ විශේෂඥ තීරණ යන මේ ක්‍රමවේද බෙහෙවින් ප්‍රයෝජනයට ගන්නා ලදී.

විෂය පථය නිර්ණය කිරීමේ ක්‍රියාවලියේදී පහත සඳහන් කරුණු විශේෂයෙන් මතුකර දක්වන ලදී.

i. ව්‍යාපෘති ක්‍රියාවන් ආපදා අවම කිරීම සහ ජාතික හා අන්තර්ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති, රාමු හා සැලසුම් සැදීම යන කාරණා සඳහා වැදගත් වේ.
ii. අවම කිරීමේ ක්‍රමවේදය සඳහා තෝරා ගත් ස්ථාන 147 වඩාත්ම අවදානම් ස්ථාන වන අතර එම ස්ථාන වල මහාමාර්ග සඳහා තිබෙන අවදානම, නගර හා යටිතලපහසුකම් සඳහා තිබෙන අවදානම, පාසැල් ගොඩනැගිලි වලට හා පාසැල් සිසුන්ට ඇති බලපෑම, සංස්කෘතික හා ආගමික ස්ථාන වලට ඇති බලපෑම සහ නිවස හා එහි වාසය කරන්නන්ට ඇති කරනු ලබන බලපෑම යන විවිධ ආකාරයේ අවදානම් තත්ත්ව දැක ගත හැකිය.
iii. මෙම අවම කිරීම් හේතුවෙන් මහාමාර්ග, ජනතාව සහ යටිතලපහසුකම් කෙරෙහි වඩාත් ප්‍රතිලාභදායක වේ.
iv. ව්‍යාපෘති ස්ථාන වලට සාපේක්ෂව විකල්ප විශ්ලේෂණය කිරීම- මෙම ව්‍යාපෘතිය නායයෑම් මඟින් ඇති කරනු ලබන අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියක් වන බැවින් අවම කිරීමේ කටයුතු සිදු කළ යුතු වන්නේ අවදානමක් පවතින ස්ථාන ලෙස හඳුනාගත් ස්ථාන වල පමණි. එම නිසා ව්‍යාපෘතිය සඳහා විකල්ප ස්ථාන සලකා බැලිය නොහැක. කෙසේ වුවද, වැඩි අවම කිරීමේ බලපෑමක් සඳහා වඩාත්ම සුදුසු ඉංජිනේරු තාක්ෂණික ක්‍රම සලකා බැලිය හැකිය.
v. ව්‍යාපෘතියේ ප්‍රමාණය, ව්‍යාපෘතියෙන් බලපෑමක් ඇති කරනු ලබන ප්‍රදේශය තුල පවතින පාරිසරික හා සමාජයීය සංවේදී කොටසේ වල ස්වභාවය හා ප්‍රමාණය මත ව්‍යාපෘතියේ සමාජයීය හා පරිසරික සංවේදීතාවය වෙනස් වේ.
vi. බොහෝ ඍණාත්මක බලපෑම් (පාරිසරික හා සමාජයීය) ඇති වන්නේ ඉදිකිරීම් අදියරේදීය.
vii. ඉදිකිරීම් අදියරේදී ඇති වන බලපෑම් බොහෝ සෙයින් ස්ථානීය වන අතර ස්ථානීය වශයෙන් ඇති බලපෑම් ඉහල වන අතර මනා පාරිසරික කළමනාකරණ සැලසුම්කරණයක් මඟින් ඒවා අවම කර ගත හැකිය.
viii. ඉදිකිරීම් අදියරේදී සිදු වන ජල දූෂණය පාලනය කිරීමට, බෑවුම් ඛාදනය වීම පාලනය කිරීමට සහ අවසාදිත සහිත ජලය ගලා යාම (සියලුම ස්ථාන වලට පොදු ප්‍රධාන දූෂණ ආකාර දෙක) පාලනය කිරීමට විධිමත් අවම කිරීමේ ක්‍රමවේද අවශ්‍ය වේ.
ix. විරල වුවත් යම් අවස්ථා වලදී සේවා, නිවාස සහ පහසුකම් නැවත ස්ථානගත කිරීම සිදු කරයි.
x. සමහර ස්ථාන වලදී වනාන්තර/ පාරිසරිකව සංවේදී වගා බිම්තීරු ව්‍යාපෘතිය මඟින් බලපෑමට ලක් වේ.
xi. වගකිව යුතු ආයතන වල සමීප උපදේශනයක් අවශ්‍ය වේ.
xii. දැනටමත් ආපදා හේතුවෙන් අවදානමට ලක් වී ඇති ප්‍රජාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් තවදුරටත් බලපෑමට (තාවකාලිකව හෝ සදාකාලිකව) ලක් නොවීම සඳහා සුපරික්ෂාකාරී උපදේශනයක් අවශ්‍ය වේ.
xiii. ඉදිකිරීම් අතරතුර සේවක ආරක්ෂාව ඉතා වැදගත් වේ.

xiv. නායයෑම සිදු වන ප්‍රදේශයේ සිටින මගින්, නිවැසියන් සහ ව්‍යුහ වල ආරක්ෂාව සඳහා බලපෑම් විය හැක.

xv. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඉඩම් වල අයිතිය පිළිබඳ ගැටළු මතු විය හැකිය.

xvi. ව්‍යාපෘතිය සැලසුම් කිරීමේදී ස්වභාවික සම්පත් ආරක්ෂා වන ආකාරයට සැලසුම් කළ යුතුය. උදා: ප්‍රජාව සඳහා ජලය, භූමිය පිරවීම සඳහා කැනීම් කරන ලද පස් භාවිතා කිරීම, ගොඩනැගිලි අමුද්‍රව්‍ය ලෙස පාෂාණ කැබලි භාවිතා කිරීම, ඉන්ධන වශයෙන් ශාක අපද්‍රව්‍ය භාවිතා කිරීම.

xvii. හරිත පාරිසරික තාක්ෂණය ව්‍යාපෘතිය සමඟ ඒකාබද්ධ කළ හැකිය. උදා: ස්වභාවික බෑවුම් ආරක්ෂණ ක්‍රම වැනි බෑවුම් ස්ථාවර කිරීමේ ස්වභාවික ක්‍රම ඒකාබද්ධ කිරීම

xviii. ව්‍යාපෘතිය තිරසාර අන්දමින් දීර්ඝ කාලීනව ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කටයුතු කරගෙන යාම සැලකීමට ගත යුතු වැදගත් කරුණක් වේ.

xix. පාරිසරික කළමනාකරණ සැලසුමෙහිදී ස්ථානීය වශයෙන් සිදු කරනු ලබන පාරිසරික හා සමාජයීය බලපෑම් තක්සේරු කිරීම පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

***විෂය පථය සකස් කරන අවස්ථාවේදී හෙළි වූ ආකාරයට ඉදිකිරීම් අදියරේදී මෙම ස්ථාන වල ඇතිවන පාරිසරික, සමාජයීය ක්‍රියාකාරකම් හා ආරක්ෂාව යන කරුණු වල වෙනස්කම් දැකිය හැකි වේ. මෙම වෙනස්කම් අර්ථාන්විත පාරිසරික කළමනාකරණ සැලසුමකට අනුව සොයා ගැනීම සඳහා සියලුම ස්ථාන 147 සඳහා ස්ථානීය පාරිසරික හා සමාජයීය තක්සේරුවක් හා පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම් AIIB හි ES කණ්ඩායම, සමාජ විද්‍යා ඥයින් හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ආයතනය එක්ව සකස් කරන ලද කාර්ය විස්තරයට අනුව සිදු විය යුතු බව තීරණය කරන ලදී (ඇමුණුම I).***

### 4.5 අපේක්ෂිත පාරිසරික බලපෑම්

සියලුම ස්ථාන 147 සඳහා ස්ථානීය පාරිසරික හා සමාජයීය තක්සේරු කිරීමක් සිදු කිරීමට බලාපොරොත්තු වේ. ස්ථානීය පාරිසරික හා සමාජයීය තක්සේරු කිරීමේදී, වාසිදායක සහ අහිතකර පාරිසරික බලපෑම් මොනවාද යන්න හඳුනා ගැනේ. ස්ථානීය බලපෑම් තක්සේරුකරණයේදී දැනට පවතින අවදානම් මට්ටම, ඉදිකිරීම් මට්ටමේදී ඇති වන බලපෑම් හා ඉදිකිරීම් නිම වූ පසු ඇතිවන බලපෑම් යන සියල්ල පිළිබඳ අවධානය යොමු කරයි. ස්ථානීය තක්සේරුව කිරීමේදී පුළුල් අවම කිරීමේ ක්‍රමවේද සොයා ගැනීම උදෙසා වගකිවයුතු ආයතන හා ප්‍රජාව සමඟ තිබෙන උපදේශන සාකච්ඡා හා ක්ෂේත්‍ර අධ්‍යයනයන් මේ වන විටත් අවසන් කර ඇත. අවම කිරීමේ ක්‍රියාවලිය සඳහා උචිත බලපෑම් හා අවදානම් තත්ත්ව, ව්‍යාපෘතිය මඟින් බලපෑම් සිදු කරන ප්‍රදේශය සලකා විශ්ලේෂණය කරයි.

පහත දැක්වෙන්නේ ව්‍යාපෘතිය මඟින් සිදු විය හැකි මූලික ප්‍රතිලාභ හා යම් විශේෂ අවස්ථා වලදී සියලුම ස්ථාන වල පොදුවේ ඇතිවිය හැකි ඍණාත්මක බලපෑම් වේ.

#### 4.5.1 සමස්ථ ධනාත්මක බලපෑම්

i. **අපදා අවදානම අවම කිරීම**

නායයෑමේ ප්‍රවනතාවක් ඇති දිස්ත්‍රික්ක 11හි නායයෑම් මඟින් උඩරට ප්‍රවාහන අංශයට ඇති කරනු ලබන අවදානම මෙම ව්‍යාපෘතිය මඟින් හඳුනා ගත් ස්ථාන 147 තුල අවම කිරීමේ ක්‍රියා සිදු කිරීමෙන් අඩු වනු ඇත. වර්ෂා කාලවලදී ජනතාව වෙත ඇති වන නායයෑම් අවදානම් තත්වය අවම කිරීම හා වර්තමානයේ මඟීන්ට හා ධාවනය වන වාහන සඳහා ඇති අවදානම විශාල වශයෙන් අඩු වේ. මාර්ග හෙළිපහෙළි කිරීම හා අලුත්වැඩියා කිරීම සඳහා යන වියදම ඉවත් කළ හැකි වේ. බියකින් තොරව මාර්ගය භාවිතා කිරීමට හැකි වේ. ගංවතුර හා නායයෑම් ආපදා අවස්ථා වලදී මහාමාර්ග

ඉවත්වීමේ මාර්ගයක් ලෙස හා සහන කටයුතු සඳහා ප්‍රවාහන මාර්ගයක් ලෙස භාවිතා කිරීමට හැකි ලෙස සුරක්ෂිත වේ.
අධික ජනාකීර්ණ ප්‍රදේශ වල ඇති පාසැල් හා සේවා පහසුකම් උදෙසා සිදු කරනු ලබන අවම කිරීමේ ක්‍රියාවලි නිසා එම ස්ථාන නැවත භාවිතා කිරීමට හැකි වනු ඇත.

මේ නිසා යෝජිත ව්‍යුහාත්මක අවම කිරීමේ ක්‍රියා මඟින් බෑවුම් වල ස්ථාවරත්වය දියුණු කිරීම, මිනිස් ජීවිත, දේපල හා යටිතලපහසුකම් වලට ඇති ආරක්ෂාව, ආර්ථික සංවර්ධනය සහ දීර්ඝ කාලීන තිරසාර බව වැඩිදියුණු වේ. එමෙන්ම මෙම ව්‍යාපෘතිය ආපදා කළමනාකරණ අමාත්‍යංශයේ ආපදා කළමනාකරණ සැලසුම හා ආපදා අවම කිරීම සඳහා වූ සෙන්දායි රාමුව සමඟ හොඳින් ගැලපේ.

ii. **මහමාර්ග සම්බන්ධතාවය තහවුරු කිරීම**
දැනට, බෑවුම් අස්ථාවර වීමට ඇති හැකියාව නිසා වර්තමානය වන විට කඳු ආශ්‍රිත ප්‍රදේශ වල පිහිටා ඇති බොහෝ මාර්ග වර්ෂා කාලයේදී සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් වසා දැමේ. මගීන් මෙම මාර්ග භාවිතා නොකරන අතර මේ සඳහා විකල්ප වශයෙන් ඉතා දිගු දුරක් ඇති මාර්ග භාවිතා කරයි. භූමියෙන් වට වී ඇති කඳු ප්‍රදේශ වල ඇති මහාමාර්ග වල සම්බන්ධතාවය නායයෑම් මඟින් බොහෝ දුරට දුර්වල කර ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුල යහපත් මාර්ග සම්බන්ධතාවයක් පවත්වා ගත හැක.

iii. **උඩරට ආර්ථික සංවර්ධනය**
කඳුකර ප්‍රදේශයේ මාර්ග වල ආරක්ෂාව තහවුරු කිරීම මඟින් වතු, නිවාස සංවර්ධන, නාගරික සංවර්ධන, සංචාරක වැනි අංශ වල ව්‍යාපාර ආයෝජනකරුවන් හට එම ප්‍රදේශ වෙත ප්‍රවේශ වීමට හැකියාව ලබා දේ. බොහෝ පරිසර හිතකාමී නැරඹුම් ස්ථාන සඳහා ඇති ප්‍රවේශ මාර්ග නායයෑම් හේතුවෙන් අනාරක්ෂිත වේ (උදා: සිංහරාජය, හක්ගල, සමනල අඩවි රක්ෂිතය, හෝර්ටන් තැන්න). මාර්ගවල ඇති බෑවුම් වල ස්ථාවරත්වය සහතික කිරීම මඟින් පාරිසරික සංචාරකයන්ට ස්වභාවික රක්ෂිත සහ වනජීවී රක්ෂිත වැනි අවේනික පාරිසරක ලක්ෂණ ඇති ස්ථාන නැරඹීමට හැකියාව ලැබෙන බැවින් මෙම ව්‍යාපෘතිය පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරයට ද ප්‍රතිලාභ ලබා දේ.

iv. **ආගමික හා සංස්කෘතික තිරසාර බව සඳහා සහාය**
අවම කිරීම සඳහා යෝජිත සමහරක් මාර්ග, සිද්ධස්ථාන වෙත පිවිසුම් මාර්ග වේ. මෙම ස්ථාන විශාල බැතිමතුන් පිරිසකගේ වැදීමට භාජනය වී ඇත. උදා: ශ්‍රී පාද වන්දනාව සහ නුවර ඇති බුදුරජාණන් වහන්සේගේ දන්ත ධාතුව වන්දනා කිරීම. නායයෑම් හේතුවෙන් මෙම මාර්ග වන්දනා කරුවන් සඳහා අනාරක්ෂිත වන බැවින් ඔවුන් බොහෝ විට මේ සඳහා විකල්ප මාර්ග ලෙස ඉතා දුරක් ගමන් කළ යුතු මාර්ග භාවිතා කරයි. ආගමිකව වැදගත් වන කාලවලදී මෙම අවදානම් ස්ථාන හරහා ගමන් කරන වන්දනාකරුවගේ ආරක්ෂාව මෙම ව්‍යාපෘතිය මඟින් වැඩි කරයි.

v. **පාංශු සංරක්ෂණය හා අවසාදිත මඟින් ජලය දූෂණය වීම ආරක්ෂා කිරීම**
අනෙක් ව්‍යාපෘති මෙන් නොව නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති මඟින් පාංශු භායනය, අවසාදිත ගලා යාම, මතුපිට ඛාදනය වීම, ගංගා වලට අවසාදිත එකතු වීම අවම කරන අතර ජලාශ වල අවසාදිත තැන්පත්වීම අවම කරයි. එම නිසා ව්‍යාපෘතිය සෘජුවම ජාතික පාංශු සංරක්ෂණ රෙගුලාසි සඳහා සහය දක්වයි.

### 4.5.2 බෑවුම් අස්ථාවර වීම් අවම කිරීම සඳහා භාවිතා කළ හැකි ඉදිකිරීම් වර්ග

බෑවුම් වල අවම කිරීමේ ක්‍රම i) බෑවුමේ ජ්‍යාමිතිය වෙනස් කිරීම ii)ඉවත් කරන ලද සුන්බුන් බෑවුමේ ඉහල හා පහල කොටසේ තැන්පත් කිරීම iii) ජල පරිවහනය විධිමත් කිරීම iv) මතුපිට පාංශු හා පාෂාණ ස්තරය වැර ගැන්වීම v) මතුපිට පාංශු ඛාදනය පාලනය කිරීම වැනි ක්‍රියාමාර්ග වලින් සමන්විත වේ.

බෑවුම් ජ්‍යාමිතිය වෙනස් කිරීමේදී මතුපිට පාංශු ස්ථරය, ශාක ආවරණය, පාංශු/ පාෂාණ ස්ථරය ඉවත් කිරීම සහ අඩු කිරීම යන ක්‍රම භාවිතා කරන අතර එමගින් බෑවුම් ජ්‍යාමිතිය වඩා ස්ථාවර මට්ටමකට ගෙන එයි. අස්ථාවර පාෂාණ කුට්ටි හා පාෂාණ ස්කන්ධ ඉවත් කරන අතර මෙහිදී බොහෝ විට පාෂාණ පුපුරවා හැරීම සිදු කරයි. ජල පරිවහනය ක්‍රමවත් කිරීමේදී පෘෂ්ඨීය හා අභ්‍යන්තර ජල පරිවහනය යන දෙකම සැලකේ. මේ මඟින් පෘෂ්ඨීය ජලය ගලා යාම නැවත්වීම, පොලවට උරා ගන්නා ජල ප්‍රමාණය පාලනය කිරීම, අභ්‍යන්තර ජල මට්ටම පහත හෙළීම යනාදිය මඟින් වර්ෂා කාලවලදී බෑවුම් ස්ථාවර කිරීම සිදු කරයි. මේ සඳහා භාවිතා කරනු ලබන ඉදි කිරීම් වන්නේ වාරණ කාණු සහ තට්ටු කාණු (cutoff drains, berm drains) සහ නෙත්ති කාණු යනාදියයි. බෑවුම අභ්‍යන්තර සඳහා සිදු කරනු ලබන ව්‍යුහ වලදී බෑවුම තුලට සැමදාම පවතින ආකාරයෙ සිදුරු සහිත පයිප්ප ඇතුල් කිරීම මඟින් අභ්‍යන්තර ජලය ඉවතට ගැනීම වැනි ක්‍රියා භාවිතා කරයි. මෙම අභ්‍යන්තර ජලකානු සඳහා විවිධ නවීකරණයන් පවතින අතර සාමාන්යෙන් අරියව ස්ථාපිත කළ තිරස් ජල කානුවකට ජලය එකතු කිරීම සිදු කෙරේ. දුර්වල පාංශු හෝ පාෂාණ ස්ථර වැර ගැන්වීම සඳහා බෑවුම් ස්ථාවර කිරීම සඳහා යොදා ගත හැකි විවිධ ක්‍රම භාවිතා කරයි. මේ සඳහා ආධාරක ව්‍යුහ ඉදි කිරීම, කොන්ක්‍රීට් කණු උපයෝගී කර ගැනීම, කොන්ක්‍රීට් වානේ දඬු ව්‍යුහයක් භාවිතයෙන් පාංශු වැරගැන්නුම සහ පාෂාණ මුරිච්චි කිරීම ආදිය භාවිතා වේ. මතුපිට සඳහා යොදා ගනු ලබන ක්‍රම අවම කිරීමේ ක්‍රමවේදය මත වෙනස් වන අතර මෙහිදී බොහෝ විට අවධානය යොමු කරනු ලබන්නේ පාංශු ඛාදනය හා අස්ථාවර පාෂාණ කුට්ටි පෙරළීම පාලනය කිරීමටයි. මේ සඳහා භාවිතා කරනු ලබන ප්‍රචලිත ක්‍රමය වන්නේ ෂොට්ක්‍රීට් කිරීමයි. නව ඉදිකිරීම් ක්‍රම සඳහා හරිත තාක්ෂණය (බෑවුම් ඛාදනය වීම පාලනය කිරීම සඳහා වගා යොදා ගැනීම) යොදා ගැනීම වර්තමානය වන විට ප්‍රචලිත වෙමින් පවතී. පාෂාණ කුට්ටි වැටීම පාලනය කිරීම සඳහා ජියෝනෙට් යොදා ගනී. (ඇමුණුම 11: අස්ථාවර බෑවුම් ස්ථාවර කිරීම සඳහා යම් ව්‍යුහාත්මක බෑවුම් ස්ථාවර කිරීමේ ක්‍රම අනුගමනය කළ හැකිය).

### 4.5.3 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ඇති වන සෘණාත්මක බලපෑම්

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන බොහෝ බලපෑම් ඇති වන්නේ ඉදිකිරීම් අදියරේදීය. ඉදිකිරීම් අදියරේදී ඇති වන ප්‍රධාන බලපෑම් පහත පරිදි වේ.

**වගුව 6: සෘණාත්මක පාරිසරික බලපෑම්**

| ව්‍යාපෘති ක්‍රියාකාරකම් | බලපෑම් සාධකය | බලපෑම |
|---|---|---|
| i. **බෑවුම් නවීකරණය කිරීම** මතුපිට ශාක ආවරණය ඉවත් කිරීම.<br>ii. බෑවුමේ කැපීම් කිරීම, සුන්බුන්, මතුපිට පාංශු ආවරණය, පාෂාණ කුට්ටි, පාෂාණ කැබලි ඉවත් කිරීම<br>තැන්පත් වූ සුන්බුන් ඉවත් කිරීම | **ස්ථානීය පාරිසරක පද්ධති සඳහා බාධා වීම** වැදගත් ශාක විශේෂ ඉවත් කිරීම, ශාක අපද්‍රව්‍ය ජනිත කිරීම<br>පාංශු සහ සුන්බුන්, පාෂාණ කැබලි ජනිත කිරීම, බෑවුම ඛාදනය සඳහා වඩා නිරාවරණය කිරීම, අතිරික්තව ගලා යන ජලයේ අවසාදිත ප්‍රමාණය වැඩි කිරීම | • **භෞමික පරිසර විද්‍යාව**: තුරුලතා වලට බලපෑම් ඇති කරයි, වාසභූමි එකිනෙක සම්බන්ධතාවය කෙරෙහි බලපායි, පාරිසරිකව ආරක්ෂා කළ යුතු, තර්ජනයට ලක්ව ඇති, දුර්වල විශේෂ තුරන් වී ය හැක. බොහෝ ව්‍යාපෘති දැනටමත් අස්ථාවර වූ හෝ හානියට පැමිණි බෑවුම්වල සිදු කරන බැවින් භෞමික පරිසර පද්ධති සඳහා වන බලපෑම් ප්‍රාදේශීය වේ. වනාන්තර මඟින් ආවරණය වූ ස්ථාන තිබේ. මාර්ග ප්‍රවේශය, පෘෂ්ඨීය ජලපරිවහනය, ආධාරක ව්‍යුහ , පාංශු ඛාදනය අවම කිරීමේ ව්‍යුහ වැනි දේ සඳහා දැවමය වශයෙන් විශාල වටිනාකමක් ඇති සමහරක් ශාක විශේෂ කපා දැමීමට සිදු වේ. මේ නිසා **ස්ථානීය වශයෙන්** |

| | | |
|---|---|---|
| | | **සැලකිය යුතු තරමේ බලපෑම් ඇති විය හැක.**<br>• ගංගා වල ඉවුරු වල තිබෙන වෘක්ෂලතා යම් යම් අවස්ථාවල ඉවත් කිරීමට සිදු වනු ඇත. එමෙන්ම සමහර ස්ථාන වල විශාල ප්‍රදේශ යක ශාක ආවරණය ඉවත් කිරීමට සිදු වනු ඇත. මෙය වාසභූමි ඛණ්ඩනය වීමට හේතු වන අතර වාසභූමි අතර සම්බන්ධතාවය අඩු කරනු ඇත. **ස්ථානීය වශයෙන් සැලකිය යුතු තරමේ බලපෑම් ඇති විය හැක.**<br>• **පාංශු ඛාදනය, ජලජ පරිසර විද්‍යා ව සහ ඇළපාරවල් වල ගුණාත්මකභාවය:** පාංශු ආවරණය ඉවත් කිරීම මඟින් බෑවුම නිරාවරණය කිරීමෙන් බෑවුම අධික වශයෙන් ඛාදනයට නිරාවරණය කරයි. මේ නිසා ගලා යන ජලයේ තිබෙන අවසාදිත ප්‍රමාණය වැඩි වන අතර ගංගා වල අවසාදිත ප්‍රමාණයද වැඩි වේ. ගංගා වල අධික අවසාදිත ප්‍රමාණයක් තිබීම ජලයේ සන්නායකතාවය, අර්ධ වශයෙන් දිය වී ඇති ඝන ද්‍රව්‍ය වල ප්‍රමාණය වැඩි කරන අතර ඇළවල්වල පත්ලේ ඇති ජීවීන්ට අහිතකර තත්ත්ව නිර්මාණය කරනු ලැබේ. මෙය මඟින් ජලය මිනිස් භාවිතයට හා ජල ජීවින්ට නුසුදුසු තත්වයකට පත් කරයි. ගංගාවල පතුලේ වෙනස්වීම් ප්‍රාදේශීය ඇළවල් වල පරිසර තත්ත්ව වෙනස් කරන අතර මෙය සංවේදී ජලජ ජීවින් සඳහා බලපායි. බොහෝ ව්‍යාපෘති ස්ථාන වල බෑවුමේ පහල කෙලවර මායිම් වන්නේ පිරිසිදු ජලය හා මනා පරිසර තත්වයක් තිබෙන ඇළක් මඟින් වන අතර **මේ නිසා ජලයේ ගුණාත්මක බව හා ජලජ ජීවින්ගේ පරිසර තත්ත්ව වලට සිදුවන බලපෑම ඉතා අධික ලෙස සැලකිය හැක.** |
| **iii. ශාකමය ඛාදන පාලනය කිරීමේ ක්‍රම** | **ඛාදනය පාලනය කිරීමේ ක්‍රමයක් වශයෙන් ශාක භාවිතා කිරීම**<br>තණකොළ, වැල් වැනි විවිධ පැළෑටි මතුපිට පාංශු ඛාදනය පාලනය කිරීම සඳහා යොදා ගනී. උදා: හයිඩ්‍රොසීඩ් කිරීම. මෙම පැළෑටි වල වර්ධනය සඳහා විදෙස් | • **ආක්‍රමණික විශේෂ**<br>ආක්‍රමණික විශේෂ මඟින් සමහරක් පාරිසරිකව සංවේදී ජෛව විවිධත්වයක් ඇති වාසස්ථාන ආක්‍රමණය කළ හැකි බැවින් එය **දීර්ඝ කාලීනව සලකා බලන විට පරිසර පද්ධතියට හානි පමණුවනු ඇත.** උදා: සමහර ස්ථාන වලදී වනාන්තර පරිසර පද්ධති ආක්‍රමණික විශේෂ මඟින් ආක්‍රමණය කිරීම |

| | | |
|---|---|---|
| | පාංශු වර්ග, කොළරොඩු, කොම්පෝස්ට්, ඇට වර්ග යනාදිය භාවිතා කරයි. සමහරක් ශාක විශේෂ ආක්‍රමණික විය හැක. හියුමස්/ කොළරොඩු යන ආදියේ තිබෙන ඇට වර්ග'වල ආක්‍රමණික විශේෂ සිටිය හැකි අතර මෙම ක්‍රියාවලියේදී ඔවුන් හඳුන්වාදීම සිදු වේ. | |
| **iv. ආධාරක ව්‍යුහ ඉදි කිරීම** | **ඉදි කිරීම සඳහා ආධාර වන ව්‍යුහ ඉදි කිරීම සඳහා ගස් කපා දැමීම**<br>ඉදි කිරීම කටයුතු සඳහා භාවිතා කිරීම සඳහා ගම්වල වන ලැහැබවල් හෝ පුද්ගලික ඉඩම් වල ඇති වටිනා ශාක විශේෂ කපා දැමීම සිදු කළ හැකිය. | • **වනාන්තර හා ගස් වලට හානි වීම**<br>වටිනා දැව විශේෂ පද්ධතියෙන් ඉවත් කිරීම නිසා ප්‍රාදේශීය පරිසර පද්ධතියට හා ශාක වලට හානි පැමිණිය හැක.<br><br>වගුව 6 තවදුරටත් |
| **ව්‍යාපෘති ක්‍රියාකාරකම්** | **බලපෑම් සාධකය** | බලපෑම |
| **v. පෘෂ්ඨීය හා අභ්‍යන්තර ජලකාණු පිහිටුවීම** | **පෘෂ්ඨීය හා අභ්‍යන්තර ජලය එකතු කිරීම**<br>භූගත ජලය අඩු වීම හා භූගත ජල මට්ටම පහත වැටීම | • **ප්‍රාදේශීය උල්පත් හා ගංගා:** අභ්‍යන්තර ජල මට්ටම පහල වැටීම නිසා ජලය ගබඩා වීම අඩු වීමහේතුවෙන් ප්‍රාදේශීය වශයෙන් බලපෑම් ඇතිවිය හැකිය. මෙහි ප්‍රතිඵලයක් වශයනේ මෙම ප්‍රදේශ වල තිබෙන උල්පත් සිඳී යා හැකිය. මෙම සමහරක් උල්පත් ප්‍රාදේශීය ප්‍රජාව විසින් විවිධ අවශ්‍යතා සඳහා භාවිතා කරනු ලබයි. වියලි කාලවලදී ජනතාවට ජල හිඟයට මුහුණ දීමට සිදු වනු ඇත. **මෙය ව්‍යාපෘතිය නිසා සිදුවන සැලකිය යුතු සෘණාත්මක බලපෑමක් වේ.**<br><br>• වියලි කාලවලදී ඇළවල පහල කොටස් කර ගලා යන ජලයේ අඩු වීමක් දැක ගත හැකි වේ. කෙසේ වුවද, ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන ජල විද්‍යාත්මකව කලාපය (අස්ථාවර වූ බැවුමෙන් ගලයන ජලය හා අභ්‍යන්තර ජලය පමණක් ඉවතට ගැනීමට සැලසුම් කළ |

| | | |
|---|---|---|
| | | ජලනල) සලකා බැලූ කළ බොහෝ අවස්ථා වල මෙම ව්‍යාපෘතිය හේතුවෙන් ඇළවල් වල ජල ගැලීම අවම වීමට දක්වන **දායකත්වය නොවැදගත් වනු ඇත.**<br><br>• **වර්ෂා කාලවලදී ඇතිවන බාදන කරවන සුළු ජල ගලා යාම:** වර්ෂා කාල වලදී ඇළවල ගලායන අතිරික්ත ජල ප්‍රමාණය ඉහලය. මේ හේතුවෙන් ඇළවල්වල පතුල හා ඉවුරු ඛාදනය වීම හා අතිරික්ත ජලය සෘජුවම ඇළකට හෝ බෝක්කුවක් මාර්ගයෙන් ඉවතට යන්නේ නම් බෝක්කු අසල ඛාදනය වීම සිදුවිය හැක. **මෙය සැලකිය යුතු තරමේ බලපෑමක් වේ.** |
| v. **යන්ත්‍ර ක්‍රියාකරවීම, එළිමහනේපවතින පාංශු ගබඩා, සුන්බුන් හා ඉදිකිරීම් ද්‍රව්‍ය, මතුපිට ෂොට්ක්‍රීට් කිරීම, පයිල් ගැසීමේ කටයුතු හා ඉදිකිරීම් ද්‍රව්‍ය/ අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම පාෂාණ පිපිරවීම** | **වායු දූෂණය**<br>දුවිලි සහ ඉන්ධන දහනය මඟින් නිපදෙවන දුම් හේතුවෙන් වායු ගුණාත්මකභාවය වෙනස් වීමට හැකියාව ඇත. | • **දුවිලි හා අවලම්බිත අංශු මට්ටම (Suspended Particulate Matter levels SPM)**<br>• දුම් පිට කිරීම නිර්දේශිත ජාතික පාරිසරික තත්ත්ව ප්‍රමිතීන් වලට වඩා වැඩි විය හැකි අතර එම අංශු මඟීන්ට, පදිකයනට සහ එම ප්‍රදේශයේ පදිංචිකරුවන්ට හානි දායක විය හැකිය. එම නිසා ඉදිකිරීම් අදියරේදී සිදු වන වායු දූෂණය **ස්ථානීය වශයෙන් විශාල බලපෑමක් ඇති කරනු ඇත.**<br>. |
| | **ශබ්ද දූෂණය හා කම්පන බලපෑම්**<br>බැවුම් කැනීම, විශේෂයෙන්ම විදීම් කටයුතු මඟින් (පයිල් ගැසීමේදී සහ විදීමේ දී) සුසංහසනය සහ පාෂාණ පිපිරවීමේ ක්‍රම ශබ්ද දූෂණය හා ඉහළ කම්පන ඇති කරයි.<br><br>කැනීම්, කැපීම්, පිරවීම් හා සුසංහසනය මඟින් මෙන්ම ඉදිකිරීම් අදියරේදී බර වාහන ක්‍රියාකරවීම නිසාද ද ශබ්දය හා කම්පනය ඇති වේ. | **ජීවී ප්‍රතිග්‍රාහකයන් මත ශබ්දයෙන් හා කම්පනයෙන් ඇතිවන බලපෑම්**<br>• මෙම ව්‍යාපෘතිය මඟින් අසල්වැසි ප්‍රජාවට, පදිකයන්ට සහ මාර්ග භාවිතා කරන්නන්ට බලපෑම් ඇති වේ. සමහරක් ස්ථාන අධික නාගරිකකරණය වී ඇති ස්ථාන හා පාසල් ආශ්‍රිතව පිහිටා තිබේ. එම නිසා එවැනි ස්ථාන අධික ශබ්දය, කම්පනය මඟින් ඇතිවන දූෂණය හා අවහිරතා මඟින් බලපෑමට ලක් වේ.<br><br>• ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් එම ප්‍රදේශ වල ඇති සමහරක් ශාක විනාශ වීමට හැකියාවක් පවතී. සමහරක් ව්‍යාපෘති වනාන්තර කොටස් වල සිදු වෙන බැවින් විශේෂයෙන්ම කුරුල්ලන්ට හා ක්ෂීරපායීන්ට හානි වේ.<br><br>• බොහෝ ව්‍යාපෘති නිහඬ සාමකාමී පරිසර වල සිදු වන බැවින් ශබ්දය හා කම්පන නිසා සංවේදී ජීවීන් හට ඇතිවන **බලපෑම විශාල වේ.**<br><br>• සමහරක් ස්ථාන පාසැල්, ආගමික ස්ථාන (පන්සල්, පල්ලි) වලට ආසන්නව පිහිටා ඇත, ශබ්ද දූෂණය හේතුවෙන් පාසැල් වල පන්ති පැවැත්වීමට හා ආගමික ස්ථානවල ආගමික ක්‍රියාවන් සිදු |

| | | |
|---|---|---|
| | | කරගෙන යෑමට බාධා ඇතිවීම **සැලකිය යුතු ස්ථානීය බලපෑමක් වේ**.<br>• **ව්‍යුහ මත කම්පනය නිසා ඇතිවන බලපෑම්**<br>නායයෑම් වලට ආසන්නව පිහිටා ඇති සමහර නිවාස වල විෂම සමතුලිතතාවය හා දුර්වල ඉදිකිරීම් හේතුවෙන් ඇතිවූ ඉරිතැලීම් දැකිය හැකි වේ. විදුම් හා ගල් පිපිරවීම නිසා ඇති වන කම්පන හේතුවෙන් මෙම ඉරිතැලීම් වැඩි විය හැකි අතර ඒ නිසා එම නිවාස හා ගොඩනැගිලි වලට තවදුරටත් හානි සිදු විය හැක. නිවාස හා ගොඩනැගිලි ආසන්නයේ ඉදිකිරීම් කටයුතු කරන අතරතුර සිදුවන කම්පන නිසා **සැලකිය යුතු ස්ථානීය බලපෑමක් වේ** |
| | **ජලයේ ගුණාත්මකභාවය**<br>ඉදිකිරීම් කටයුතු කරන අතරතුර පස්, අපජලය තෙල්, ලිහිසි ද්‍රව්‍ය, මලපහ සහ වෙනත් ද්‍රව්‍ය පරිසරය වෙත මුදා හැරීම නිසා ජලයේ ගුණාත්මකභාවයට බලපෑම් ඇතිවිය හැකිය. | • **ජල දූෂණය:** බැහැර කරන දෑ නිසා ජලයේ BOD, COD, අවසාදිත ඝන ද්‍රව්‍ය, තෙල් හා ග්‍රීස් ප්‍රමාණය වැඩි විය හැකිය. විමෝචනයන් හේතුවෙන් බිමට, නෑමට සහ ජල වගා සඳහා තිබෙන ජල ගුණාත්මක තත්ත්ව ඉක්මවා යා හැකි අතර එය ජලයේ ගුණාත්මකභාවය සඳහා තිබෙන අවම තත්වයන් පවා ඉක්මවා ය හැකිය. ඒ නිසා ඉදිකිරීම් අදියරේදී අපජලය සහ දූෂක හේතුවෙන් ජලයට වන බලපෑම **ඉතා අධික වේ.** |
| | **සේවා පහසුකම් වලට හානි සිදුවීම**<br>සමහර ස්ථාන වල තිබෙන සන්නිවේදන රැහැන් සහ කණු, විදුලි රැහැන් සහ කණු වැනි දේ ඉදිකිරීම් අවස්ථාවේදී භාවිතා කරනු ලබන කැනීම් යන්ත්‍ර වැනි විශාල යන්ත්‍ර වලින් හානියට පත් වීමට ඉඩ ඇති හෙයින් එම ස්ථාන වලින් ඉවත් කිරීම සිදු කළ යුතු වේ.<br><br>සමහර ස්ථාන වලදී ජල සම්පත් සහ ජල සැපයුම් නල බැවුම් වල හෝ මාර්ගය දෙපස පිහිටා තිබිය හැක (උදා: කැටන්දොළ, රත්නපුර දිස්ත්‍රික්කය) ඉදිකිරීම් කටයුතු හා | • **සේවා යටිතලපහසුකම් සඳහා හානිවීම්**<br>අසල ජීවත් වන ප්‍රජාවට විදුලියේ, සන්නිවේදනයේ සහ ජල සැපයුමේ සිදුවන කඩා වැටීම් නිසා පීඩා විඳීමට සිදු විය හැක.<br><br>(*මෙය කැටන්දොළ ස්ථානයේ දැනටමත් සිදු වී ඇති අතර RDA ට අයත් තාවකාලික ඉදිකිරීම් යන්ත්‍ර හේතුවෙන් එම ප්‍රදේශයේ පවුල් 30 කට පමණ ජලය සපයන ජල සැපයුම් නල හානියට පත් වී ඇත*)<br><br>එම නිසා මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් අදියරේදී සේවා යටිතලපහසුකම් සඳහා සිදු වන **බලපෑම සැලකිය යුතු තරම් විශාල වේ.** |

| | | |
|---|---|---|
| | යන්ත්‍ර මඟින් මේවාට හානි සිදු විය හැක. | |
| | **සංස්කෘතිකව වැදගත් ව්‍යුහ හා පුරා විද්‍යා ස්ථාන** ව්‍යාපෘතියට අදාල වන සමහර ස්ථාන පෞරාණික පන්සල් හෝ පුරාවිද්‍යාත්මකවව වැදගත් ස්ථාන වලට ආසන්නව පිහිටා තිබිය හැක. | • **සංස්කෘතිකව වැදගත් ව්‍යුහ හා පුරා විද්‍යා ස්ථාන** කැනීම් කටයුතු හේතුවෙන් මෙම පුරාවිද්‍යාත්මකව වැදගත් ස්ථාන වල ඇති නටඹුන් වලට හානි සිදු විය හැකි අතර ඉන් වටිනා පෞරාණික සම්පත් වලට **සැලකිය යුතු බලපෑමක් ඇති කරයි**. |
| vi.**සෞන්දර්යාත්මකව සුන්දර නොවන/ පාරිසරිකව නොගැලපෙන සැලසුම්** | **දෘශ්‍ය දූෂණය** අවම කිරීම සඳහා යොදා ගන්නා සැලසුම් පවතින ස්වභාවික පරිසරයේ ඇති ලක්ෂණ සමඟ නොගැලපීම හේතුවෙන් දෘශ්‍ය දූෂණය වීමක් සිදු විය හැක. | • **ඉහල සෞන්දර්යාත්මක සංවේදී පරිසරයක් තුල දෘශ්‍ය දූෂණය වීමක් සිදු වීම** සමහර ස්ථාන අවේණික ස්වභාවික සුන්දරත්වයක් ඇති ඉහල සෞන්දර්යාත්මක වටිනාකමක් ඇති මාර්ගවල පිහිටා ඇත. නොගැලපෙන කොන්ක්‍රීට් ව්‍යුහ හා පෘෂ්ඨීය ප්‍රතිකාරක ක්‍රම යොදා ගැනීම නිසා මෙම ස්ථාන වල තිබෙන සෞන්දර්යාත්මක සුන්දරත්වය නැති වී යයි. සමහරක් මෙම මාර්ග පරිසර හිතකාමී සංචාරක ප්‍රදේශ වල පිහිටා තිබෙන බැවින් **මෙමඟින් ඒවායේ සුන්දරත්වයට සැලකිය යුතු බලපෑමක් ඇති වේ**. |

වගුව 6 තවදුරටත්

| **ව්‍යාපෘති ක්‍රියාකාරකම්** | **බලපෑම් සාධකය** | බලපෑම |
|---|---|---|
| vii.**අපද්‍රව්‍ය** බැහැර **කිරීමේ ස්ථාන** | **අනවසර බැහැර කිරීම්, වාතය, පස්, ජලය දූෂණය වීම, ජනතාවට ඇතිවන අපහසුතා** ඉදිකිරීම් කටයුතු හේතුවෙන් ශාක අපද්‍රව්‍ය, පස් සුන්බුන්, විශාල ප්‍රමාණයකින් ගල් කැබලි ආදිය ජනිත වන අතර පූර්ව ඉදිකිරීම් අවස්ථාවේදී මෙම ද්‍රව්‍ය බැහැර කිරීම සිදු කළ යුතු වේ. | මෙම අපද්‍රව්‍ය මාර්ග රක්ෂිත, ඇළ ඉවුරු වල, පොදු ස්ථාන ආසන්නයේ හෝ නිවාස වල ප්‍රවේශ මාර්ග ආසන්නයට බැහැර කිරීම සිදු කළ හැක. ඒ නිසා ඇතිවන දෘශ්‍ය දූෂණය හා අපවිත්‍ර ද්‍රව්‍ය මඟින් ඇතිවන දූෂණය ඉහල වේ. |

**වගුව 7: සමාජයීය/ වෘත්තිමය බලපෑම්**

| **ව්‍යාපෘති ක්‍රියාකාරකම්** | **බලපෑම් සාධකය** | **බලපෑම** |
|---|---|---|

| | | |
|---|---|---|
| i. **අධි අවදානම් ඉදිකිරීම් කටයුතු, පිපිරීම් සඳහා පිපුරුම් ද්‍රව්‍ය භාවිතා කිරීම, අධි යන්ත්‍ර භාවිතා කිරීම** | **සේවකයන්ගේ ආරක්ෂාව**<br>ඉදිකිරීම් කටයුතු ඒ වන විටත් අස්ථාවර හෝ කඩා වැටි ඇති ස්ථාන වල සිදු කරන බැවින් පෙරලීම්, පාෂාණ කුට්ටි වැටීම් වැනි දේ සිදු විය හැකි අතර ඒ නිසා එම ස්ථාන වල ඉදිකිරීම් කටයුතු සිදු කිරීම අධි අවදානම් වේ.<br>බෑවුම් වල ඇති ගල් හා පාෂාණ කුට්ටි පිපිරවීම සඳහා පිපුරුම් ද්‍රව්‍යභාවිතා කරනු ලැබේ.<br>කැනීම් යන්ත්‍ර, විදුම් යන්ත්‍ර, රෝල්ර්ස් වැනි යන්ත්‍රද භාවිතා කරනු ලැබේ. | • **සේවකයන් සඳහා වන අවදානම**<br>වැටීම් මඟින් වන අනතුරු සඳහා සේවකයන් නිරාවරණය වේ. බෑවුම අස්ථාවර වුවහොත් මරණීය හානි සිදු විය හැකිය. වර්ෂා කාලවලදී බෑවුම් අස්ථාවර වීමේ අවදානම වැඩි වේ. **මෙම අවදානම සියලුම ස්ථාන සඳහාම වාගේ පොදු හා විශේෂ වන අතර බෑවුමේ ඉහල කෙලවරේ වැඩ කිරිමේදී එම අවදානම ඉතා අධික ය.**<br>• ගල් පිපිරවීමක් අවශ්‍ය වුවහොත් පිපුරුම් ද්‍රව්‍ය භාවිතා කරනු ලැබේ. අනාරක්ෂිත භාවිතයන් නිසා අවදානමක් ඇති කළ හැක. ජීර්ණය වූ පාෂාණ හා පාෂාණ කුට්ටි ඉවත් කරන ස්ථාන සඳහා පොදුවේ භාවිතා වේ. මෙම ක්‍රියාවන් අස්ථාවර බෑවුම් වල සිදු කිරීමට අවශ්‍ය නිසා අවිධිමත් ලෙස පිපිරුම් ද්‍රව්‍ය භාවිතා කිරීම හා පාෂාණ කැබලි වලින් සිදු විය හැකි අනතුරු **ඉතා අධික ය.**<br>• සීමිත ඉඩක් තුල බර යන්ත්‍ර ඉදිකිරීම් සඳහා යොදා ගනු ලැබේ. වාහන හා ඉදිකිරීම් යන්ත්‍ර මඟින් අනතුරු ඇතිවීමේ අවදානම **ඉතා අධික ය.**<br>• **බර යන්ත්‍ර ක්‍රියාකරවීම සඳහා ජාතික පද්ධතියෙන් හෝ වැඩබිමේ තිබෙන විදුලි ජනක යන්ත්‍ර මඟින් විදුලි බලය ලබා ගැනීමට අවශ්‍ය වේ.**<br>අනාරක්ෂිත විදුලි රැහැන් සහ බල පද්ධති භාවිතා කිරීම හේතුවෙන් **සේවකයන්ට හා පොදු ජනතාවට විදුලි සැර වැදීමේ අනතුරු සිදු විය හැක.**<br>• **සර්පයන් දෂ්ට කිරීම**<br>බොහෝ **වැඩබිම්**වනාන්තර හෝ දැඩි ශාක වගාවක් ඇති ස්ථාන වල පිහිටා ඇත. මෙම ස්ථානවල විෂ සහිත සර්පයන් සිටිය හැක. **වැඩ කරන අවස්ථාවේදී සේවකයන් නයි දෂ්ට කිරීම් වලට නිරාවරණය වේ.** |
| | **මඟීන්, පදිකයින් සහ ප්‍රාදේශීය පදිංචි කරුවන්ගේ ආරක්ෂාව** | • **මාර්ග භාවිතා කරන්නන්ට ඇති අවදානම**<br>ජනාවාස හා මාර්ග වලින් ඈත පිහිටා තිබෙන ස්ථාන වල මෙය අවම වේ. නමුත් මෙම ස්ථාන ආසන්නයේ පිහිටා තිබුන හොත් මාර්ග භාවිතා කරන්නන්ට හා පදිංචිකරුවන්ට **සැලකිය යුතු අවදාමනක්** ඇති කෙරේ. |
| ii. **ඉදිකිරීම් කටයුතු හේතුවෙන් බෑවුම් අස්ථාවර වීමක් ඇතිවීමට හැකි අවදානම** | **ඉදිකිරීම් හේතුවෙන් ඇතිවන බෑවුම් අස්ථාවරතා** | • **බෑවුමේ පහල ප්‍රදේශයේ ජීවත් වන මිනිසුන්ට අධි අවදානම් තත්වයක් පවතී**<br>සමහර ස්ථාන වල බෑවුමේ පහල හෝ අස්ථාවර වූ බෑවුම අසල මිනිසුන් වාසය කරන නිවාස තිබේ. මෙම නිවාස වල නිවැසියන් නායයෑමේ අවදානම හේතුවෙන් එම නිවාස වලින් ඉවත් විය යුතු උවත් ඔවුන් තවමත් එම නිවාස වල ජීවත් වෙයි. **මෙම නිවාස හා නිවැසියන් ඉදිකිරීම් අවස්ථාවේදී අධි අවදානම් තත්වයකට නිරාවරණය වේ.** |

| | | |
|---|---|---|
| iii. **ඉදිකිරීමේ ශ්‍රම බලකාය**<br><br>iv. **ඉඩම්/ නිවාස වැඩබිම් ලෙස හා ගබඩා භූමි ලෙස භාවිතා කිරීම**<br>කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කඳවුරු/ යන්ත්‍ර නවතා තබන ස්ථාන ලෙස භාවිතා කිරීම සඳහා නිවාස හෝ ඉඩම් බද්දට ගැනීම හෝ කුලියට ගැනීම සිදු කරනු ලබයි | **පැතිරී යා හැකි රෝග, මත්කුඩු, අසල්වාසීන් සමඟ ඇතිවන අරගල හා කෝලාහල හා පීඩා** | • **පදිංචි කරුවන් සඳහා වන අවදානම**<br>ස්ථාන වල ඉදිකිරීම් සිදු කරනු' ලබන්නේ ඉදිකිරීම් ආයතන මගිනි සේවක පිරිස් බොහෝ විට විවිධ පරිසර වලින් පැමිණි පුද්ගලයන් වේ.<br>• ඔවුන්ගේ දුර්වල හැසිරීම්, නොමනා ක්‍රියා එම ප්‍රදේශයේ ජීවත් වන පුද්ගලයන්ට කරදරයක් විය හැක. ඔවුන් අසල්වාසීන්ට අභියෝග කළ හැකි වන අතර ඔවුන් සමඟ රණ්ඩු ඇතිකර ගැනීමට පෙළඹීම නිසා අසල්වාසීන්ට කරදර ඇති වනු ඇත.<br>• බොහෝ ස්ථාන දුප්පත් ගම්බද ප්‍රදේශ වල පිහිටා තිබෙන බැවින් ළමා අපයෝජන, අනාචාර හා ලිංගික ශ්‍රමය වැනි ක්‍රියා සිදුවිය හැකි වේ.<br>• මත්ද්‍රව්‍ය හා මත්පැන් වලට ඇබ්බැහි වූ සේවකයන් නිසා එම ප්‍රදේශයේ ප්‍රජාවද එයට ඇබ්බැහි විය හැකිය. |
| | | • ඔවුන් මඟින් ලිංගිකව පැතිරෙන HIV වැනි රෝග ප්‍රජාව අතර පැතිරය හැක.<br>• සේවකයන් විසින් අසල්වාසීන්ගේ වටිනා දේපල සොරකම් කිරීම සිදු විය හැක.<br>• නාන ස්ථාන, පොදු ජල මුලාශ්‍ර වැනි බෙදාගෙන භාවිතා කළ යුතු සම්පත් දේ භාවිතා කිරිමේදී අරගල/කෝලාහල ඇතිවිය හැකිය.<br>ඉහත සඳහන් කළ දේවල් ප්‍රාදේශීය මට්ටමින් සිදු වුවද බලපෑමේ විශාලත්වය ගැන සැලකූ විට **ඉතා අධික වේ** |
| | **දඩයම් කිරීම**<br><br>සේවකයන් විසින් සමහරක් වනාන්තර කොටස් වල සිටින වනසතුන් දඩයම් කිරීම සිදු කිරීමට ඉඩ ඇත. | • **දඩයම් කිරීම**<br>මෙය පරිසර පද්ධතියට හානි කරන අතර ස්වභාවික සතුන් සඳහාද බලපෑම් ඇති කෙරේ. මෙම හේතුව නිසා එකදේශීය/ තර්ජනයට ලක් වු/ දුර්ලභ විශේෂ නැති වී යා හැක.<br>සමහරක් ස්ථාන වැඩි ජෛව විවිධත්වයක් ඇති ප්‍රදේශ වල පිහිටා තිබෙන බැවින් ඉදිකිරීම් ශ්‍රම බලකාය දඩයම් කිරීමට පෙළඹීමේ **විශාල හැකියාවක්** පවතින අතර එය **වනජීවින් වෙත විශාල බලපෑමක් ඇති කරයි.** |
| | **ගිනි උවදුරු/ ලැව් ගිනි**<br>ඉදිකිරීම් සේවකයන් වගා වලට ගිනි තැබීම, සිගරට් කොට විසි කිරීම හෝ ඝන අපද්‍රව්‍ය පිළිස්සීම නිසා හිතාමතා හෝ අත්වරද්දෙන් ගිනි ගැනීම් ඇති කළ හැකිය. | • **ස්වභාවික පරිසර පද්ධතියට හානි වීම**<br>මෙම ක්‍රියාකාරකම් නිසා ලැව් ගිනි ඇති විය හැක **මෙම වනාන්තර ආසන්නයේ තිබෙන ස්ථාන වලට වියලි කාලවලදී ඇති අවධානම ඉතා අධික වේ .** |
| | **විවෘත ස්ථාන වල මලපහ කිරීම හා කුණු දැමීම** | • **භාවිතා කරන ජලය මලපහ හේතුවෙන් දූෂණය වීම**<br>මලපහ මඟින් භාවිතා කරන ජල මූලාශ්‍ර දූෂණය කළ හැකි අතර එමඟින් ජලය මඟින් පැතිරෙන ලෙඩරෝග |

| | | |
|---|---|---|
| | සේවකයන් විසින් විවෘත ස්ථාන වල මලපහ කිරීම හෝ මුත්‍රා කිරීම සිදු කළ හැකිය.<br>ඝන අපද්‍රව්‍ය පොලව මතට හෝ ඇළවල් වලට විසි කළ හැකිය. | ව්‍යාප්ත විය හැක. සමහර ස්ථාන වල ජනතාව නෑමට, සේදීමට හා වෙනත් ගෘහ කටයුතු සඳහා ජලය භාවිතා කරයි. **ඔවුන්ගේ ජල මූලාශ්‍ර දූෂණය විය හැකි බැවින් ඇතිවන බලපෑම ඉතා අධික වේ**<br>**තැන තැන කුණු දැමීම මඟින් දෘශ්‍ය දූෂණයක්/ජල දූෂණය ද සිදු විය හැක.** |
| | **ගිනි අවි හා ආයුධ භාවිතා කිරීම**<br>සේවකයන් විසින් බලපත්‍ර නොමැති ගිනි අවි, තුවක්කු, පිහි ළඟ තබා ගතහැක. | • **ගිනි අවි වලින් සිදු වන තුවාල**<br>ඔවුන් විසින් මෙම ආයුධ දඩයම් කිරීමට හා මිනිසුන්ට තුවාල කිරීමට යොදා ගත හැක. එමනිසා මෙමඟින් ඇතිවන බලපෑම **සැලකිය යුතු තරම් වේ.**<br>වගුව 7 |
| v. **පුද්ගලික දේපල ව්‍යාපෘති කටයුතු සඳහා භාවිතා කිරීම** | **පුද්ගලික ඉඩම්** අවම කිරීමේ ව්‍යුහ ස්ථාපිත කිරීම සඳහා, අමුද්‍රව්‍ය හා යන්ත්‍ර ගබඩා කිරීම සඳහා සහ ස්ථාන වෙත පිවිසීම සඳහා භාවිතා කරයි. | • **වටිනා භූමි පරිභෝජනයට ගැනීමට නොහැකිවී යාම**<br>ඉඩම් අයිතිකරුවන්ට තමන්ගේ ඉඩම් ඉදිකිරීම් කටයුතු සඳහා ලබා දීමට සිදු වීම නිසා ඉඩම් වල පෙර පැවති වටිනා පරිභෝජන අවස්ථා අහිමි වී යා හැක (ඉඩම් අත්පත් කර ගැනීමට ව්‍යාපෘතිය අපේක්ෂා නොකරන අතර ඒ සඳහා වන්දි මුදල් ගෙවීමක් සිදු නොවේ.)<br>මෙම ඉඩම් දැනටමත් නායයෑමේ තර්ජනයට මුහුණ පා ඇත. එම නිසා වර්තමාන අවදානම් තත්වය යටතේ ඉඩම් භාවිතා කිරීම නුසුදුසු වන අතර එමඟින් ඉඩමේ පවතින දේපල වලටද අවදානම් තත්වයක් ඇති කරයි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මඟින් ඉඩම් වල ස්ථායිතාව වැඩි කරන අතර එමඟින් අසල ඇති අවදානම් ඉඩම් වලටද යම් ස්ථායිතාවක් ලබා දේ.<br>i. මෙය ඉඩම් අයිතිකරු සඳහා **විශාල ධනාත්මක බලපෑමක්** ගෙන දුන්නද ව්‍යාපෘතියේ ඇති කොන්දේසි වලට අනුව මෙම ඉඩම් පෙර පරිදි නැවත භාවිතා කිරීමට නොහැකි වීම නිසා **ඍණාත්මක බලපෑම්ද** ඇති වේ. එ අහිමි වී යන පරිභෝජනය අවස්ථා වන්නේ |
| | | ii. අයිතිකරුව එම ඉඩමේ කිසිදු සංවර්ධන කටයුත්තක් හෝ ඉදිකිරීමක් සිදු කළ නොහැක.<br>iii. අදායම් ලැබෙන කිසිදු ක්‍රියාකාරකමක් සිදු කළ නොහැකි වීමට ඉඩ තිබීම.<br>iv. තේ, කුළුබඩු හා විවිධ ප්‍රයෝජන ඇති වෙනත් බෝග වගා කිරීම සිදු කළ නොහැකි විය හැකි වීම. |
| vi. **ඉඩම් සඳහා තිබෙන ප්‍රවේශය නැති වී යාම** | **ප්‍රජාවට ප්‍රවේශ වීමේ හැකියාව නැති වී යන අතර ඉදිකිරීම් අවස්ථාවේදී ප්‍රවේශය සඳහා අවහිර විම් සිදු වේ.** | • වාහන ගමන් කිරීම හා නවතා තැබීම, අමුද්‍රව්‍ය ගබඩා කර තැබීම, සේවකයන් නිසා හටගන්නා කලබලකාරී තත්ත්ව වැනි හේතු නිසා ව්‍යාපෘති ඉදිකිරීම් අදියරේදී ඉඩම් සඳහා තිබෙන ප්‍රවේශය සඳහා ඍණාත්මක බලපෑම් ඇති විය හැක. |

| | | |
|---|---|---|
| vii. **ඉදිකිරීම් කටයුතු සඳහා ස්ථාන එළිපෙහෙළි කිරීම** | **ස්ථානය එළිපෙහෙළි කරනු ලබන අවස්ථාවේදී දේපල වලට හානි වීම**<br>සමහරක් ස්ථාන වල නායයෑම් මඟින් හානියට පත් ව්‍යුහ (හානි වූ නිවස, වෙළඳසැල්, ගොඩනැගිලි) හෝ විවිධ දේ සඳහා ප්‍රයෝජනයට ගැනෙන ව්‍යුහ (කාණු, තාප්ප, භූ විෂමතා සාධක) දැක ගත හැකි වේ<br>.<br>ඉදිකිරීම් කටයුතු වලදී මෙම සමහරක් ව්‍යුහ කඩා දැමීම හෝ එම ස්ථානයෙන් ඉවත් කිරීම සිදු කළ යුතු වේ. | . **ඉඩම් අහිමි වීම නිසා සිදුවන බලපෑම්**<br>ඉඩමේ/ නිවසේ අයිතිකරුට ඒ සඳහා තමාට තිබූ අයිතිය නැති වේ. ඉඩමේ ඇති ව්‍යුහ ඉවත් කිරීමට අයිතිකරු අකමැති වීමට පුළුවන. එම අවස්ථාවේදී අයිතිකරුගේ අකමැත්තෙන් කොන්ත්‍රාත්කරුවන් විසින් එම ව්‍යුහ ඉවත් කරනු ලැබේ.<br>මෙම ව්‍යුහ වල තිබෙන සමහර වටිනා කොටස් හා නැවත භාවිතා කළ හැකි කොටස් ස්ථානය එළිපෙහිලි කිරිමේදී නැති වී යා හැක.<br>ව්‍යුහ සඳහා, විශේෂයෙන්ම හානියට පත් ව්‍යුහ සඳහා, කිසිදු වන්දි මුදලක් ලබා නොදේ.<br><br>**මෙය අයිතිකරුවන් අතර නොසතුටුදයක තත්වයක් ඇති කරනු ලබන අතර ඒ හේතුවෙන් ස්ථාන එළිපෙහිලි කිරීම සඳහා අකමැති වීම, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිලිබදව විරෝධතා ඇති කිරීම සහ එම ස්ථාන වල දීර්ඝ කාලීන අධීක්ෂණ කටයුතු සඳහා විරෝධය දැක්වීම වැනි දේ සිදු විය හැක.** |
| viii. **රක්ෂිත ප්‍රදේශ වල සිදු කරනු ලබන ඉදිකිරීම් කටයුතු** | **අරගල හා කෝලාහල**<br>බොහෝ අවම කිරීමේ ස්ථාන මාර්ග රක්ෂිත වල පිහිටා ඇත. සමහරක් පාරිසරිකව සංවේදී රක්ෂිත වල පිහිටා ඇත.<br>ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අයත් වන භූමි ,වනාන්තර හා ඉඩම් තිබිය හැක. | vi. **අනවසර ඇතුල්වීම් හා ඒවායේ වැඩ කිරීම් හේතුවෙන් ඇතිවන ගැටළු**<br>• වෙනත් ආයතන වලට අයිති ඉඩම් වලට ඇතුළු වීම හෝ අනවසරයෙන් ඉදි කිරීම් කටයුතු සිදු කිරීම නිසා ගැටළු ඇති විය හැකිය.<br>• එසේ නොමැති නම් අදාල සංරක්ෂිත රෙගුලාසි මඟින් පනවන ලද කොන්දේසි උල්ලංඝනය විය හැක.<br>• මේ හේතුවෙන් අදාල ආයතන හා ව්‍යාපෘති කණ්ඩායම අතර ගැටළු ඇතිවිය හැකි අතර ඒ හේතුවෙන් ව්‍යාපෘතිය කිරීම පමා වීම මෙන්ම නීතිමය ක්‍රියාමාර්ග වෙත යෑමට පවා සිදුවිය හැක. |
| ix. **ශ්‍රම කඳවුරු** | **ශ්‍රම කඳවුරු පවත්වාගෙන යාම**<br>මෙම ව්‍යාපෘතිය සඳහා විවිධ ස්ථානවල ශ්‍රම කඳවුරු පිහිටුවීමට අවශ්‍ය වේ.<br>කොන්ත්‍රාත්කරුන්ට චලනය වීමට ඇති හැකියාව මත එක පැකේජයකට හෝ පැකේජ කිහිපයකට එකක් වශයෙන් ශ්‍රම කඳවුරු ස්ථාපිත කෙරේ.<br>මේ සඳහා ගත හැකි ක්‍රියාමාර්ගය වන්නේ අදාල ස්ථානයට ආසන්නයේ හෝ අවට නගරයකින් නිවාසයක් කුලියට ගැනීමයි. | ii. **අසල්වාසීන් සඳහා ඇතිවන ගැටළු හා කරදරකාරී තත්ත්ව**<br>විධිමත් චර්යා රටාවක් නොමැතිව මෙම කඳවුරු ක්‍රියාත්මක වුවහොත් සේවකයන්ගේ නොමනා හැසිරීම්, මත්පැන්, රණ්ඩු, අපද්‍රව්‍ය බැහැර කිරීම, ශබ්දය, අනාචාර, මත්කුඩු, දූෂණයන වැනි දේ ඇති විය හැක.<br><br>ii. එමෙන්ම ව්‍යාපෘතිය අවසන් වූ පසු කොන්ත්‍රාත්කරුවන් විසින් මෙම කඳවුරු විධිමත් ලෙස වසා නොදැමීම නිසා එකතු වූ අපද්‍රව්‍ය හෝ විසඳා නොමැති ගැටළු හේතුවෙන් අසල්වාසීන් අතර කලබලකාරී තත්ත්ව ඇති විය හැක.<br><br>ix. කොන්ත්‍රාත්කරුවන් මඟින් ඉදිකරන ලද තාවකාලික කඳවුරු වල වැසිකිලි, ජලය වැනි විධිමත් සනීපාරක්ෂක පහසුකම් නොතිබිය හැක. අනවසරයෙන් අපද්‍රව්‍ය බැහැර කිරීම, විවෘත පරිසරයේ මලපහ කිරීම, නෑමට හා අනෙකුත් සනීපාරක්ෂක කටයුතු සඳහා ප්‍රජාව සතු ජල පහසුකම් භාවිතා කිරීම වැනි හේතු නිසා |

| | | |
|---|---|---|
| | එමෙන්ම හිස් ඉඩම් හෝ පොදු ඉඩම් බද්දට ගැනීම මඟින් තාවකාලික ද කඳවුරු ඉදි කළ හැකි වේ. | **අසල්වාසීන්ට සැලකිය යුතු මටටමේ කලබලකාරී තත්ත්ව ඇති විය හැකි අතර ඒ හේතුවෙන් ගැටළු හා රණ්ඩු ඇතිවිය හැක.** |

## 4.6 යෝජිත අවම කිරීමේ ක්‍රියාමාර්ග

අවම කිරීමේ ක්‍රියාමාර්ග අදියර තුනකදී ක්‍රියාත්මක වේ, එනම් i) සැලසුම් අදියරේ අවම කිරීමේ කටයුතු ii) ඉදිකිරීම් අදියරේ අවම කිරීමේ කටයුතු සහ iii) ක්‍රියාත්මක කරන හා නඩත්තු අදියරේ අවම කිරීමේ කටයුතු. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන විවිධ අදියර වලදී භාවිතා කරනු ලබන නායයෑම් අවම කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳව පහත දැක්වේ.

### 4.6.1 සැලසුම් පාදක කරගත් අවම කිරීමේ ක්‍රියාමාර්ග

සැලසුම්කරණ අවධියේ සිදුකරන අවම කිරීමේ ක්‍රියාමාර්ග, ව්‍යුහාත්මක සැලසුම් නිර්මාණයේදී සැලකීමට ගත යුතුය. මෙම ව්‍යාපෘතියට අදාලව ඉහල පාරිසරික හා සමාජයීය වැදගත්කමක් ඇති කරුණු පහත දැක්වේ. කෙසේ වුවද, ව්‍යුහාත්මක සැලසුම් නිර්මාණ සැමවිටම තාක්ෂණික, මුල්‍ය සහ පිරිවැය ප්‍රතිලාභ සමඟ සම්බන්ධ වන නිසා, සැලසුම්කරණ අවධියේ සිදුකරන අවම කිරීමේ ක්‍රියාමාර්ග, සැමවිටම අදාල ස්ථානට අනුකූල වන පරිදි සැලසුම් කළ යුතුය. ස්ථානයට අදාලව අවම කිරීමේ සැලසුම් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වන වැදගත් පාරිසරික හා සමාජයීය අවම කිරීමේ ක්‍රම ස්ථානීය පාරිසරික සහ සමාජයීය කළමනාකරණය සැලසුම් මඟින් ලබා දේ. මෙම කරුණු අදාල ස්ථානය වෙත කොතරම් දුරට අදාල වන්නේද යන්න ව්‍යාපෘති කළමනාකරණ කණ්ඩායම හා ව්‍යුහ නිර්මාණය කිරීමේ කණ්ඩායම ඇගයීමට ලක් කර බැලිය යුතුය.

i. **ස්වභාවික සම්පත් කළමනාකරණය හා සම්පත් උපරිම ලෙස භාවිතයට ගනු ලබන සැලසුම්**

ව්‍යාපෘති සැලසුම් කිරීමේදී විශාල වශයෙන් වෘක්ෂලතා ආවරණ ඉවත් නොකිරීමටත් වැඩුණු ශාක ඉවත් නොකිරීමටත් හැකි තරම් වගබලා ගත යුතුය. වැදගත් ශාක විශේෂ හමු වුවහොත් එම ශාක සංරක්ෂණය කරන ආකාරය පිළිබඳව සැලකිල්ලට ගත යුතුය.

පරිසර විද්‍යාත්මකව සංවේදී ස්ථානවල විශාල වශයෙන් වෘක්ෂලතා ඉවත්කිරීමට හෝ ගැඹුරු කානු සෑදීමට සිදු වන්නේ නම් එම ස්ථානවල වාසස්ථාන වල සම්බන්ධතාවය, සතුන්ට ගමන් කළ හැකි මාර්ග හා වෘක්ෂලතා තීරු යනාදිය පවතින පරිදි සැලසුම නිර්මාණය කළ යුතුය.

ii. **ජල සම්පත් සංරක්ෂණය කිරීම**

බොහෝ සැලසුම් වලදී පෘෂ්ඨීය හා අභ්‍යන්තර ජල පරිවහනය පිළිබඳව සැලකීමට ගනී. ඒ නිසා පෘෂ්ඨීය හා අභ්‍යන්තර ජලය ඉවතට ගැනීම සිදු වේ. මෙම ජලය ඉතා හොඳ ගුණාත්මකභාවයකින් යුක්ත වේ. මනාව සිදුකරන ලද සැලසුමකදී මෙම ජලය වනජීවීන්ගේ, අසල්වාසී ප්‍රජාවගේ ස්නානය සඳහා මෙන්ම බීමට ගැනීම වැනි වෙනත්

ගෘහ අවශ්‍යතා සඳහා භාවිතා කළ හැකි ආකාරයෙන් ප්‍රවාහනය කිරීම සිදු කළ හැකිය. ප්‍රජාව සමඟ කළ සාකච්ඡා වලට අනුව බොහොමයක් ගම්බද ප්‍රදේශ වල පොදු ජල පහසුකම් නොමැතිවීම හේතුවෙන් වියලි කාලවලදී ජල හිඟයක් පවතින බව දැන ගත හැකි විය. මනාව කරන ලද සැලසුමකදී මෙම ඉවතට ගන්නා ජලය ගෘහාශ්‍රිත ජල ප්‍රභවයක් ලෙස භාවිතා කිරීමට හැකි වනු ඇත. වියලි කාලවලදී ජල හිඟය පොදු කරුණක් වන හෙයින් මෙම ක්‍රමය වඩාත්ම නිර්දේශ කෙරේ.

ප්‍රදේශයේ ජීවත් වන බොහෝ ග්‍රාමීය ජනයා තමන්ගේ ගෘහ කටයුතු සඳහා උල්පත් ජලය භාවිතා කරයි. අවම කිරීම සඳහා තෝරා ගෙන තිබෙන බෑවුමකින් ගලා එන ජලය පුද්ගලික හෝ ප්‍රජාවක් සඳහා ජල සැපයීමක් ලෙස භාවිතා කරන්නේ නම් එම ජලය අවම කිරීමේ ක්‍රියා හේතුවෙන් දූෂණයට ලක් වී තිබීමේ හැකියාවක් පවතී. එයට හේතුව වන්නේ මෙම ක්‍රියාවලියේදී ජලපරිවහනය ක්‍රමවත් කිරීම සඳහා අභ්‍යන්තර ජල මට්ටම අවම කිරීමට ක්‍රියා මාර්ග ගැනීමයි. එවැනි අවස්ථා වලදී ප්‍රජාව සඳහා ලබා ගත හැකි විකල්ප ජල පහසුකම් පිළිබඳව (තාවකාලික හෝ ස්ථිර) සැලසුමේ සඳහන් විය යුතුය.

**iii. සෞන්දර්යාත්මකව ගැලපෙන සැලසුම් සැලකිල්ලට ගැනීම**

සෞන්දර්යාත්මකව සංවේදී පරිසරයක සිදු කරනු ලබන සැලසුම් වලදී දෘශ්‍ය දූෂණය අවම කිරීම සඳහා භාවිතා කරනු ලබන ව්‍යුහ ස්වභාවික පරිසරය සමඟ ගැලපෙන අයුරින් සැලසුම් කළ යුතුය. අවම කිරීම සඳහා යෝජිත බොහෝ ස්ථාන ස්වභාවික අලංකාර බවින් යුතු ප්‍රදේශ වල පිහිටි මාර්ග දෙපස පිහිටා ඇත. බෑවුම් වල අවම කිරීමේ වැඩ, පරිපූර්ණ හැඩතල ගත් කොන්ක්‍රීට් ව්‍යුහ හා සිමෙන්ති ආවරණය වූ භාවිතා කර තනා තිබුණහොත් එය පරිසර හිතකාමී මඟීන්ගේ දෑස් වලට හිතකර දසුනක් නොවනු ඇත. එම නිසා සෞන්දර්යාත්මකව සංවේදී ස්ථානව වල අවම කිරීමේ ව්‍යුහ නිර්මාණය කරන විට එම ව්‍යුහ ස්වාභාවික පරිසරය සමඟ ගැලපෙන පරිදි තෝරා ගත යුතුය. සෞන්දර්යාත්මකව ගැලපෙන ව්‍යුහ නිර්මාණය කිරිමේදී භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පියෙකුගේ සේවය ලබා ගැනීම වැදගත් වනු ඇත.

**iv. හරිත පාරිසරික ලක්ෂණ සැලකීමට ගැනීම**

බොහෝ අවම කිරීමේ ක්‍රියාවන් පාරිසරිකව සංවේදී වාසස්ථාන ආශ්‍රිතව සිදු කරනු ලබන බැවින් හරිත පාරිසරක සැලසුම් හැකිතරම් භාවිතා කිරීම නිර්දේශ කරනු ලබන අතර ඒ සඳහා උදාහරණ ලෙස ඛාදනය පාලනය කිරීම සඳහා එම ප්‍රදේශයේ පවතින වෘක්ෂලතා භාවිතයට ගැනීම, පරිසරයේ විවධත්වය ආරක්ෂා කිරීම සඳහා විවිධ ශාක භාවිතා කිරීම වැනි ක්‍රම දැක්විය හැකිය.

**v. ඛාදනය පාලනය කිරීමේ ව්‍යුහ**

ජලපරිවහනය කළමනාකරණය කිරිමේදී ජලය ඉවතට රැගෙන බෝක්කුවක් ආධාරයෙන් අසල පිහිටි ඇළක් වෙත යොමු කිරීම සිදු වේ. වර්ෂා කාලවලදී මෙම කාණුවල ගලා යන ජල මට්ටම ඉහල බැවින් ඇළවල් වල පතුලේ හා ඉවුරුවල ඛාදනය විම් ඇතිවිය හැක. එම නිසා මෙම ජලය ස්වභාවික ඇළ මාර්ග වලට ඇතුළු වීමේදී එහි වේගය බාල කළ හැකි බාධක සැලසුම් කිරීම පිළිබඳව අවධානය යොමු කළ යුතු වේ. මෙය සැලසුමේ ඇතුලත් එක් කොටසක් විය යුතුය.

**vi. අඩු පසුකාලීන නඩත්තු හා මෙහෙයුම් අවශ්‍ය කෙරෙන සැලසුම්**

අවම කිරීමේ ක්‍රියාවලියේදී ජලපරිවහනය කළමනාකරණය කිරිම සඳහා ගුරුත්ව කානු වැනි තාක්ෂණික ක්‍රම සැලකිල්ලට ගත යුතුය. මෙම කානු අවහිර වීම වැලැක්වීම සඳහා නිවැරදි ජලනල විෂ්කම්භයක් හා සිදුරු විෂ්කම්භයක් භාවිතයට දයොදන ආනතිය පිළිබඳව ද සැලකිය යුතුය. දීර්ඝ කාලීන පැවැත්මක් සඳහා ඛාදන වලට ඔරොත්තු දිය හැකි සැලසුම්, අවසාදිත එක්රැස් කර ගන්නා ව්‍යුහ වැනි අඩු නඩත්තු

ව්‍යුහ හා සැලසුම් නිර්දේශ කෙරේ. ප්‍රාදේශීය කාලගුණික තත්ත්ව යටතේ දිගු කාලයක් පවතින් ද්‍රව්‍ය මෙම ව්‍යුහ නිපදවීම සඳහා තෝරා ගත යුතුය. වානේ ව්‍යුහ භාවිතා කරන්නේ නම් සැලසුම් කිරිමේදී මල බැඳීම නැවත්වීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතුය. භූගත කාණු වල මතුපිටට දමන පාංශු ස්ථරය සියුම් අංශු වලින සැදුම්ලත් පසක් නම් කාණුව සිරවී යාම වලක්වාලීම සඳහා සුදුසු ජියෝටෙක්ස්ටයිල් එකක් භාවිතා කිරීම නිර්දේශ කෙරේ.

vii. **ආරක්ෂක ව්‍යුහ ඇතුලත් කිරීම**

පොදුජන ආරක්ෂාව සඳහා සමහර ස්ථාන වලට ආරක්ෂක ව්‍යුහ ඇතුලත් කිරීම සිදු කළ යුතු වේ. උදාහරණයක් ලෙස අදාල ස්ථානය පාසලක හෝ මාර්ගයක පහල බෑවුමේ පිහිටා තිබේ නම් ආරක්ෂක බැම් සවි කිරීම දැක්විය හැක. සැලසුම් කණ්ඩායම විසින් ඉහත සඳහන් කළ ආරක්ෂක අවශ්‍යතා සඳහා විශේෂ අවධානයක් යොමු කර ස්ථානයට ගැලපෙන පරිදි සැලසුම් නිර්මාණය කළ යුතුය.

viii. **පොදු යටිතලපහසුකම් සඳහා සහය පහසුකම් ඇතුලත් කිරීම**

සමහරක් අවම කිරීමේ ස්ථාන වල වැදගත් පොදු යටිතලපහසුකම් තිබිය හැකිය. අවම කිරීමේ කටයුතු හේතුවෙන් උප පහසුකම් ඉවත් වීමක් සිදු වනු ඇත. උදාහරණයක් ලෙස සමහරක් ස්ථාන හරහා ජලසැපයුම් නල මාර්ග ගමන් කිරීම දැක්විය හැක. අවම කිරීමේ ක්‍රියාවලියෙන් පසුව මෙම නල නැවතත් තිබූ ස්ථානයේම ස්ථිරව පිහිටුවීම සිදු කළ යුතු වේ. අවම කිරීමේ සැලසුමේදී එම ස්ථානය හරහා තිබෙන ජල සැපයීම සඳහා උපකාරි වන පහසුකම් ස්ථාපනය කිරීම සිදු කළ හැක.

එමෙන්ම සමහරක් ස්ථාන පුද්ගලික/ පොදු ජලය ලබා ගන්නා මුලාශ්‍ර විය හැක. ව්‍යාපෘතිය හේතුවෙන් උල්පත් සිඳී යා හැක මෙවැනි අවස්ථාවලදී නව ජල උල්පත්, ගබඩා කිරීම වැනි වෙනත් ජල පහසුකම් පිළිබඳව සැලකිල්ලට ගත යුතු අතර ඒවා සැලසුම් වලට ඇතුලත් කළ යුතුය.

### 4.6.2 ඉදිකිරීම් අදියරේදී ඇතිවන බලපෑම් අවම කිරීම

ඉදිකිරීම් අදියරේදී සිදු කරනු ලබන අවම කිරීමේ ක්‍රියාමාර්ග, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේදී සිදු කරනු ලබන අවම කිරීමේ ක්‍රියාවලි වලින් මූලික තැනක් ගනී. ඉදිකිරීම් අවස්ථාවේ සිදු කරනු ලබන අවම කිරීමේ ක්‍රියාමාර්ග කොන්ත්‍රාත්කරුගේ වගකීමක් වේ. පහත දැක්වෙන්නේ, ව්‍යාපෘතියක ඉදිකිරීම් අවස්ථාවේදී සැලකිය යුතු වැදගත් අවම කිරීමේ ක්‍රියාමාර්ග වේ.

**වගුව 8: ඉදිකිරීම් අදියරේදී පාරිසරික බලපෑම් අවම කිරීම**

| අපේක්ෂිත බලපෑම | යෝජිත අවම කිරීමේ ක්‍රම |
|---|---|
| I. **ස්වභාවික වන ආවරණයට හානි වීම (භෞමික සහ ජලජ පරිසර පද්ධති)** | ඉදිකිරීම් අතරතුර විශාල තීරු වශයෙන් වෘක්ෂලතා ඉවත් කිරීම මඟ හරවා ගත යුතුය. අවශ්‍ය වූ විට ගස් ඉවත් කළ යුතුය.<br>i. වාසභූමි අතර සබඳතාව වෙත බලපෑම් එල්ල වුවහොත් සම්බන්ධිකාරක වෘක්ෂලතා බිම් කඩවල්, සතුන් සඳහා මංකඩ යනාදිය තැබිය යුතුය.<br>ii. විෂ්කම්භය මිමි.18ත වඩා වැඩි වන ගස් කැපීමට සිදු වේ නම් එම ගස් පළමුව සලකුණු කිරීම, හඳුනා ගැනීම සහ කැපීමට හා ප්‍රවාහනය කිරීමට ප්‍රාදේශීය ලේකම් මාර්ගයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් අවසර ලබා ගැනීම යනාදිය සිදු කළ යුතුය.<br>iii. ඇළවල් වල ඉවුරු ආශ්‍රිතව තිබෙන ශාක හානියට පත් නොකළ යුතුය. ඇළවල්වල ඉවුරු වල තිබෙන ශාක ව්‍යපෘති ක්‍රියාකාරකම් |

| | |
|---|---|
| | සඳහා ඉවත් කිරීමට සිදු වන්නේ නම් එම ඉවුරු ආරක්ෂා කර ගැනීම සඳහා ඛාදනය අවම කරන ව්‍යුහ හඳුන්වා දිය යුතු වේ.<br>iv. සියලුම ස්ථාන වල අවසාදිත ගලා යාම නතර කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අනිවාර්ය වේ. විවෘත බෑවුම් මුහුණත්, සුන්බුන් තැන්පතු, අමුද්‍රව්‍ය තැන්පතු ආදිය ආවරණය කිරීම අත්‍යවශ්‍ය වේ. සියලුම ස්ථාන වල අවසාදිත ගලා යාම පාලනය කිරීම සඳහා අවශ්‍ය පියවර තිබිය යුතු අතර ඒ සඳහා අවසාදිත රැඳවුම් පද්ධති සහ අවසාදිත ඇළවල් වලට එකතු වීම වැලැක්වීම සඳහා සිදු කළ හැකි තාවකාලික ක්‍රම භාවිතා කළ හැක.<br>v. සැලකිය යුතු මට්ටමේ ගස් ප්‍රමණයක් ඉවත් කිරීමට සිදු වේ නම් එයට සරිලන ප්‍රමාණයේ ගස් ප්‍රමාණයක් නැවත සිටවිය යුතු වේ. |
| **II. ආක්‍රමණික විශේෂ** | • ඛාදනය අවම කිරීම සඳහා වෘක්ෂලතා භාවිතා කිරීමේදී ආක්‍රමණික විශේෂ යොදා නොගත යුතුය. වෘක්ෂලතා ආවරණ සඳහා එම ප්‍රදේශයට අවේණික ශාක තෝරා ගත යුතුය. වෘක්ෂලතා ආවරණ සඳහා යොදා ගන්නා ශාක සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් අවසර ලබා ගත යුතුය. වෘක්ෂලතා ආවරණ සඳහා ලපටි ගස් ලබා ගැනීමට අවශ්‍ය නම් පෙර කරන ලද දැනුම් දීමකින් පසුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පැල තවානකින් ඒවා ලබා ගත හැකිය. |
| **III. ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය දැව ලබා ගැනීමට ගස් කැපීම** | • මොනම හේතුවක් මත වුවද කොන්ත්‍රාත්කරුට ඉදිකිරීම් කටයුතු සඳහා සහයක් ලෙස ප්‍රදේශයේ පවතින ගස් කැපීම සිදු කළ නොහැක. අවශ්‍යම අවස්ථාවකදී හැර අන් සියළුම අවස්ථා වලදී පලංචි හා ආධාරක ව්‍යුහ සඳහා කොන්ත්‍රාත්කරුවන් විසින් දැවමය නොවන ද්‍රව්‍ය භාවිතා කිරීම අනිවර්ය වේ. කොන්ත්‍රාත්කරුගේ කොන්දේසි වල ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රදේශයේ පවතින දැව භාවිතා කිරීම නොකළ යුතු බව දැඩිව අවධාරණය කර තිබිය යුතුය. |
| **IV. අදාල ස්ථානයේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේදී සිදුවන දූෂණය අවම කිරීම** | • විමෝචනය වීම් හා දූෂණය වීම් පාලනය කිරීම පිළිබඳව කොන්ත්‍රාත්කරුගේ කොන්ත්‍රාත්තුවේ සඳහන් විය යුතුය. ජාතික පාරිසරික රෙගුලාසි වලට අනුකූලව ඔහු විසින් දූෂණය පාලනය කිරීම (දූවිලි හා දුම්), ශබ්දය හා කම්පන පාලනය කිරීම, අපජලය බැහැර කිරීම හා ජල දූෂණය. ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම වැනි දේ සිදු කළ යුතුය. |
| **V. භූමියේ සිදුවන කම්පන** | • අවට ප්‍රදේශයේ නිවාස සහ ව්‍යුහ, විශේෂයෙන්ම පැරණි ගොඩනැගිලි, ඉරිතැලීම් ඇති ගොඩනැගිලි හා පන්සල් වැනි ගොඩනැගිලි ඇති අවස්ථා වලදී ප්‍රබල යන්ත්‍ර භාවිතා කිරීමේ දී කොන්ත්‍රාත්කරු සැලකිලිමත් විය යුතුය. මධ්‍යම පරිසර අධිකාරිය මඟින් නිර්දේශ කර ඇති සීමා වලට යටත්ව මෙම යන්ත්‍ර ක්‍රියා කරවීම පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය. |
| **VI. වාහන තදබදය පාලනය කිරීම** | • මාර්ග රක්ෂිත ආශ්‍රිතව ඉදිකිරීම් කටයුතු සිදු කරන අවස්ථා වලදී වාහන තදබදය පාලනය කිරීම සම්බන්ධ සම්පූර්ණ සැලැස්මක් කොන්ත්‍රාත්කරුගේ වාර්තාවේ සඳහන් විය යුතුය.<br>• මෙම ස්ථාන මාර්ග වල වංගු ආසන්නයේ, පටු මාර්ග ආසන්නයේ, දැඩි බෑවුමක් ඇති මාර්ග ආසන්නයේ, අධි තදබදයක් ඇති මාර්ග ආසන්නයේ හෝ පාසැල් හෝ රෝහල් ආශ්‍රිතව පිහිටා තිබිය හැක. එම නිසා ස්ථානීය ආරක්ෂාව ද සමග සිදු කරනු ලබන විශේෂිත වාහන තදබදය පාලනය කිරීමේ සැලැස්මක් අනිවාර්ය වේ.<br>• මෙහි සංඥා පුවරු, අදාල ස්ථානයට හා එහි සංවේදීතාවයට සරිලන පරිදි බාධක, නිරතුරුවම සිටින නිරීක්ෂකයෙකු හා රාත්‍රී විදුලි ලාම්පු අංග ඇතුලත් විය යුතුය. |
| **VII. ස්ථාන වෙත ප්‍රවේශය** | • පදිංචිකරුවන්ගේ ප්‍රවේශ මාර්ග අවහිර නොකිරීම කොන්ත්‍රාත්කරු සතු වගකීමක් වේ. පදිකයන්ට හා එම ප්‍රදේශයේ පදිංචිකරුවන්ට අවහිරයක් නොවන පරිදි ව්‍යාපෘති වැඩ භූමිය සැලසුම් කරගෙන |

| | |
|---|---|
| | වෙන් කර ගත යුතුය. ඉදිකිරීම් ද්‍රව්‍ය හා කසල සහ යන්ත්‍ර නවතා තැබීම මඟින් ප්‍රවේශ මාර්ග අවහිර නොකිරීමට වගබලා ගත යුතුය. මෙවැනි සිදුවීම් වැලැක්වීමට ස්ථානය සුදානම් කිරිමේදී පූර්ව සැලසුම් සිදු කළ යුතු වේ.<br>**ඉතාම කලාතුරකින් පහත සඳහන් අවස්ථාද ඇතිවය හැකිය**<br>• ව්‍යාපෘතිය මඟින් ප්‍රවේශ මාර්ග වලට බලපෑමක් සිදු වේ නම් එම මාර්ග භාවිතා කරන්නන් සඳහා වන්දි මුදලක් ලබා දේ.<br>• අවදානම් කලාපයෙන් බැහැරව තිබෙන ව්‍යාපාර හෝ අදායම් මාර්ගයකට හානි සිදු වේ නම් AP හි එකඟතාවයට අනුව වන්දි මුදලක් ලබා දේ (අර්ථවත් උපදෙස් සාකච්ඡාවක් හරහා). |

| අපේක්ෂිත බලපෑම | යෝජිත අවම කිරීමේ ක්‍රම |
|---|---|
| **VIII. සේවා පහසුකම් වලට හානි සිදුවීම** | • ඉවත් කළ යුතු හෝ හානි සිදු විය හැකි සේවා පහසුකම් පිළිබඳ විධිමත් තක්සේරුවක් කිරීම කොන්ත්‍රාත්කරුගේ වගකීමක් වේ. උදා: සන්නිවේදන රැහැන්, විදුලි රැහැන්, ජලනල, මාර්ග, කානු මෙම පහසුකම් අදාල පාර්ශව වල අනුමැතිය ඇතිව (ආයතන හා අයිතිකරුවන්) එම ස්ථාන වලින් ඉවත් කර වෙනත් ආරක්ෂක ස්ථානයක පිහිටුවීම සඳහා අවශ්‍ය පූර්ව පියවර ගත යුතුය. මෙමඟින් හානිවීම් වැලැක්වීම, ඉදිකිරීම් අතරතුර සිදුවන හානි වීම් අවම වීම හා හානි සිදු වුවහොත් ඒවා නිවැරදි කිරීම හෝ ඒ සඳහා වන්දි ගෙවීම සිදු කළ හැකිය. මෙය කොන්ත්‍රාත්කරුගේ ලංසු ලියකියවිලි වල ඔහුගේ වගකීමක් ලෙස ඇතුලත් කළ යුතුය. |
| **IX. සංස්කෘතිකව වැදගත් ව්‍යුහ , සිදුවීම් හා පුරා විද්‍යා ත්මකව ස්ථාන** | • සංස්කෘතිකව වැදගත් වන ස්ථාන පැවතියහොත් ඒවාට හානි නොවන ආකාරයෙන් වැඩ පවත්වා ගෙන යෑමට කොන්ත්‍රාත්කරු වගබලා ගත යුතුය. උත්සව දින වලදී ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නැවැත්විය හැකි වේ. සංස්කෘතික දින වලදී අධික ශබ්දයක් නැගෙන හා කම්පන ඇති කරන යන්ත්‍ර භාවිතය තදින් පාලනය කළ යුතුය.<br>i. ඉදිකිරීම් කටයුතු කරගෙන යන අවස්ථාවේදී පුරා විද්‍යාත්මකව වැදගත් වන ස්ථාන හමු වුවහොත් වහාම එම ඉදිකිරීම් කටයුතු නවත්වා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ව්‍යාපෘති අධ්‍යක්ෂක මාර්ගයෙන් පුරා විද්‍යා දෙපාර්තමේන්තුව දැනුවත් කළ යුතුය.<br>ii. මෙය කොන්ත්‍රාත්කරුගේ පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම යටතේ එන වගකීමක් ලෙස සඳහන් කළ යුතුය. |
| **X. දෘශ්‍ය දූෂණය** | i. ඉදිකිරීම් කටයුතු අතරතුර මනා පාලනයක් තබා ගත යුතු අතර එමඟින් දෘශ්‍ය දූෂණය, සෞඛ්‍ය ගැටළු හා පොදුජනයාට සිදුවන අවහිරතා අවම වේ. මෙය කොන්ත්‍රාත්කරුගේ පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම යටතේ එන වගකීමක් ලෙස සඳහන් කළ යුතුය. |
| **XI. අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථාන ප** | i. කොන්ත්‍රාත්කරු විසින් තැන තැන සිදු කරන අනුමත කළ නොහැකි අපද්‍රව්‍ය බැහැර කිරීම් නැවැත්විය යුතුය. ඇළ ඉවුරුවලට හා ඇළවල් වලට අපද්‍රව්‍ය බැහැර කිරීම නොකළ යුතුය. මාර්ග රක්ෂිත අසල අපද්‍රව්‍ය බැහැර කිරීම සිදු නොකළ යුතුය. අපද්‍රව්‍ය බැහැර කිරීම අනුමත කළ ස්ථාන වලට පමනක් ගෙනගොස් දැමිය යුතුය. අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම සඳහා භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙතින් හා පළාත් පාලන ආයතන වලින් පූර්ව අනුමැතිය ලබා ගෙන තිබිය යුතුය. අනුමත කරන ලද ස්ථාන වලට පමණක් අපද්‍රව්‍ය බැහැර කරන බවට තහවුරු කර ගැනීම සඳහා |

| | |
|---|---|
| | ව්‍යාපෘති අධ්‍යක්ෂක කොන්ත්‍රාත්කරු සමඟ සම්බන්ධීකරණය කළ යුතු වේ..<br>ii. දෘශ්‍ය දූෂණය, සෞඛ්‍ය ගැටළු හා පොදුජනයාට සිදුවන අවහිරතා අවම වන පරිදි අපද්‍රව්‍ය බැහැර කිරීම සිදු කළ යුතුය.<br>iii. ඉදිකිරීම් අමුද්‍රව්‍ය ලෙස නැවත ලබා ගත හැකි ද්‍රව්‍ය භාවිතා කිරීම. ස්ථාන පරීක්ෂා කිරීමේදී බොහෝ ස්ථාන වල එතන්හීම හෝ වෙනත් ස්ථාන වල ඉදිකිරීම් අමුද්‍රව්‍යක් ලෙස භාවිතා කළ හැකි විශාල පාෂාණ කුට්ටි තිබෙන බව නිරීක්ෂණය කළ හැකි විය. මෙම ද්‍රව්‍ය යොදා ගැනීම හෝ වෙනත් අයගේ භාවිතයට සුදුසු වන ලෙස ඒවා එම ස්ථානයෙන් ඉවත් කිරීම පිළිබඳව කොන්ත්‍රාත්කරු සැලකිලිමත් විය යුතුය. කෙසේ වුවද, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ව්‍යාපෘති අධ්‍යක්ෂක මඟින් පෙර ලබා ගත් අනුමැතිය සමඟ එසේ කළ යුතු වේ<br>iv. මෙය කොන්ත්‍රාත්කරුගේ පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම යටතේ ඔහුගේ වගකීමක් ලෙස සඳහන් විය යුතුය. |
| **ක්‍රියාත්මක කිරීමේ වගකීම්: ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු** | |

**වගුව 9: ඉදිකිරීම් අදියරේදී සිදුවන සමාජයීය/වෘත්තිමය බලපෑම් අවම කිරීම**

| **බලාපොරොත්තුවන බලපෑම** | **යෝජිත අවම කිරීමේ ක්‍රම** |
|---|---|
| **I. අධි අවදානම් ඉදිකිරීම් කටයුතු, පිපිරවීම් සඳහා පුපුරන ද්‍රව්‍ය යොදා ගැනීම, විශාල යන්ත්‍ර භාවිතා කිරීම** | • සේවකයන්ගේ ආරක්ෂාව, මඟීන්ගේ, පදිකයන්ගේ සහ ප්‍රාදේශීය පදිංචිකරුවන්ගේ ආරක්ෂාව<br>පහත සඳහන් අනිවාර්ය පූර්වාරක්ෂක ක්‍රියා ද ඇතුලත්ව මනාව සකසන ලද ආරක්ෂක කළමනාකරණ සැලසුමක් කොන්ත්‍රාත්කරු විසින් පිළියෙළ කළ යුතු අතර එය ක්‍රියාවට නැංවීමද සිදු කළ යුතුය.<br>i. අස්ථාවර බෑවුම් වලට අදාලව සෞඛ්‍ය හා ආරක්ෂක ගැටළු පිළිබඳ දැනුවත් වීම<br>ii. පුද්ගලික ආරක්ෂක උපකරණ භාවිතා කිරීම<br>iii. රාත්‍රී කාලයේදී හා වර්ෂා කාලයේදී ස්ථාන පරීක්ෂා කිරීමට යෑමෙන් වැළකිය යුතුය.<br>iv. ආරක්ෂක නෙට්, රඳවා ගැනීමේ උපක්‍රම (පෙරලෙන ගල් නැවත්වීමට හා පාෂාණ කැබලි නැවත්වීමට යොදන රැඳවුම් පස් බැමි) වැනි ආරක්ෂණ පූර්වාරක්ෂක ක්‍රියා භාවිතා කිරීම<br>v. සිරස් ව්‍යුහ මත වැඩ කරන සේවකයන්ගේ ආරක්ෂාව තහවුරු කළ යුතු වේ.<br>vi. ජාතික පද්ධතියෙන් හෝ ජෙනරේටර මඟින් ලබා ගන්න ස්ථානීය විදුලි පරිපථ වලින් විදුලි පිපිරීම් ඇති නොවීමට දැඩි ආරක්ෂණක උපක්‍රම යෙදිය යුතුය.<br>vii. සර්පයින් දෂ්ට කිරීම් සඳහා සුදුසු හදිසි කළමනාකරණ පද්ධතියක් (සර්පයින් දෂ්ට කිරීම පිළිබඳ දැනුවත් කිරීම, වැඩ කරන විට ආරක්ෂක පාවහන් පැලඳීම, සර්පයින් දෂ්ට කළ විට ලබා දෙන ප්‍රථමාධාර, රෝහල්ගත කිරීම හා සර්පයින් දෂ්ට කිරීම පිළිබඳ පහසුකම් ඇති රෝහලකට ඇතුලත් කිරීම වැනි කාරණා පිළිබඳව දැනුවත් වීම)<br>viii. සිදුවිය හැකි කඩා වැටීම්, නායයෑම් සහ පාෂාණ කුට්ටි පිළිබඳව දැනුම් දීමට සෑම වේලාවකම සිටින නිරීක්ෂකයෙන් පත් කිරීම<br>ix. සීමිත ඉඩක් තුල බර යන්ත්‍ර භාවිතා කිරීම සඳහා ඇති ආරක්ෂක ක්‍රම<br>x. තුවාලයක් සිදු වූ අවස්ථාවක කඩිනම් ප්‍රථමාධාර ලබා දීම<br>**xi.** රෝහල් ගත කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම |
| | i. ඉක්මනින් රෝහල් ගත කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම<br>මෙය කොන්ත්‍රාත්කරුගේ පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම යටතේ එන වගකීමක් ලෙස සඳහන් කළ යුතුය. |

| | |
|---|---|
| II. **බෑවුමේ ඉහල හා පහල වාසය කරන්නන්ගේ ආරක්ෂාව** | • ඉදිකිරීම් අතරතුර බෑවුමේ ඉහල හා පහල වාසය කරන්නන් අවදානම් තත්වයක පසු වේ. ඔවුන් සඳහා තිබෙන අවදානම පහත කරනු මඟින් කළමනාකරණය කර ගත හැකි වේ.<br>i. පාෂාණ කුට්ටි පෙරළීම නිසා ඇතිවන අවදානම අවම කිරීම සඳහා ආරක්ෂක බාධක ඉදි කිරීම<br>ii. අවදානම හා අවදානම් තත්වයකදී ඉක්මනින් එතනින් ඉවත් වීම පිළිබඳව දැනුවත් කිරීම<br>iii. තීරණාත්මක ඉදිකිරීම් අවස්ථා වලදී තාවකාලික ඉවත්වීමේ කඳවුරු භාවිතා කිරීම<br>• තාවකාලිකව පෘෂ්ඨීය ජලවහනය පාලනය කිරීම, බෑවුම ආවරණය කිරීම සහ වර්ෂා කාලය ආරම්භ වීමට පෙර [illegible] තිබෙන පස් හා පාෂාණ ඉවත් කිරීම.<br>මෙම කරුණු කොන්ත්‍රාත්කරුගේ පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්මේ කොන්දේසි වල සඳහන් විය යුතුය. |
| III. **ශ්‍රම බලකාය පැතිරී යා හැකි රෝග, මත්කුඩු, අසල්වාසීන් සමඟ ඇතිවන අරගල හා කෝලාහල හා පීඩා** | • අපේක්ෂිත බලපෑම් පහත කරුණු මඟින් අවම කරගත හැකි වනු ඇත.<br>i. ඇති විය හැකි ගැටළු පිළිබඳව සේවකයන් හා ප්‍රජාව දැනුවත් කිරීම<br>ii. සේවකයන්ගේ ක්‍රියා හා ප්‍රජාව සමඟ හැසිරෙන ආකාරය වැඩ පරීක්ෂකවරු මාර්ගයෙන් නිතරම අධීක්ෂණය කිරීම<br>iii. චර්යාධර්ම කඩ කරන සේවකයන් හට දඩුවම් ලබා දීම<br>මෙම කරුණු කොන්ත්‍රාත්කරුගේ පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්මේ කොන්දේසි වල සඳහන් විය යුතුය. |
| IV. **දඩයම් කිරීම** | • අනවසර දඩයම් කිරීම්, සොබාදහම සුරැකීමේ වගකීම සහ නීතිය කඩ කරන්නන් හට ලැබෙන දඬුවම් ආදිය පිළිබඳ කාර්යමණ්ඩලය දැනුවත් කිරීම. මෙම කරුණු කොන්ත්‍රාත්කරුගේ පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්මේ කොන්දේසි වල සඳහන් විය යුතුය. |
| V. **ගිනි උවදුරු/ ලැව් ගිනි** | • ලැව් ගිනි ඇති වීමට තුඩු දිය හැකි හැසිරීම් සොබාදහම සුරැකීමේ පාරිසරික වගකීම සහ සිතාමතා සිදුකරන ගිනි තැබීම් වලට එරෙහිව ඇති රෙගුලාසි<br>i. සංවේදී ස්ථාන වල ගිනි තැබීම් තහනම් කිරීම.<br>ii. ශ්‍රම කඳවුරු සඳහා ගිනි පාලන සැලසුම්<br>මෙය කොන්ත්‍රාත්කරුගේ පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම යටතේ එන වගකීමක් ලෙස සඳහන් කළ යුතුය. |
| VI. **අන්තරායකර ද්‍රව්‍ය හා උපද්‍රව** | • රසායනික පිපිරීම් සඳහා වගකිව යුතු ආයතන වලින් අනුමැතිය ලබා ගැනීම.<br>i. රසායනික ද්‍රව්‍ය හා පුපුරන ද්‍රව්‍ය සඳහා විධිමත් බලතල දාමයක් පිහිටුවීම<br>ii. එම අමුද්‍රව්‍ය ළඟ තබා ගත හැකි පුද්ගලයන්<br>iii. බලයත් පුද්ගලයන් එම ද්‍රව්‍ය ආරක්ෂාකාරීව ප්‍රවාහනය කිරීම<br>iv. ඒ පිළිබඳ විශේෂිත පුහුණුවක් සහිත වෘත්තිකයන් ලවා භාවිතා කිරීම<br>v. පිපිරීම් කටයුතු සිදු කිරීමේදී ස්ථානයේ ආරක්ෂාව තහවුරු කිරීම<br>vi. පිපිරුම් ක්‍රියාවලිය අවසන් වූ පසු එම ස්ථානයේ ඇති හානිකර ද්‍රව්‍යයන් ඉවත් කිරීම යන දේ ද මෙහි ඇතුලත් වේ. |
| VII. **විවෘත ස්ථාන වල මලපහ කිරීම හා කුණු දැමීම** | • සිදුවිය හැකි ජල/ පාංශු දූෂණය වීම් පහත කරුණු මඟින් අවම කර ගත හැක.<br>i. ජල දූෂණය සහ ජලය මඟින් පැතිරෙන රෝග, විවෘත මලපහ කිරීම් හේතුවෙන් ගංගා වල පහල ප්‍රදේශයේ ජල භාවිතය සඳහා ඇතිවන බලපෑම යනාදිය පිළිබඳ දැනුවත් කිරීම.<br>ii. මෙම ස්ථාන පාරිසරික (ඇළවල්), සමාජයීය (පාසැල්, රෝහල්) හෝ සංස්කෘතිකව සංවේදී ප්‍රදේශ වල පිහිටා ඇත්නම් වැඩ කරනු ලබන ස්ථානයට ආසන්නව සේවකයන් සඳහා වැසිකිළි පහසුකම් සකස් කර දීම. |

වගුව

| | |
|---|---|
| | iii. සේවකයන්ගේ සනීපාරක්ෂක පුරුදු පිළිබඳ අවධානයෙන් සිටීම හා අධීක්ෂණය කිරීම<br>iv. එම කොන්දේසි කඩ කරන සේවකයන් සඳහා දඩුවම් ලබා දීම.<br>මෙම කොටස් කොන්ත්‍රාත්කරුගේ පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්මේ ඔහුගේ වගකීමක් ලෙස සඳහන් විය යුතුය. |
| VIII. **ගිනි අවි හා ආයුධ භාවිතා කිරීම** | • අදාල අවදානම් පහත පිළියම් මඟින් අවම වනු ඇත.<br>i. ගිනි අවි ලඟ තබා ගැනීම සම්බන්ධව තිබෙන නීතිමය තත්වයන් පිළිබද දැනුවත් කිරීම<br>ii. සේවකයන් පිළිබඳ අවධානයෙන් සිටීම හා අධීක්ෂණය කිරීම<br>iii. එම කොන්දේසි කඩ කරන සේවකයන් සඳහා දඩුවම් ලබා දීම. |
| IX. **පුද්ගලික දේපල ව්‍යාපෘති කටයුතු සඳහා භාවිතා කිරීම** | • මෙම ගැටළුව පහත සඳහන් කරුණුද ඇතුලත්ව නැවත පදිංචි කිරීම් සැලසුම් කිරීමේ වැඩ රාමුවෙහි දී සාකච්ඡා කළ යුතුය.<br>i. අවම'කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන ඉඩම් අදාල ආයතන (පොදු කටයුතු සඳහා ඉඩම් ප්‍රකාශයට පත් කිරීමේ බලයක් NBRO සතු නොවේ), ප්‍රාදේශීය ලේකම් වැනි බලය සහිත පුද්ගලයන් මඟින් ප්‍රකාශයට පත් කිරීම අත්‍යාවශ්‍ය වේ. එබැවින් එම ඉඩම සඳහා මැනුම් සමීක්ෂණයක් සිදු කළ යුතු අතර එමගින් නිදහස් කිරීමට යන ඉඩම් ප්‍රමාණය පැහැදිලිවම DS හරහා ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ප්‍රකාශයට පත් කළ යුතුය.<br>ii. ඉඩමේ අයිතිකරුගේ පාර්ශවයෙන් බැලූ කළ කුඩා ඉඩම් ප්‍රමාණයක් සහිත ඉඩම් හිමියෙකුගේ නිවසක් නායයෑමෙන් විනාශ වූ පසු එම ඉඩම් කොටස වෙන කිසිවෙකුට ලබා දීමට ඔහු අකමැති වේ. මෙම මිනිසුන් සඳහා රජය මඟින් රුපියල් මිලියන 1.6ක වන්දි මුදලක් ලබා දේ. එම මුදල නිවසක් සෑදීම සඳහා ප්‍රමාණවත්ය . සමහර අවස්ථා වලදී ව්‍යාපෘතියේ කටයුතු කරගෙන යාම සඳහා මිනිසුන්ට තම වාසස්ථාන වලින් ඉවත් වීමට සිදු වේ. එවැනි අවස්ථාවකදී මෙම ව්‍යාපෘතිය තමන්ගේ ඉඩමේ කරගෙන යාමේ ඇති වැදගත්කම පිළිබඳව අයිතිකරුවන් දැනුවත් කළ යුතු අතර ඔවුන්ට ලැබෙන මුදල් රැගෙන එම ඉඩමෙන් පිට වී යෑමට මිනිසුන් කැමති වන ආකාරයේ වටපිටාවක් සකස් කර දිය යුතුය.<br>iii. ඉඩමේ අයිතිකරු අනාගතයේදී ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම වැලැක්වීම සඳහා අවම කිරීමේ කටයුතු සඳහා, පසු වැඩකටයුතු සඳහා හා අයිතිකරු විසින් අනාගතයේදී ඉඩම වගා කටයුතු සඳහා භාවිතා කිරීම නතර කිරීම වැනි කාරණා ඇතුලත් නීතිමය එකඟතාවයක් ඉඩම් අයිතිකරු හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනය අතර ඇති කර ගත යුතුය<br>iv. ඉහත සඳහන් කළ නිර්දේශ අවම මට්ටමකින් ප්‍රයෝජනයට ගනිමින් මෙවැනි අවස්ථා පාලනය කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාරිසරික හා සමාජයීය සෞඛ්‍යාරක්ෂක අංශය විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය. |
| X. **ඉදිකිරීම් කටයුතු සඳහා වැඩබිම් එළිපෙහෙළි කිරීම** | • මෙය පහත සඳහන් කරුණු ඇතුලත් නැවත පදිංචිකිරීම් සැලසුම් වැඩ රාමුවෙහි සාකච්ඡා කළ යුතුය.<br>i. ixඅංශයේ සඳහන් පරිදි ඉඩම් ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රමවේදය අනුගමනය කරන්න<br>ii. ව්‍යාපෘතියේ ඇති වැදගත්කම, තම ඉඩමේ ඉදිකිරීම් කටයුතු සිදුකරගෙන යෑමට ඉඩ ලබා දීම හා එහි ඇති ව්‍යුහ , ඵලදායී බෝග ඉවත් කිරීම වැනි දේ පිළිබඳව ඉඩම් හිමියන් දැනුවත් කිරීම.<br>iii. ව්‍යුහ ඉවත් කිරීම සම්බන්ධයෙන් අකමැත්තක් නොමැති බව පවසමින් ඉඩම් හිමියන් හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනය අතර නීතිමය එකඟතාවයක් අත්සන් කිරීම. |

| | |
|---|---|
| | iv. ව්‍යුහ වල ඇති වටිනා දේවල් ඉඩම් අයිතිකරුට ඉවත් කර ගැනීමට හෝ ඉඩම් අයිතිකරු වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ඉවත් කිරීමට ඉඩ ලබා දීම.<br>v. ව්‍යුහ ඉවත් කිරීම සඳහා යන වියදම ව්‍යාපෘතිය මඟින් දරනු ලැබේ.<br>vi. ඉඩමේ ඇති ඉඩම් හිමිකරුගේ පැවැත්ම සඳහා අවශ්‍ය වන සේවා ඉව කිරීමට සිදු වන්නේ නම්, (උදාහරණ වශයෙන් කානු ඉවත් කිරීම, ජලනල ඉවත් කිරීම) ව්‍යාපෘති මුදල් මඟින් ඒ සඳහා විකල්ප ලබා දිය යුතුය. |
| **XI. රක්ෂිත ප්‍රදේශ වල ඉදිකිරීම් කටයුතු සිදු කිරීම** | • සිදුවිය හැකි බලපෑම් පහත ක්‍රම මඟින් අවම කර ගත හැකිය.<br>i. ඉඩමේ අයිතිය කා හටද යන්න හඳුනා ගැනීම (ආයතනය)<br>ii. අදාල ආයතන මුණගැසීම<br>iii. අයදුම්පත්, ව්‍යාපෘති යෝජනා සහ සැලසුම් ඇතුලත් ලිඛිත ඉල්ලීමක් අදාල ආයතන වෙත ඉදිරිපත් කිරීම.<br>iv. අනුමත කිරීමේ ක්‍රියාවලියේදී අදාල ආයතනයේ උපදෙස් අනුගමනය කිරීම<br>v. ආයතනය මඟින් ලිඛිත යෝග්‍යතායක් ලබා ගැනීම<br>vi. ආයතනය මඟින් ඉදිරිපත් කරනු ලබන කොන්දේසි වලට අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම<br>vii. ප්‍රගති රැස්වීම් වලදී ව්‍යාපෘතියේ තත්වය පිළිබඳව අදාල ආයතන දැනුවත් කිරීම/ සහභාගී කරවා ගැනීම<br>viii. කිසියම් කොන්දේසි කඩවීමක් සිදු වුවහොත් ඉතා කෙටි කාලයක් තුල අදාල ආයතන දැනුවත් කිරීම |
| **XII. ශ්‍රම කඳවුරු** | • ශ්‍රම කඳවුරු පිළියෙළ කරන ආකාරය පිළිබඳව ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ව්‍යාපෘති කළමනාකරණ ඒකකයදැනුවත් කළ යුතුය. තාවකාලික කඳවුරු පිහිටවීමට අවශ්‍ය වේ නම් කොන්ත්‍රාත්කරු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ව්‍යාපෘති කළමනාකරණ ඒකකයමඟින් ඒ සඳහා අවසර ලබා ගත යුතුය.<br>පහත සඳහන් පාරිසරික හා සමාජයීය කොන්දේසි අවම මට්ටමක පවත්වා ගනිමින් ශ්‍රම කඳවුරු පවත්වා ගෙන යා යුතුය.<br>i. කඳවුරු වල විවේක ගැනීම (නිදා ගැනීම), සනීපාරක්ෂක කටයුතු හා සන්නිවේදන කටයුතු සඳහා අවශ්‍ය වන පරිදි ඉඩ පහසුකම් තිබිය යුතුය.<br>ii. කඳවුරු තුල නිරතුරුවම අවශ්‍ය තරමට ජලය පැවතිය යුතුය.<br>iii. පළාත් පාලන ආයතන වල රෙගුලාසි වලට අනුව අපද්‍රව්‍ය බැහැර කිරීම සිදු කළ යුතුය.<br>iv. ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු මඟින් පිහිටුවීමට යන කඳවුරු වල අනෙක් අයට කරදරයක් නොවන පරිදි අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධති, ජලය සැපයීම සහ වෙනත් සනීපාරක්ෂක සේවා පැවතිය යුතුය.<br>v. ක්‍රමවත් අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. අසල්වැසි ඉඩම් වලට අපද්‍රව්‍ය බැහැර කිරීම හා අපද්‍රවය ගිනි තැබීම සිදු නොකළ යුතුය. බැහැර කිරීමේ සුදුසුම ක්‍රමය වන්නේ ඒවා පළාත් පාලන ආයතන වෙත ලබා දීම හෝ බලධාරීන් මඟින් අනුමත කරන ලද ස්ථාන වෙතට බැහැර කිරීමයි.<br>vi. ගිනි අවි හෝ ජීවිත තර්ජන ඇති කරනු ලබන ආයුධ කඳවුරේ දී ලඟ තබා ගැනීම තහනම් කළ යුතුය.<br>vii. මත්කුඩු, මත්පැන්, අනාචාර, කාන්තාවන් හා ළමුන් සඳහා වන ලිංගික අපචාර, සොරකම්, අරගල සහ නොමනා ක්‍රියා සිදු වේ දැයි කඳවුරේ භාරකරු අවධානයෙන් සිටිය යුතුය. |

| | |
|---|---|
| | viii. චර්යා රටා හා කඳවුරේ ඇති චර්යා ධර්ම පිළිබඳව කොන්ත්‍රාත් පාරිසරික හා සමාජයීය නිලධාරියා මඟින් දැනුවත් කිරීම් සිදු කළ යුතුය.<br>ix. නොවැලක්විය හැකි අවස්ථාවලදී දඩුවම් කිරීමේ ක්‍රමවේදයක්, නීතිමය පියවර හෝ රැකියාවෙන් නෙරපා හැරීම යන පියවර ගත යුතුය.<br>x. කඳවුරු තුල ගින්න මඟින් ඇතිවිය හැකි අනතුරු සඳහා අවශ්‍ය ආරක්ෂක ක්‍රියාමාර්ග තිබිය යුතුය.<br>xi. රටෙහි පවතින දඩයම් කිරීම, පුරා විද්‍යා ත්මකව කොටස් සහ ආරක්ෂා කළ යුතු වනජීවී විශේෂ අනවසර ලෙස වෙලදාම් කිරීම වැනි පාරිසරික හා වෙනත් නීති කඩ කරන්නේදැයි බැලීමට සේවකයන් පිළිබඳ ඉතා අවධානයෙන් සිටිය යුතුය.<br>xii. ප්‍රථමාධාර පෙට්ටියක් තිබීම<br>xiii. ශ්‍රම කඳවුරු විධිමත් අයුරින් අයිතිකරුවන්ට භාර දීම හා අපද්‍රව්‍ය, ඉදිකිරීම් අමුද්‍රව්‍ය යනාදිය ඉතිරි නොකර කඳවුර එතැනින් ඉවත් කර ගැනීම සිදු කළ යුතුය. |
| **ක්‍රියාත්මක කිරීමේ වගකීම්**: ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු | |

### 4.6.3 ක්‍රියාත්මක කිරීමේ අදියරේ අවම කිරීමේ ක්‍රියාමාර්ග

මෙම ව්‍යාපෘතියේදී බෑවුම් ස්ථාවර කිරීම සඳහා ව්‍යුහාත්මක අවම කිරීමේ ක්‍රම යොදා ගන්නා බැවින් එයින් අවම පාරිසරික හා සමාජයීය බලපෑමක් ඇති වේ. ව්‍යාපෘති චක්‍රයේදී සිදු වන පාරිසරික හා සමාජයීය බලපෑම් අවම කිරීම සඳහා සලකා බැලිය යුතු කරුණු පිළිබඳව ඉතා ගැඹුරු විශ්ලේෂණයක් පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව මඟින් ලබා දේ. එම කරුණු නිසියාකාරව ක්‍රියාත්මක කළහොත් ඉදිකිරීම් අදියරේදී සිදු විය හැකි බලපෑම් නොසැලකිය හැකි තරම් වේ. නමුත් ව්‍යාපෘතිය අවසන් කළ පසු මුල් කාලයේ ඇතැම් ගැටළු ඇතිවිය හැක. එම නිසා ඉදිකිරීම් වැඩ අවසන් වූ පසු සැලකිය යුතු කාලයක් සඳහා අධීක්ෂණ කටයුතු සිදු කිරීම නිර්දේශ කරන අතර ඉහත සඳහන් කළ පරිදි යම් ප්‍රශ්නයක් පැන නැගුනොත් එය විසඳීමද සිදු කළ යුතුය.

### දීර්ඝකාලීන මෙහෙයුම් හා නඩත්තු කටයුතු

මෙම ස්ථාන සඳහා දීර්ඝකාලීන මෙහෙයුම් හා නඩත්තු කටයුතු කරගෙන යාම අවශ්‍ය වේ. බොහෝ අවස්ථාවලදී ඒවා වල්පැල ගැලවීම, කොළරොඩු හා අවසාදිත ඉවත් කිරීම සඳහා කාණු පවිත්‍ර කිරීම, ප්‍රෘෂ්ඨීයව සිදු කරනු ලබන ක්‍රියාකාරකම් වැනි සුළු නඩත්තු කටයුතු වේ. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ස්ථාන වල නඩත්තු කටයුතු මාර්ග රක්ෂිත නඩත්තු කිරීම යටතේ ඔවුන් විසින්ම සිදු කරනු ලැබේ. කෙසේ වෙතත්, රජයේ හා පෙර පුද්ගලික ඉඩම් යන දෙවර්ගයේම නඩත්තු කටයුතු සඳහා අවසර ප්‍රාදේශීය ලේකම් මඟින් ලබා දේ. NBROහි අධීක්ෂණය මත නඩත්තු කටයුතු සිදු වේ. විශේෂ නඩත්තු කටයුතු (ඉතා කලාතුරකින් ඇතිවිය හැකි) වලදී ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් NBRO මඟින් අදාල කොන්ත්‍රාත් පාර්ශව වෙත ලබා දේ.

සුළු නඩත්තු කටයුතු සඳහා ප්‍රජා මූලික සංවිධාන යොදා ගත හැකි අතර විශාල වශයෙන් සිදු කළ යුතු නඩත්තු කටයුතු සඳහා හැකියාවන් ඇති කොන්ත්‍රාත්කරුවන් යොදා ගත හැක.

නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය මුදල් රජය මඟින් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලබා දේ.

# 5 වන පරිච්ඡේදය- වගකිව යුතු ආයතන හා අවදානමේ සිටින ප්‍රජාව සමඟ උපදේශන සේවා පැවැත්වීම සහ තොරතුරු හෙළිදරව් කිරීම

ව්‍යාපෘතිය සුමට ලෙස කරගෙන යාම සඳහා වගකිව යුතු ආයතන සමඟ කරනු ලබන උපදේශන සේවා ඉතා වැදගත් කරුණක් බවට පත් වී ඇත. අදාල වගකිව යුත්තන් ව්‍යාපෘතියේ ස්වභාවය හා එහි ප්‍රමාණය, එමඟින් ලැබෙන ප්‍රතිඵල හා දීර්ඝ කාලීන ප්‍රතිලාභ පිළිබඳව දැනුවත්ව සිටී. එසේම ව්‍යාපෘති ක්‍රියාවන්, ඉඩම් වැනි සම්පත් වල භාවිතයන්, පාරිසරික හා සමාජයීය බලපෑම් සහ නැවත පදිංචි කිරීම යන කාරණා පිළිබඳව ප්‍රමාණවත් තරම් තොරතුරු හෙළි කිරීම සිදු කෙරේ.

**වගකිවයුතු ආයතන හඳුනා ගැනීම හා ඔවුන්ගේ උපදේශන ක්‍රියාවලිය**

වගකිව යුතු ආයතන පිළිබඳ විශ්ලේෂණයකින් පසුව ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන වගකිව යුතු ආයතන මොනවද යන්න හඳුනා ගන්නා ලදී. ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වගකිවයුතු ආයතන හඳුනා ගැනීම සඳහා පාරිසරික ගැටළු තක්සේරුකරණ වාර්තා සහ පාරිසරික ව්‍යාපෘති පිළිබඳ අත්දැකීම් පැවතීම විශාල වශයෙන් සලකා බලන දී. ව්‍යාපෘතිය සඳහා අදාළ වන වගකිව යුත්තන් වන්නේ

i. ව්‍යාපෘතිය අනුමත කිරීමේ කොටස් කරුවන් වන රාජ්‍ය ආයතන
ii. අවම කිරීමේ ක්‍රියා සිදු කරනු ලබන රාජ්‍ය/ පුද්ගලික/පොදු ඉඩම වල අයිතිකරුවන්; ව්‍යාපෘති වැඩ මෙම ඉඩම් වල ක්‍රියාත්මක කිරීම සඳහා කැමැත්ත ඔවුන්ගෙන් ලබා ගත යුතුය.
iii. පාරිසරික හා සමාජයීය අංශ යටතේ අනුමැතිය ලබා ගත යුතු රාජ්‍ය ආයතන
iv. සත්කාරක රටෙහි හා AIIB හි පාරිසරික හා සමාජයීය ආරක්ෂක ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ වන වෙනත් රාජ්‍ය ආයතන

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගෙන යාම සඳහා අවශ්‍ය වන වගකිව යුත්තන් හඳුනා ගැනීම සඳහා NBRO හි පෙර මෙවැනි ව්‍යාපෘති වල වැඩ කර ඇති කණ්ඩායම් වල අත්දැකීම් සහ නායයෑම් අධ්‍යයන හා අවදානම් කළමනාකරණ අංශයේ දිස්ත්‍රික් කාර්යාලවල බලයලත් නිලධාරීන්ගේ සහය ලබා ගන්නා ලදී. වගකිව යුතු ආයතන ලැයිස්තුව සෑදීමෙන් අනතුරුව මේ පිළිබඳව තවදුරත් සාකච්ඡා කිරීමට NBRO කණ්ඩායම, ව්‍යාපෘති අධ්‍යක්ෂක, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ දිස්ත්‍රික් කාර්යාලවල බලයලත් නිලධාරීන් එක්රැස් වූ අතර මෙහිදී උපදේශන ලබා ගන්නා ආකාරය, තොරතුරු හෙළිදරව් කරනු ලබන මට්ටම, වගකිව යුත්තන් කොතෙක් දුරට මැදිහත් වන්නේද යන බව හා ප්‍රතිචාරද ඇතුලත්ව තොරතුරු බෙදා හැරීමේ ක්‍රමවේදයක් සහ උපදේශන සේවා මඟින් ලබා ගන්නා ප්‍රතිඵල ව්‍යාපෘතිය සමඟ කැටි කරන ආකාරය පිළිබඳව සාකච්ඡා කරන ලදී.

මෙම විශ්ලේෂණයන්ගෙන් පසුව වගකිව යුතු ආයතන පහත සැලසුම පරිදි ව්‍යාපෘතිය කරගෙන යාම අවශ්‍ය බව තීරණය කරන ලදී.

**වගුව 10: වගකිවයුත්තන් හා උපදේශන සේවය**

| අංශය | ආයතනය හා කාර්යභාරය |
|---|---|
| i.ව්‍යාපෘති අනුමත කරන පාර්ශවයේ කොටස්කරුවන් වන රාජ්‍ය ආයතන | **ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම්**<br>ව්‍යාපෘතිය සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ හා දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය අවශ්‍ය වේ. නායයෑම් අවම කිරීමේ අවශ්‍යතා හා අවදානම් තත්වය පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරු හොඳින් දැනුවත් වී ඇත. කෙසේ වුවද, AIIB ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලද ප්‍රමුඛ ස්ථාන පිළිබඳව දිස්ත්‍රික් ලේකම්වරු දැනුවත් කළ යුතු අතර ඔවුන්ගේ නිර්දේශ ලබා ගත යුතුය. මෙම ව්‍යාපෘතිය හා ප්‍රාදේශීය ලේකම්වරු අතර සන්නිවේදනය ලියකියවිලි හරහා සිදු වෙයි. |

| | |
|---|---|
| | සියලුම වගකිව යුතු පාර්ශව සහභාගී වන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ව්‍යාපෘතිය දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කෙරේ. මෙම රැස්වීමේදී දෙපාර්ශවයම අතර සන්නිවේදනය සිදු වේ.<br>i) වගකිව යුතු ආයතන ව්‍යාපෘතිය පිළිබඳ දැනුවත් කිරීම හා එහි ඇති අවම කිරීමේ ප්‍රතිලාභ පිළිබඳ දැනුම් දීම<br>ii) විවිධ වගකිව යුතු ආයතන මඟින් අපේක්ෂා කරනු ලබන මැදිහත් වීම් පිළිබඳව දැනුවත් කිරීම.<br>iii) වගකිව යුතු පාර්ශව සඳහා ව්‍යාපෘතියේ තොරතුරු (සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය) හෙළි කිරීම<br>iv) අවධානය යොමු කළ යුතු විවිධ බාධක හා ගැටළු හඳුනා ගැනීම |
| | v) ධනාත්මක ප්‍රතිචාර ලබා ගැනීම<br>vi) ව්‍යාපෘතිය සඳහා වන නිර්දේශ ඇතුලත් කිරීම<br><br>**සැලසුම් කිරීමේ කමිටුවේ අනුමැතිය**<br>ව්‍යුහාත්මක අවම කිරීමේ සැලසුම් සඳහා පළාත් පාලන ආයතන වල සැලසුම් කමිටුවේ අනුමැතිය අවශ්‍ය වේ. නායයෑම් අවම කිරීමේ ව්‍යුහාත්මක සැලසුම්, සැලසුම් කමිටුවේ අනුමැතිය සඳහා යොමු කෙරේ. |
| ii.අවම කිරීමේ කටයුතු සිදු කරගෙන යෑමට බලාපොරොත්තු වන ඉඩම් වල අයිතිය තිබෙන රාජ්‍ය/ පුද්ගලික අංශයේ ආයතන | වගකිව යුතු පාර්ශව පිළිබඳ විශ්ලේෂණයේදී උපදේශනය අවශ්‍ය වන ඉඩම් අයිති රාජ්‍ය ආයතන, සමාගම් සමූහ සහ අංශ හඳුනා ගන්නා ලදී. එවැනි ආයතන වන්නේ, **මාර්ග සංවර්ධන අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන, නාගරික සංවර්ධන අධිකාරිය, ප්‍රාදේශීය ලේකම් (රජයේ ඉඩම්), ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ඉඩම් ප්‍රතිසංස්කරන කොමිසම, රජයේ වතු වගා අංශය, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඉඩම්, විහාර හා දේවාලගම පනත යටතට අයත් වන ඉඩම් (රජවරු විසින් ආගමික ස්ථාන වලට පිරිනමන ලද ඉඩම්) යන ඒවායි.**<br><br>ව්‍යාපෘති ක්‍රියාකාරකම් මෙම ඉඩම් වල සිදු කෙරේ නම් අදාල අයිතිකරුවන්ගෙන් අනුමැතිය ලබා ගත යුතුය. ව්‍යාපෘති තොරතුරු හෙළි කිරීම, ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන ඉඩම් වල අවශ්‍යතාවය, ව්‍යාපෘතිය මඟින් සිදු කරනු ලබන අවදානම් අවම කිරීමේ තිබෙන ප්‍රතිලාභ, අවම කිරීමේ වැඩ සඳහා ඉඩම් නිදහස් කිරීමට ඇති අවශ්‍යතාවය, ඉඩම් නිදහස් කිරීමට හා ඉදිරි සංවර්ධන කටයුතු වලට සීමා පැනවීමට එකඟතා ගිවිසුම් අත්සන් කිරීම වැනි උපදේශන සේවා ක්‍රියාත්මක කෙරේ. සාමාන්‍යයෙන් විවිධ ආයතන සඳහා ඔවුනටම වෙන් වූ අවශ්‍යතා පවතින අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී එම කරුණු වලටද ගරු කළ යුතුය. උපදේශනය සඳහා මෙවැනි අවශ්‍යතා හඳුනා ගැනීම සහ AIIB ව්‍යාපෘතියේ සීමා දෙපර්ශවටම සරිලන පරිදි හෙළි කිරීමද ඇතුලත් වේ.<br><br>මෙහිදී ව්‍යාපෘති කණ්ඩායම අදාල ආයතන හමු වී ව්‍යාපෘතිය පිළිබඳව දැනුම් දීම, තොරතුරු හෙළි කිරීම සහ ව්‍යාපෘතිය කරගෙන යාම සඳහා ඔවුන්ගේ කැමැත්ත ඇතුලත් ලිඛිත එකඟතාවක් ලබා ගැනීම සිදු කරයි. |
| ii. පාරිසරික හා සමාජයීය අංශ යටතේ අනුමැතිය ලබා ගත යුතු රාජ්‍ය ආයතන | අදාල ස්ථානයට අනුව පහත සඳහන් ආයතන වෙතින් උපදේශන ලබා ගත යුතු බව විශ්ලේෂණයේදී හෙළි විය. එම ආයතන නම් i) **වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව ii)වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ මධ්‍යම/ පළාත් පරිසර අධිකාරිය වේ.**<br><br>ව්‍යාපෘති කණ්ඩායම මෙම ආයතන වල දිස්ත්‍රික් කාර්යාල වෙත යන අතර එහිදී ව්‍යාපෘති ක්‍රියාකාරකම් පිළිබඳව හෙළි කිරීම, ප්‍රතිචාර ලබා ගැනීම, කොන්දේසි පිළිබඳ සාකච්ඡා කිරීම සහ ඒවා ව්‍යාපෘතිය සඳහා අදාල කර ගැනීම සිදු කෙරේ. |

| | |
|---|---|
| v. පාරිසරික හා සමාජයීය ආරක්ෂක ක්‍රමවේද සඳහා අවශ්‍ය වන වෙනත් රාජ්‍ය ආයතන | වගකිව යුතු පාර්ශව පිළිබඳ විශ්ලේෂණයේදී පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාවලි සඳහා අවසර හා බලපත්‍රයක් තිබිය යුතු බව සොයා ගන්නා ලදී. ඒවා නම් **අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පළාත් පාලන ආයතන මඟින් ලබා ගන්නා බලපත්‍රය, පස් හා ගල් ප්‍රවාහනය කිරීම සඳහා භූ විද්‍යා හා පතල් කාර්යාංශය මඟින් ලබාගන්නා බලපත්‍රය, ජලය ලබා ගැනීම සඳහා පළාත් පාලන අයතනය මඟින් හෝ ජල සැපයුම් මණ්ඩලය වෙතින් ලබා ගන්නා අනුමැතිය පුපුරන ද්‍රව්‍ය සඳහා ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ලබා ගන්නා බලපත්‍රය** යනාදියයි. |
| | **ග්‍රාම නිලධාරී**<br>ග්‍රාම නිලධාරී මෙම ව්‍යාපෘතියේ වැදගත් පාර්ශවකරුවෙකු වෙනු ඇත. තොරතුරු ලබා ගැනීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇතිවිය හැකි සංවේදී ගැටළු හඳුනා ගැනීම, විශේෂ අවධානයක් අවශ්‍ය වන අවදානම්/ සංවේදී කණ්ඩායම් හඳුනා ගැනීම වැනි කරුණු සඳහා ව්‍යාපෘති කණ්ඩායම ග්‍රාම නිලධාරී සමඟ සාකච්ඡා පවත්වයි. එමෙන්ම ව්‍යාපෘතිය නිසා බලපෑමට ලක්ව ඇති පාර්ශව සඳහා සන්නිවේදනය කිරීම හා ආරවුල් විසඳීම සඳහා වැදගත් වන පුද්ගලයෙක් වන බැවින් **ග්‍රාම නිලධාරී** වෙතින් උපදෙස් ලබා ගැනීම වැදගත් කොට සැලකේ. |
| | **ආගමික නායකයින්/ සමාජ සේවකයන්/ රාජ්‍ය නොවන සංවිධාන**<br>අදාල ස්ථාන වලට ආසන්නව සිටින ඉහත සඳහන් කළ කණ්ඩායම් විශේෂ අවධානයක් අවශ්‍ය වන අවදානම්/ සංවේදී කණ්ඩායම් හඳුනා ගැනීම සඳහා වැදගත් වන පාර්ශවකරුවන් වන නිසා ඔවුන්ගෙන් උපදෙස් ලබා ගැනීමද සිදු කරයි. එමෙන්ම ව්‍යාපෘතිය නිසා බලපෑමට ලක්ව ඇති පාර්ශව සඳහා සන්නිවේදනය කිරීම හා ආරවුල් විසඳීම සඳහාද ඔවුන් වැදගත් වේ. |
| v. ව්‍යාපෘතිය මඟින් බලපෑමට ලක්වන පාර්ශව හා ප්‍රතිලාභ ලබන්නන් | ව්‍යාපෘතිය මඟින් බලපෑමට ලක්වන පාර්ශ්ව වන්නේ අවදානමට ලක්වූ ඉඩම් වල අයිතිකරුවන් හා අසල නිවාස වල වාසය කරන අසල්වාසීන් වේ.<br>, අදාල ස්ථාන ආසන්නයේ ජීවත් වන ඉහත සඳහන් කළ පාර්ශව ව්‍යාපෘතිය සඳහා කැමැත්ත ලබා ගැනිම, ඉඩම් නිදහස් කර ගැනීම, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා උපකාරි වන පරිසරයක් නිර්මාණය කිරීම, ව්‍යාපෘතිය සඳහා ප්‍රජාව එකතු කර ගැනීම හා ව්‍යාපෘතිය පිළිබඳ විමසිල්ලෙන් පසු වන කණ්ඩායමක් වන නිසා ඔවුන්ගේ උපදෙස් ලබා ගැනීමද සිදු කෙරේ. |

ව්‍යාපෘතිය සඳහා සුදානම් වන අදියරේදී උපදේශන ලබා ගැනීම සිදු කෙරෙන අතර එය ව්‍යාපෘතියේ අනෙක් අදියර වලදී ද ක්‍රියාත්මක කෙරේ. මෙම ක්‍රියාවලිය සඳහා i) ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන පාර්ශව සහ වගකිව යුතු පාර්ශව සමඟ ප්‍රමාණවත් තරම් තොරතුරු හුවමාරු කර ගැනීම ii) ව්‍යාපෘතිය,ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන පාර්ශව සහ වෙනත් වගකිව යුතු පාර්ශව සඳහා ප්‍රතිලාභ ලැබිය හැකි වටපිටාවක් තුල උපදේශන පැවැත්වීම සහ iii) සාකච්ඡා සඳහා කාන්තාවන් හා අවදානම් තත්වයේ පවතින කණ්ඩායම් සහභාගී කර ගැනීම ඇතුලත් වේ. මෙමඟින් පාරිසරික සැලසුම් සඳහා බලපෑමට ලක්වූ සියලු පාර්ශව වල අදහස් ලබාගත් බව තහවුරු වේ.

ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරී කාර්යාල, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම්, අදාල ග්‍රාම නිලධාරීන්, දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරියෙක්, අපදා සහන නිලධාරීන්, ප්‍රාදේශීය සංවර්ධන නිලධාරී, දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරියෙක්, ප්‍රජා නායකයන් සහ අවශ්‍ය වූ විට ව්‍යාපෘතිප්‍රදේශ වල සිටින ආගමික නායකයන් යන පාර්ශව සමඟ උපදේශ කටයුතුපවත්වා හෝ පැවැත්වීමට බලාපොරොත්තු වේ.

පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව සැකසීමේදී ව්‍යාපෘති කණ්ඩායම වගකිව යුතු පාර්ශව පිළිබඳ දැඩි විශ්ලේෂණයක් කරනු ලබන අතර එයින් උපදේශනය අවශ්‍ය වන ආයතන හා පාර්ශව හඳුනා ගනී. ආයතන සඳහා AIIB ව්‍යාපෘති අධ්‍යක්ෂක , සැලසුම්

විශේෂඥයින්, OIC/ රත්නපුර DO/LSSD/NBRO, කෑගල්ල/LSSD/ NBRO, කළුතර/LSSD/NBRO, රත්නපුර අපදා කළමනාකරණ කාර්යාලය, රත්නපුර වන අඩවි කාර්යාලය, රත්නපුර ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරිය, රත්නපුරමධ්‍යම පරිසර අධිකාරිය, රත්නපුර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම යන ඒවා අයත් වේ. කලන නගරය, කලවාන ගාමිණී විද්‍යාලය, අයගම, පැබොටුව, දුරෙක්කන්ද, ගලබඩ, කැටන්දොළ, ලිහිනියාව අභිනවාරාමය සහ අත්වැල්තොට ගංගාරාමයේ ස්වාමීන් වහන්සේලා, කළුතර ග්‍රාම නිලධාරීන් යනු ව්‍යාපෘතිය මඟින් බලපෑමට ලක් වූ පාර්ශව වන අතර උපදේශන කාල සීමාව 2018 අගෝස්තු 08-09 සහ 17, 2018 සැප්තැම්බර් 07 යන දින වල සිදු කෙරිණි. ව්‍යාපෘති කණ්ඩායම සිංහල හා ඉංග්‍රීසි යන භාෂා දෙකම භාවිතා කරයි. මෙම ප්‍රදේශයේ (රත්නපුර, කෑගල්ල සහ කළුතර) දේශීය භාෂාව සිංහල වන බැවින් උපදේශන සිංහල භාෂාවෙන් පවත්වන ලදී.

## 5.1 පාරිසරික හා සමාජයීය කළමනාකරණ ලිපිගොනු හෙළිදරව් කිරීම

පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව , ස්ථානීය පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව ද ඇතුලත් සියළුම පාරිසරික සැලසුම් ලිපිගොනු සමාලෝචනය කිරීම සඳහා AIIB වෙත යවන ලදී. එක් එක් පැකේජවල අවම කිරීමේ යෝජනා සමඟ මෙම ලියකියවිලි NBRO හා AIIB වෙබ් අඩවි වල ප්‍රදර්ශනය කෙරේ. අනුමත කිරීමේ ක්‍රියාවලියේදී අදාල අංශ වල අවම කිරීමේ යෝජනා සියලුම වගකිව යුතු පාර්ශව වෙත ලබා දේ. මෙයට දිස්ත්‍රික් ලේකම්, පළාත් පාලන ආයතන, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය සහ අදාල වන වෙනත් වගකිව යුතු පාර්ශවයන් ඇතුලත් වේ.

මෙම පාරිසරික සහ සමාජයීය කළමනාකරණ රාමුව ක්‍රියාවට නැංවීමේ දී, සියලුම පාරිසරික ගුණාත්මක අධීක්ෂණ වාර්තා ද, අනනුකූලතා, සම්මතයන්ට පටහැණි වීම් හා නිර්දේශිත ක්‍රියාවලි වලින් බැහැර ගොස් ඇති අවස්ථා උදෙසා ගෙන ඇති පිළියම් යනාදිය ද ඇතුළුව පිළියෙළ කර ඇති ප්‍රගති වාර්තා, ව්‍යාපෘති සමාලෝචනය රැස්වීම් හා අධීක්ෂණ අතරතුර AIIB සහ අනෙක් අදාළ පරදු කරන ආයතන වෙත ඉදිරිපත් කළ යුතුවේ.

ලැබෙන සෑම පැමිණිල්ලක් සඳහාම අර්ථාන්විත ආකාරයෙන් පිළිතුරු සැපයීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ක්‍රියාකරනු ඇත. සියලුම ව්‍යාපෘති අදියරයන් සඳහා අදාල වන ඉහත සඳහන් කළ පාර්ශව සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් ව්‍යාපෘතිය පිළිබඳ තත්වයන් දැනුම් දෙනු ඇත.

අවශ්‍ය කරන පාර්ශව අතර බෙදා දීම සඳහා සෑම දිස්ත්‍රික්කයක් සඳහාම ව්‍යාපෘතිය පිළිබඳ විස්තර ඇතුලත් පත්‍රිකා පිළියෙළ කරනු ලැබේ.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DWLC), වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DFC), මධ්‍යම පරිසර අධිකාරිය වැනි වගකිව යුතු ආයතන වල නිලධාරීන්ට පාරිසරික තහවුරු කර ගැනීම් සඳහා ඕනෑම අවස්ථාවක ව්‍යාපෘති ස්ථාන පරීක්ෂා කළ හැකි වේ.

ව්‍යාපෘතියට අදාල යෝජිත තොරතුරු හෙළි කිරීමේ ක්‍රියාවලිය පහත දැක්වේ.

**වගුව 11: යෝජිත තොරතුරු හෙළිදරව් කිරීමේ ක්‍රමවේද ය**

| තොරතුරු | යෝජිත ආයතන | තොරතුරු හෙළිදරව් කරන මාධ්‍ය |
|---|---|---|
| i. පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව | අදාල වන ඕනෑම පාර්ශවයක් | භාෂා 3න්ම AIIB හා NBRO වෙබ් අඩවිවල |

| | | |
|---|---|---|
| ii. ව්‍යාපෘති සැලසුම (ස්ථාන පිළිබඳ තොරතුරු, ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේද ) | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, DFC,DWLC, දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, RDA, රාජ්‍ය ඉඩම් අයිතිකරුවන්, වෙනත් දිස්ත්‍රික් මට්ටමේ ආයතන,NBRO දිස්ත්‍රික් කාර්යාල,AIIB | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු, එකඟතා අත්සන් කිරීමට අවශ්‍ය ලියලියවිලි ඉදිරිපත් කිරීම, අනුමැතියන් හා කැමැත්ත |
| iii. ස්ථානීය පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම් | අදාල වන ඕනෑම පාර්ශවයක් සහ දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, DFC, DWLC,AIIB | භාෂා 3න්ම AIIB හා NBRO වෙබ් අඩවිවල රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු, එකඟතා අත්සන් කිරීමට අවශ්‍ය ලියලියවිලි ඉදිරිපත් කිරීම, අනුමැතියන් හා කැමැත්ත |
| iv. අධීක්ෂණ වාර්තා (මූලික හා ඉදිකිරීම් අතරතුර) | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, DFC, DWLC,AIIB සහ අදාල වන වෙනත් පාර්ශව | ප්‍රගති රැස්වීම්, විශේෂ රැස්වීම්, අදාල වාර්තා ඉදිරිපත් කිරීම් |
| v. සේවකයන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳව පාරිසරික තහවුරු කර ගැනීම සඳහා ස්ථානීය පරීක්ෂා | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, DFC, DWLC, RDA, ප්‍රාදේශීය ලේකම්, පොලීසිය, රාජ්‍ය ඉඩම් අයිතිකරුවන්, ග්‍රාම නිලධාරී, NBRO දිස්ත්‍රික් කාර්යාල,, AIIB සහ අදාල වෙනත් පාර්ශව | ලිඛිත හා වාචික සන්නිවේදන, අදාල වාර්තා ඉදිරිපත් කිරීම |
| vi. ES වලට අදාලව ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී ගන්නා ලද තීරණ | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, DFC, DWLC, RDA, ප්‍රාදේශීය ලේකම්, පොලීසිය, රාජ්‍ය ඉඩම් අයිතිකරුවන්, ග්‍රාම නිලධාරී, NBRO දිස්ත්‍රික් කාර්යාල,, AIIB සහ අදාල වෙනත් පාර්ශව | රැස්වීම්, අදාල වාර්තා ඉදිරිපත් කිරීම් |
| vii. දුක්ගැනවිලි | අදාල පාර්ශව, AIIB | රැස්වීම්, ලිඛිත හා වාචික සන්නිවේදන |

# 6 වන පරිච්ඡේදය- අනුමැති/ කැමැත්ත/ යෝග්‍යතා හා එකඟතා

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අවස්ථාවේදී බොහෝ අනුමැතියන්, කැමැත්ත සහ යෝග්‍යතා ලබා ගැනීමට සිදු වනු ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනුමැතියන්, කැමැත්ත සහ යෝග්‍යතා ලබා ගැනීමට වගකිව යුතු ආයතනය වන්නේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ය.

## 6.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතියන් ලබා ගැනීම

i. **ප්‍රාදේශීය ලේකම් මඟින් අනුමැතිය ලබා ගැනීම**
අවම කිරීම සඳහා අවශ්‍ය ස්ථාන තෝරා ගැනීම ප්‍රාදේශීය ලේකම්වරු විසින් NBRO වෙත නායයෑම් ආපදා පිළිබඳව ඉදිරිපත් කරන ලද ලැයිස්තුවෙන් තෝරාගන්නා ලදී. යෝජිත අවම කිරීමේ තාක්ෂණික හා වානිජමය ශාඛ්‍යතාවයෙන් පසුව සුදුසු ස්ථාන තෝරා ගන්නා ලදී. මෙම ස්ථාන පිළිබඳව ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දී ඔවුන්ගෙන් අනුමැතිය ලබා ගැනේ. ස්ථාන 27 සඳහා මෙම ක්‍රියාවලිය මේ වනවිටත් සිදු කර ඇත.

ii. **දිස්ත්‍රික් ලේකම් මඟින් අනුමැතිය ලබා ගැනීම**
ප්‍රධාන අමාත්‍යවරයා හා දිස්ත්‍රික්ක වල වගකිව යුතු ආයතන සම්බන්ධ වන දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවේදී ව්‍යාපෘති යෝජනා දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු අතර එම යෝජනා සඳහා ඔහුගෙන් අනුමැතිය ලබා ගත යුතුය. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි නිලධාරියෙකු විසින් ව්‍යාපෘතිය, ව්‍යාපෘතියේ තොරතුරු ඉදිරිපත් කරන අතර විවිධ පාරිසරික හා සමාජයීය ගැටළු සාකච්ඡා කරනු ලැබේ. මෙහිදී ගන්නා ලද අදාළ වන තීරණ, නිර්දේශ හා සැලකිල්ලට ගත යුතු කරුණු මෙන්ම පාරිසරික හා සමාජයීය කළමනාකරණ විශේෂතා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලසුමට ඇතුලත් කරනු ලැබේ.

iii. **සැලසුම් කමිටුවෙන් අනුමැතිය ලබා ගැනීම**
ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන අනුමැතිය පළාත් පාලන ආයතන, නගරසභා හා නාගරික කවුන්සිල වල සැලසුම් කමිටු මඟින් ලබා ගැනේ.

## 6.2 රජයේ ඉඩම්වල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කැමැත්ත ලබා ගැනීම

වගකිව යුතු පාර්ශව පිළිබඳව කරන ලද විශ්ලේෂණයට අනුව ව්‍යාපෘතිය සඳහා භාවිතා කරනු ලබන ඉඩම් මාර්ග සංවර්ධන අධිකාරිය(RDA), වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව (FD), වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව(DWC), ශ්‍රී ලංකා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම(LRC), දිස්ත්‍රික් ලේකම්ට අයත් වන රජයේ ඉඩම් යන ආයතන සතු වුවහොත් එම ඉඩම් සඳහා යෝග්‍යතා ලබා ගත යුතු වේ.

ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ඉඩම් අයිති පුද්ගලයන්ගෙන් එම ඉඩම් ව්‍යාපෘතිය සඳහා ලබා දීමට කැමැත්ත ලබා ගනු ලැබේ. අදාල ආයතන වල කොන්දේසි වලට යටත්ව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. ඉඩමට ප්‍රවේශ වීම, ඉදිකිරීම් කටයුතු කරගෙන යාම, ද්‍රව්‍යයන් ඉවත් කිරීම (ගස්, පස්, ගල් සහ පාෂාණ කුට්ටි) , ව්‍යුහ ඉවත් කිරීම සහ වැඩ දිගටම පවත්වා ගෙන යාම හා නඩත්තු කිරීම යන කාරණා කරගෙන යාම සඳහා NBRO හා අදාල ආයතන අතර එකඟතා ගිවිසුම් ඇති කර ගනී. එම අදාල ආයතන වන්නේ මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යන ඒවායි. **(ඇමුණුම III හි ඇති එකඟතා ගිවිසුම් ආකෘතිය බලන්න)**

### 6.2.1 මාර්ග සංවර්ධන අධිකාරියේ රක්ෂිත ප්‍රදේශ වල නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති පවත්වා ගෙන යාම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය යෝජිත ක්‍රියාවලිය

a) මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සමාලෝචනයට භාජනය කරනු ලබන සැලසුම් ලබා දිය යුතු අනුමැතියේ ස්වභාවය ද දක්වමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත සවිස්තර සැලසුම් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ඉහත සඳහන් කළ ලියකියවිලි සකස් කළ යුතු අතර ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරි කාර්යාල වෙත ලබා දිය යුතුය.

b) ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරි කාර්යාල මඟින් එම යෝජනා විශ්ලේෂණය කර බලන අතර ඉන් පසු ව්‍යාපෘතිය පිළිබඳ කෙටි හැඳින්වීමක් සඳහා රැස්වීමක් කැඳවනු ඇත. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් අවශ්‍ය හැඳින්වීම් සැපයිය යුතුය.

c) මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් කැමැත්ත ලබා දුන් පසු ස්ථානය සඳහා ප්‍රවේශ වීමට, ව්‍යුහ ඉවත් කිරීමට සහ අවම කිරීමේ වැඩ ආරම්භ කිරීමට අවසර දෙමින් මාර්ග සංවර්ධන අධිකාරිය හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනය අතර එකඟතා ගිවිසුමක් අත්සන් කෙරේ.

d) ඇතුලත් විය හැකි කොන්දේසියක් වන්නේ
- අවම කිරීමේ ක්‍රියාවලියෙන් පසුව එම ස්ථාන නැවත භාර දීමේ විධිමත් ක්‍රියා පටිපාටියක් තිබිය යුතුය.
- අවම කිරීමේ කටයුතු වලින් පසුව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කටයුතු සිදු කරනු ඇත.
- සෑම අවස්ථාවකම කොන්ත්‍රාත්කරු විසින් වාහන, පදිකයන් සඳහා ආරක්ෂක මාර්ග සපයා දිය යුතු අතර, මාර්ග තදබද සඳහා අවශ්‍ය අවශ්‍ය ආරක්ෂක ක්‍රම, බාධක, කොඩි මිනිසුන් වැනි දේ ද රාත්‍රී කාලයේ වැඩ කිරීම සඳහා ලාම්පු හා ආලෝකය ලබා දිය යුතුය.
- ඉදිකිරීම් කටයුතු වලින් ඉවත් කරන අපද්‍රව්‍ය/කැනීම් කරන ලද ද්‍රව්‍ය මාර්ග රක්ෂිත වල තැන්පත් නොකළ යුතු අතර ඒවා පොදු ජනතාවට/ මඟීන්ට කරදරයක් නොවිය යුතුය.
- වාතය හා ජලය සඳහා දූෂණ පාලනය කිරීමක් අවශ්‍ය වේ.
- අවසාදිත සහිත ජලය මාර්ග දිගේ ගලා යාම සිදු නොවිය යුතු අතර ඒ සඳහා අවශ්‍ය අවසාදිත පාලන ක්‍රමයන් භාවිතා කළ යුතුය.
- වාහන හා ඉදිකිරීම් යන්ත්‍ර නවතා තැබීම මඟින් පදික වේදිකා අවහිර නොවිය යුතුය.
- රාත්‍රී ලාම්පුද ඇතුලත් ආරක්ෂක සංඥා අනිවාර්ය වේ.

### 6.2.3 මධ්‍යම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් යෝග්‍යතා ලබා ගැනීම

i. බොහෝ ස්ථාන පාරිසරිකව සංවේදී ප්‍රදේශ වල පිහිටා තිබෙන නිසා දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය මඟින් අවසර ලබා ගත යුතු වේ.

ii. ව්‍යාපෘති ක්‍රියාකාරකම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නීතිමය සීමා තුල ක්‍රියාත්මක කෙරේ නම් එම ආයතන වලින් අවසර ලබා ගත යුතු වේ.

iii. යම් ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා සංරක්ෂිත විශේෂ ඉවත් කිරීමට සිදු වනු ඇත. සංරක්ෂිත ශාක ඉවත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් මාර්ගයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අවසර ලබා ගත යුතුය.

**නායයෑම් අවම කිරීමේ ස්ථාන සඳහා පහත සඳහන් ක්‍රියාවලිය යෝජනා කර ඇත. මෙම ක්‍රියාවලිය අදාල ආයතන වල උපදේශන මත හා පෙර මීට සමානව සිදු කර ඇති ව්‍යාපෘතිවල අත්දැකීම් මත පාදක වී සකස් කර ඇත.**

i. **දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය සඳහා වන යෝජිත යෝග්‍යතා ක්‍රියාවලිය**

a) ව්‍යාපෘතිය සඳහා සුදානම් වන අදියරේදී ව්‍යාපෘති කළමනාකරණ ඒකකය හි ES හා H&S අංශ විසින් ව්‍යාපෘති සැලසුම් හා ස්ථානීය පාරිසරික සහ සමාජයීය කළමනාකරණය සැලසුම් අධ්‍යනය කරන අතර ඉන් අනතුරුව ව්‍යාපෘතිය සඳහා යෝග්‍යතා ලබා දෙන ලෙස ඉල්ලා දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉල්ලීමක් කළ යුතුය. මෙහිදී ව්‍යාපෘතිය මඟින් බලපෑමට ලක්වන ප්‍රදේශයේ අවකාශීය විහිදීම පිළිබඳව ස්ථානීය පාරිසරික සහ සමාජයීය කළමනාකරණය සැලසුමෙහි දැක්වෙන ආකාරයට සඳහන් විය යුතුය.

b) ඉහත සඳහන් කළ තොරතුරු සමඟ මූලික තොරතුරු ඇතුලත් ප්‍රශ්නාවලියක් සම්පූර්න කර ඉදිරිපත් කළ යුතුය.

c) මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ව්‍යාපෘතිය පිළිබඳ කෙටි හැඳින්වීමක් හා පාරිසරික සහ සමාජයීය කළමනාකරණය සැලසුම් පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා රැස්වීමක් කැඳවනු ලබන අතර එම තොරතුරු මඟින් සැපයිය යුතු වේ.

d) ව්‍යාපෘතිය මඟින් සැලකිය යුතු ස්ථානීය කොන්දේසි මත පදනම්ව යෝග්‍යතාය ලබා දෙනු ඇත.

ii. **වන සංරක්ෂිත ප්‍රදේශ වල නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් යෝග්‍යතා ලබා ගැනීමේ ක්‍රියාවලිය**

a) ව්‍යාපෘතිය සඳහා සුදානම් වන අදියරේදී ව්‍යාපෘති කළමනාකරණ ඒකකය හි පාරිසරික සමාජයීය හා සෞඛ්‍යාරක්ෂක ඒකකය විසින් ව්‍යාපෘති සැලසුම් හා ස්ථානීය පාරිසරික සහ සමාජයීය කළමනාකරණය සැලසුම් අධ්‍යනය කරන අතර ඉන් අනතුරුව ව්‍යාපෘතිය සඳහා යෝග්‍යතා ලබා දෙන ලෙස ඉල්ලා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල වෙත ඉල්ලීමක් කළ යුතුය. මෙහි ව්‍යාපෘතිය මඟින් බලපෑමට ලක්වන ප්‍රදේශයේ අවකාශීය විහිදීම පිළිබඳව විස්තර (සහ ස්ථානීය පාරිසරික සහ සමාජයීය කළමනාකරණය සැලසුමේ එම වන සම්පත වෙත අදාල වන අංශය ද දක්වමින්) සඳහන් විය යුතුය. මෙම අනුමැතිය සියලුම වනාන්තර ප්‍රදේශ වලට අදාල වේ. (ප්‍රකාශිත හා ප්‍රකාශයට පත් නොකළ)

b) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති සැලසුම්, යෝග්‍යතාවය ලබා දිය යුතු ඉඩම් යනාදිය අධ්‍යනය කරන අතර ව්‍යාපෘතිය මඟින් බලපෑමට ලක් වන ප්‍රදේශයේ තිබෙන ඒ ඒ වාසස්ථාන විශේෂිත වල වැදගත් බව හා ඉවත් කළ යුතු ගස් ප්‍රමාණය ආදිය පිළිබඳවද සැලකිල්ලට ගනී.

c) මෙම අවස්ථාවේදී ව්‍යාපෘතිය මඟින් බලපෑමට ලක් වන විටිනා ගස් ආරක්ෂා කරන ලෙස ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත දැනුම් දීමක් සිදු කරනු ලැබේ.

d) එම ඉල්ලීම ක්‍රියාත්මක කිරීම සඳහා කිසිදු මුල්‍යමය හා සැලසුම් වෙනස් වීමක් සිදු නොවන්නේ නම් එම ඉල්ලීම සලකා බැලේ(කෙසේ වුවද, සැලසුම් අවස්ථාවේදී මේ පිළිබඳව ව්‍යාපෘතිය මඟින් සැලකිල්ලට ගෙන ඇති නිසා සැලසුම් වලට කිරීමට සිදු වන වෙනස්කම් අවම වේ).

e) පරීක්ෂණයෙන් අනතුරුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් වාර්තාවක් ඉදිරිපත් කෙරන අතර අවශ්‍ය ගස් කැපීම සඳහා දැව සංස්ථාව වෙත භාර දේ. ගස් කැපීම කොන්ත්‍රාත්කරු විසින් සිදු කළ හැකි අතර දිග පළල උසසෙ.මී. 18ට වඩා වැඩි සෑම ගසක්ම දැව සංස්ථාව විසින් තම භාරයට ගනු ලැබේ.

f) ව්‍යාපෘතිය මඟින් සැලකිය යුතු ස්ථානීය කොන්දේසි මත පදනම්ව යෝග්‍යතාය ලබා දෙනු ඇත.
g) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අයිතියට ලක් වේ නම් එකඟතා ගිවිසුම් අත්සන් කළ යුතු වේ.

### iii. වනජීවී සංරක්ෂිත ප්‍රදේශ වල ඇති ඉඩම් යෝග්‍යතාය කිරීම සඳහා ඇති ක්‍රියාමාර්ගය

a) ව්‍යාපෘතිය සඳහා පිළියෙළ කිරීම් කටයුතු සිදුකරන අතරතුර, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාරිසරික සමාජයීය හා සෞඛ්‍යාරක්ෂක ඒකකය විසින් ස්ථානීය පාරිසරික සහ සමාජයීය කළමනාකරණ සැලසුම් අධ්‍යනය කර, ව්‍යාපෘති ක්‍රියාවලි නිසා බලපෑමට ලක්වන ගුවන් වපසරිය පිළිබඳ විස්තර ද (පාරිසරික සහ සමාජයීය කළමනාකරණ සැලසුමේ ගස්වැල් හා සත්ත්ව කොටස් සඳහා අදාළ අංශය යොමුවට ගන්න), වනජීවී සංරක්ෂිත පෙදෙස් වල, ස්වාරක්ෂක පෙදෙස් වල සහ වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂා ආඥා පනත යටතට ගැණෙන විශේෂ පවතින භූමි තුල ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට අවසර ඉල්ලීමක් ද ඇතුලත් විය යුතු වේ.
b) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ස්ථානය පරික්ෂා කර බලන අතර ආරක්ෂා කළ යුතු විශේෂ එම ස්ථානයේ සිටීම නම් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස දැනුම් දෙනු ඇත.
c) ව්‍යාපෘති සැලසුමට හා එහි වියදමට එම ඉල්ලීම සරිලන්නේ නම් ව්‍යාපෘති සැලැස්ම මඟින් එය සැලකිල්ලට ගනු තා.
d) ව්‍යාපෘතිය මඟින් සැලකිය යුතු ස්ථානීය කොන්දේසි මත පදනම්ව යෝග්‍යතාය ලබා දෙනු ඇත.
e) ව්‍යාපෘතිය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් වල සිදු වන්නේ නම් ඒ සඳහා එකඟතා ගිවිසුමක් අත්සන් කළ යුතුය.

## 6.3 වෙනත් අනුමැතියන්

i. පස්, ගල් හා ඛනිජ ප්‍රවාහනය හා බැහැර කිරීම සඳහා ප්‍රාදේශීය භූ විද්‍යා හා පතල් කාර්යංශයේ කාර්යාලය මඟින් අනුමැතිය ලබා ගත යුතුය.
ii. අපද්‍රව්‍ය හා ශාක කොළරොඩු බැහැර කිරීම සඳහා පළාත් පාලන ආයතන වලින් අනුමැතිය ලබා ගත යුතු වේ.
iii. ස්ථානීය පාෂාණ පිපිරවීම් සඳහා ආරක්ෂක අමාත්‍යංශයේ දිස්ත්‍රික් කාර්යාල මඟින් අවසර ලබා ගත යුතුය.

## 6.4 කැමැත්ත/ විරෝධයක් නොමැති බව/ පුද්ගලික ඉඩම් වල අයිතිය සඳහා බැඳී ඇති නීතිමය එකඟතා

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම නිදහස් කර ගත යුතුය. ඉඩම් වල ජීවත්වීම දැනටමත් අවදානම් ලෙස සැලකෙන බැවින් ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමක් සිදු නොවනු ඇත. එම නිසා ඉඩම් නිදහස් කර ගැනීම සඳහා ක්‍රියාමාර්ගයක් අනුගත කර ගත යුතු වේ. මේ යටතේ පොදු කටයුත්තක් සඳහා ඉඩම් ප්‍රකාශයට පත් කිරීමේ අවශ්‍යතාවයක් ඇති වේ. කෙසේ වුවද, මේ සම්බන්ධව ඉඩම් ප්‍රකාශයට පත් කිරීමට, එනම් ඉඩම් නායයෑමේ ප්‍රවනතාවයක් ඇති ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට NBRO සතුව නීතිමය බලතල නොපවතී. වර්තමාන රෙගුලාසි වලට අනුව මේ සඳහා බලය තිබෙන්නේ ප්‍රාදේශීය ලේකම් වෙතයි. මෙමඟින් පුද්ගලික ඉඩම් ව්‍යාපෘතිය සඳහා නිදහස් කර දෙනු ඇත.

මෙහිදී මෙම ඉඩම් නායයෑමේ හැකියාවක් ඇති කලාප ලෙස ප්‍රකාශයට පත් කරන අතර ඉදිරියේදී ඒවායේ කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු කිරීමටද ඉඩ ලබා නොදේ. නමුත්

වටපිටාවේ ඇති ජනතාවගේ ජීවිත හා දේපල වල ආරක්ෂාව උදෙසා මෙම ස්ථාන සඳහා නායයෑම් අවම කිරීමේ ක්‍රම යෙදිය යුතු වේ. ඉඩමේ අයිතිකරුව හා ව්‍යාපෘතිය සඳහා අවම බලපෑමක් ඇති කරනු ලබන පහත සඳහන් ක්‍රියාවලිය මේ සඳහා උපකාර වනු ඇත.

i. මිනුම් කටයුතු හා සැලසුම් කටයුතු නිමා වීමෙන් අනතුරුව නායයෑමේ අවදානම් කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු භූමිප්‍රමාණය NBRO මගින් නිසියාකාරව සලකුණු කරනු ලැබේ.
ii. NBRO මඟින් ප්‍රකාශයට පත් කළ යුතු ඉඩම් සඳහා අවශ්‍ය ලියකියවිලි සාදන අතර එහි මෙම ඉඩම් " නායයෑමේ අවදානමක් පවතින ඉඩම්- අනාගතයේදී කිසිදු ඉදිකිරීම් කටයුත්තක් සිදු නොකළ යුතු වන අතර අවදානම් අවම කිරීමේ කටයුතු සිදු කළ යුතුයි" යන්න ඇතුලත් මිනුම් සැලැස්මද ඇතුලත්ව ප්‍රකාශයට පත් කළ යුතු ප්‍රදේශය නිසියාකාරව දක්වනු ලැබේ. මෙම ප්‍රදේශය ව්‍යාපෘතිය කරගෙන යාම සඳහා අවශ්‍ය අවම භූමිප්‍රමාණය වේ.
iii. NBRO මඟින් මෙම ලියකියවිලි ප්‍රාදේශීය ලේකම්වරු වෙත භාර දෙන අතර මෙම ඉඩම් "නායයෑමේ අවදානමක් පවතින ඉඩම්- අනාගතයේදී කිසිදු ඉදිකිරීම් කටයුත්තක් සිදු නොකළ යුතු වන අතර අවදානම් අවම කිරීමේ කටයුතු සිදු කළ යුතුයි" ලෙස ප්‍රකාශයට පත් කළ යුතු බවද දැනුම් දෙනු ලැබේ.
iv. ප්‍රාදේශීය ලේකම් මඟින් මෙම ඉඩම් නායයෑමේ අවදානමක් පවතින ඉඩම්- අනාගතයේදී කිසිදු ඉදිකිරීම් කටයුත්තක් සිදු නොකළ යුතු වන අතර අවදානම් අවම කිරීමේ කටයුතු සිදු කළ යුතුයි යනුවෙන් ප්‍රකාශයට පත් කෙරේ.
v. මෙම ක්‍රියාවලියේදී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ලබා ගැනීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් අර්ථාන්විත උපදේශන සේවයක් සිදු කළ යුතුය. මෙම උපදේශන ක්‍රියාවලියේදී පොදු අරමුණක් වෙනුවෙන් සමාජයක් වශයෙන් තිබෙන වගකීම් හා වඩා ඉහල නැවත පදිංචි කිරීමේ පැකේජයක් ලබා දීම සඳහා රජය සතුව ඇති සීමාවන් යන දේවල් ඉතා ප්‍රවේශමෙන් මතු කර දැක්විය යුතුය. ව්‍යාපෘතිය සඳහා ඉඩමේ කොටසක් පමණක් අවශ්‍ය වේ නම් ඒ පිළිබඳව ඉඩම් හිමිකරුට දැනුම් දිය යුතුය.
vi. ව්‍යාපෘතිය සඳහා ඉඩමේ කොටසක් පමණක් අවශ්‍ය වන අවස්ථාවකදී ඉඩමේ ප්‍රකාශයට පත් කළ සිමාවෙන් පිටත ඉදිරියේදී සංවර්ධන කටයුතු කර ගෙන යාම සඳහා NBRO හි උපදෙස් මත ඉඩම් හිමිකරු වෙත මුදලක් ලබා දිය යුතුය.
vii. ඉඩම් අයිතිකරුගේ නිවස හානියට පත් වේ නම් ඔහුගේ ඉඩමට හා දේපල වලට සිදුවන හානියට ගැලපෙන පරිදි රජයෙන් ලබා දෙන නැවත පදිංචි කිරීමේ වන්දි මුදල ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
viii. ව්‍යාපෘතිය සඳහා ඉඩමේ ඇති ව්‍යුහ ඉවත් කිරීමට සිදු වේ නම් ඒ සඳහා තම කැමැත්ත පල කර ඉඩම් හිමිකරු හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනය නීතිමය එකඟතා ගිවිසුමක් අත්සන කළ යුතුය (**ඇමුණුම III හි ඇති සාම්පල එකඟතා ගිවිසුම බලන්න**) මේ පිළිබඳව උපදේශන අවස්ථාවේදී ඉඩම් අයිතිකරු වෙත දැනුම් දිය යුතුය.
ix. ව්‍යුහ වල ඇති වටිනා දේවල් ඉඩම් අයිතිකරුට ඉවත් කර ගැනීමට හෝ ඉඩම් අයිතිකරු වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ඉවත් කිරීමට ඉඩ ලබා දීම.
x. ව්‍යුහ ඉවත් කිරීම සඳහා යන වියදම ව්‍යාපෘතිය මඟින් දැරිය යුතුය.
xi. එම ඉවත් කරන ව්‍යුහ ඉඩම් හිමිකරුගේ වර්තමාන පැවැත්ම සඳහා අවශ්‍ය වේ නම්, උදා: කාණු, ජලනල ව්‍යාපෘතියේ මුදල් යටතේ විකල්ප විසඳුම් ලබා දිය යුතුය.
xii. රජයේ වන්දි ලබා දෙන පැකේජ යටතේ ඉඩම් හිමිකරුවන්ටද වන්දි ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ස්ථාපිත කළ යුතු අතර ඒවා ක්‍රියාත්මක කළ යුතුය.

# 7 වන පරිච්ඡේදය- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු පාරිසරික, සමාජයීය, සෞඛ්‍ය සහ ආරක්ෂක කරුණු

## 7.1 අවම කිරීමේ සැලසුම් සඳහා පාරිසරික හා සමාජයීය වශයෙන් සැලකිය යුතු කරුණු ඇතුලත් කිරීම

අවම කිරීමේ සැලසුම් වලදී පාරිසරික හා සමාජයීය වශයෙන් සැලකිය යුතු කරුණුද ඇතුලත් කරයි. මෙහිදී පහත සඳහන් සාධක වෙත අවම බලපෑමක් වන ලෙස සැලසුම් නිර්මාණය කරයි. එම කරුණු වන්නේ ස්වභාවික වෘක්ෂලතා, ඇළවල් වල සංරෝධනය හා ඛාදනය පාලනය කිරීම, ඉහල ස්වභාවික සෞන්දර්යක් ඇති ස්ථාන වල එයට ගැලපෙන පරිදි සිදු කරනු ලබන සැලසුම්, සතුන් ගමන් කරන මාර්ග, සංවේදී පරිසර වල තිබෙන වාසභූමි සම්බන්ධිකරණ ක්‍රමවේද, මිනිසුන් හා වනජීවීන් සඳහා ජලය භාවිතා කිරීම වැනි දෑ වේ. (4.6.1. කොටසේ ඇති නායයෑම් අවම කිරීමේ ක්‍රියා සඳහා විශේෂිත සැලසුම් සාධක යන කොටස බලන්න)

## 7.2 ඉදිකිරීම් අදියරේදී සිදුවන පාරිසරික/ සමාජයීය බලපෑම් කළමනාකරණය

පාරිසරික හා සමාජයීය බලපෑම් අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සෑම නායයෑම් අවම කිරීමේ ස්ථානයකටම පොදු වේ. එවැනි බලපෑම් ඉදිකිරීම් අදියර සඳහා විශාල වශයෙන් දායක වේ. එම නිසා එම තත්වයන් අවම කිරීම කොන්ත්‍රාත්කරු සතු වගකීමක් වේ. ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුගේ ලංසු ලිපිගොනු වල ඇතුලත් විය යුතු වන **"ඉදිකිරීම් අදියරේදී කොන්ත්‍රාත්කරු විසින් වගකිව යුතු පාරිසරික හා සමාජයීය කළමනාකරණ අවශ්‍යතාවයන්"** යනුවෙන් සම්පූර්ණ ලියවිල්ලක් NBRO මඟින් (AIIB සමාලෝචන කරන ලද) සකස් කර ඇත.

මෙම ලියකියවිලි වලට අනුව කොන්ත්‍රාත්කරු විසින් පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්මක් (ලංසුවේ සඳහන් පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම සඳහාන් කොන්ත්‍රාත්කරුගේ ඇති වගකීම ප්‍රකාශ කරමින්) සහ වැඩ පිළිවෙල විස්තරයක් (පාරිසරික හා සමාජයීය කළමනාකරණ ක්‍රියා සැලැස්ම) ඔහුට ව්‍යාපෘතිය කර ගෙන යෑමට ඇති හැකියාව සමඟ ඉදිරිපත් කළ යුතුය. පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම සඳහා යන වියදම වෙනම ගෙවීමක් ලෙස සඳහන් කළ යුතුය. පාරිසරික හා සමාජයීය කළමනාකරණ වැඩ පිළිවෙල විස්තරය ඇතුලත් ප්‍රකාශය කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතු අතර එය ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් අනුමත කළ යුතුය.

**කොන්ත්‍රාත්කරුට ස්ථානීය පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැසුම් වැඩ පිළිවෙල විස්තරය පිළියෙල කිරීමේ මඟ පෙන්වීමක් ලෙස කොන්ත්‍රාත්කරුගේ ලංසු ලියකියවිලි වල 6.6. ,6.7 සහ 6.8 යන අංශවල දැක්වෙන කරුණු උපයෝගී කර ගත හැක.**

### 7.2.1. ඉදිකිරීම් අදියරේදී පාරිසරික හා සමාජයීය කළමනාකරණ සහ සෞඛ්‍යාරක්ෂක අවශ්‍යතාවය සඳහා කොන්ත්‍රාත්කරුගේ වගකීම ක්‍රියාත්මක කිරීම

ස්ථානීය තක්සේරු කිරීම් වලදී තක්සේරු කණ්ඩායම මඟින් මෙම සියලුම කොටස්වල ඇති සුවිශේෂ ස්ථානීය සංවේදීතාවයන් පිළිබඳ ඇගයීමක් සිදු කරන අතර ඉන් පසුව කොන්ත්‍රාත්කරු විසින් සපයා දිය යුතු පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්මෙහි මට්ටම පිළිබඳව තීරණය කරයි. පහත දැක්වෙන්නේ ඉදිකිරීම් අදියරේදී සැලකිය යුතු ස්ථානීය පාරිසරික, සමාජයීය සහ සෞඛ්‍ය සහ ආරක්ෂක කරුණු සඳහා අනුගමනය කළ යුතු ආකෘතියක් වේ. මෙය කොන්ත්‍රාත්කරුගේ ලංසු ලියකියවිලි වල අඩංගු කර ඇත්තේ ඔහුට එය සෑම කරුණක්ම ඉස්මතු කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීමක් ලෙස භාවිතා කළ හැකි වන පරිදි ය. එමඟින් පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්මෙහි සියලුම කොටස් ආවරණය වනු ඇත.

**වගුව 12: ඉදිකිරීම් අදියරේදී පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම සඳහා කොන්ත්‍රාත්කරුගෙන් ඇති අවශ්‍යතාව ක්‍රියාත්මක කිරීම සහ දෙන ලද ස්ථානයක් වෙත එහි අදාලත්වය (ආකෘතිය) (ඇමුණුම IV බලන්න)**

| පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම **සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුට ඇති වගකීමට අනුව නිර්දේශ අංක** | **අයිතමය** | **ස්ථානීය/ අවම කිරීමේ වැඩවලට අනුව නිර්දේශ (තක්සේරු කණ්ඩායම මඟින් අදාලත්වය පෙන්වා දෙනු ලබයි)** |
|---|---|---|
| **A පාරිසරික හා සමාජයීය අධීක්ෂණය** | | |
| A (1) | වැඩබිම තුළ ගබඩා කිරීම | |
| A (2) | ශබ්දය හා කම්පන | |
| A (3) | ගොඩනැගිලි වලට සිදු වන ඉරිතැලීම් හා හානි | |
| A (4) | අපද්‍රව්‍ය බැහැර කිරීම | |
| A (5) | අනවශ්‍ය ද්‍රව්‍ය බැහැර කිරීම | |
| A (6) | දූවිලි පාලනය කිරීම | |
| A (7) | ඉදිකිරීම් අමුද්‍රව්‍ය හා අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම | |
| A (8) | ජලය | |
| A (9) | තුරුලතා | |
| A (10) | භෞතික හා සංස්කෘතික සම්පත් | |
| A (11) | පාංශු ඛාදනය | |
| A (12) | පස දූෂණය වීම | |
| A (13) | පස් කැපීම | |
| A (14) | ගල්වලවල් ක්‍රියාත්මක කිරීම | |
| A (15) | වාහන හා යන්ත්‍ර නඩත්තු කිරීම | |
| A (16) | පොදු ජනයාට වන අවහිරතා | වගුව 12 |
| A (17) | යටිතලපහසුකම් හා මාර්ග දෙපස පහසුකම් | |
| A (18) | දෘශ්‍ය පාරිසරික වර්ධනය | |
| **A-5 පාරිසරික අධීක්ෂණය** | මූලික මැනුම් කටයුතු (වාතය, ජලය, ශබ්දය, කම්පන, ඉදිතැලීම්) | |
| | ඉදි කිරීම් අතරතුර සිදු කරනු ලබන මිනුම් කටයුතු (වාතය, ජලය, ශබ්දය, කම්පන, ඉදිතැලීම්) | |

| | | |
|---|---|---|
| | ක්‍රියාත්මක අවස්ථාවේ සිදු කරනු ලබන මිනුම් කටයුතු | |
| | වාර්තා ඉදිරිපත් කිරීම හා පවත්වා ගෙන යාම | |
| B. **වැඩබිම් තත්වයන් හා ප්‍රජාවගේ සෞඛ්‍ය හා ආරක්ෂාව** | | |
| 1 | ආරක්ෂක සංවිධාන හා සන්නිවේදනය | |
| 2. | ළමා ශ්‍රමය හා බලෙන් ලබා ගන්නා ශ්‍රමය | |
| 3 | ආරක්ෂක වාර්තා හා අනතුරු පිළිබඳ දැනුම් දීම් | |
| 4 | ආරක්ෂක උපකරණ හා ඇඳුම් | |
| 5 | ආරක්ෂණ පරීක්ෂණ | |
| 6. | ප්‍රථමාධාර පහසුකම් | |
| 8 | සෞඛ්‍ය හා ආරක්ෂක තොරතුරු සහ පුහුණුව | |
| 8. | උපකරණ ස්ථාපිත කිරීම හා සුදුසුකම් සහිත පුද්ගලයන් | |

***අදාල වේ:*** *සෑම ස්ථානයකටම අදාල වන පොදු පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්මක් ලෙස මෙම කොටස වැදගත් වේ.*
***ඉතා අදාල වේ*** *ස්ථානයට අනුව අදාල වන පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කළ බව තහවුරු කර ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු පාරිසරික ක්‍රමෝපායන් පිළිබඳ ප්‍රකාශ සැදීමේදී විශේෂ අවධානයක් යොමු කළ යුතුය.*
***අදාල වනු ඇත*** *ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේදී අදාළ අංශ හමුවුවහොත් මෙම පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්මක්‍රියාවට නංවනු ඇත.*
***අදාල නොවේ*** *හෙළිදරව් කරන ලද කොන්දේසි යටතේ මෙම කොටස අදාල නොවිය හැක.*
***විකල්පමය:*** *අවශ්‍ය වුවහොත් පමණක් ක්‍රියාත්මක කළ හැක.*
***ස්ථානීය අධීක්ෂණ සැලසුම බලන්න:*** *ස්ථානීය අධික්ෂණ සැලසුමේ සඳහන් වන පරිදි අධීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා කොන්ත්‍රාත්කරු වගකිව යුතු වේ.*
***යොමුව: පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත්කරු සතු වගකීම***

### 7.2.2. පොදු පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්මකට වඩා ඔබ්බට ගිය විශේෂ අවම කිරීමේ ක්‍රම අවශ්‍ය වන ස්ථානීය වශයෙන්ම පමණක්ම විශේෂ වන අවස්ථාවක ඉදිකිරීම් අදියරේදී සලකා බැලිය යුතු වෙනත් අවම කිරීමේ ක්‍රමවේදයන්

ඉදිකිරීම් අදියරේදී පොදු පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්මකට වඩා වැඩි දෙයක් අවශ්‍ය වන අවස්ථාවකදී ඉදිරිපත් කිරීමට සුදුසු ඉහල විශේෂත්වයකින් යුතු අවම කිරීමේ ක්‍රමවේද පාරිසරික හා සමාජයීය තක්සේරු වාර්තාවේදී මතුකර දැක්වීම තක්සේරු කණ්ඩායමෙන් අපේක්ෂා කෙරේ. ස්ථානයට අදාලව මෙය කොන්ත්‍රාත්කරුගේ ලංසු ලියකියවිලි කොටසක් ලෙස ඇතලත් වනු ඇත. ඔහු විසින් ලංසු **සමඟ හෝ වැඩ පිළිවෙල විස්තරය තුළ** එම **සුවිශේෂී ස්ථානීය පාරිසරික හා සමාජයීය ගැටළු අවම කරන අයුරු පිළිබඳව යෝජිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්මෙහි සඳහන් වී තිබිය යුතුය.**

## 7.3 අධීක්ෂණය

### 7.3.1 පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක වන ආකාරය අධික්ෂණය කිරීම

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි පාරිසරික හා සමාජයීය විශේෂඥ කණ්ඩායම විසින් හෝ උපදේශක පාරිසරික හා සමාජයීය විශේෂඥ කණ්ඩායම විසින් කොන්ත්‍රාත්කරු විසින් පාරිසරික හා සමාජයීය සැලැස්ම ක්‍රියාත්මක කරනු ලබන ආකාරය අධීක්ෂණය කරනු ලබයි. කොන්ත්‍රාත්කරුගේ පාරිසරික හා සමාජයීය ක්‍රමෝපායන් පිළිබඳ ප්‍රකාශය එහි ප්‍රමාණවත් භාවය තීරණය කිරීම සඳහා ඇගයීමට ලක් කරන අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් අනුමැතිය ලබා දේ.

මෙම ක්‍රියාවලිය තුලින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි පාරිසරික කණ්ඩායම පහත කරුණු ලබා ගනු ඇත.

i. ආරක්ෂක අවශ්‍යතා සමඟ ව්‍යාපෘතියේ ඇති ගැලපීම තහවුරු කර ගැනීම
ii. අධීක්ෂණ ප්‍රතිඵල ලියකියවිලිගතකර හෙළි කරන අතර මෙම අධීක්ෂණ වාර්තා අධ්‍යයනය කිරීමෙන් අවශ්‍ය නිවැරදි කිරීමේ හා වලක්වා ගැනීමේ ක්‍රියා මොනවාද යන්න හඳුනා ගනී.
iii. ආරක්ෂක අධීක්ෂණය පිළිබඳ වාර්තා AIIB වෙත ඉදිරිපත් කිරීම
iv. බලාපොරොත්තු වන ප්‍රතිඵල ලඟා කර ගැනීම සඳහා නිර්දේශිත ක්‍රියා අනුගමනය කිරීම

### 7.3.2 පාරිසරික ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම

අදාළ සංවේදී අංග තිබේ නම් කොන්ත්‍රාත්කරු විසින් පරිසර විද්‍යාව, වාතයේ ගුණාත්මකභාවය, ජලයේ ගුණාත්මකභාවය, පසුබිම් ශබ්ද දූෂණය හා පොලවේ සිදුවන කම්පන ආදිය පිළිබඳව මූලික පරිසර තත්ත්ව අධීක්ෂණයක් සිදු කළ යුතුය. නිවාස හා ගොඩනැගිලි (විශේෂයෙන් පැරණි සංස්කෘතික ගොඩනැගිලි සහ පන්සල් ගොඩනැගිලි) අදාල ස්ථාන වලට සමීපව පිහිටා තිබේ නම් පූර්ව පැළුම් සමීක්ෂණයක් සිදු කළ යුතුය. ඉදිකිරීම් අදියරේදී ව්‍යාපෘතිය නිසා පරිසරයට මුදා හැරෙන දෑ මධ්‍යම පරිසර අධිකාරියේ අනුමත මට්ටම් යටතේ තිබේදැයි බැලීම සඳහා ජලය, වාතයේ ගුණාත්මකභාවය, ශබ්දය හා කම්පන යනාදිය නිරන්තරයෙන් අධීක්ෂණයට ලක් කළ යුතුය. කම්පන වැනි පරාමිතීන් ඉතා දැඩි කම්පනයක් සිදුවන අවස්ථාවකදී පමණක් මැනීම සිදු කරනු ලබයි.

කොන්ත්‍රාත්කරු විසින් මිනුම් වාර්තා ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත ඉදිරිපත් කළ යුතු අතර ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා වාර්තා සමාලෝචනය කරහා අනුකූලතා මට්ටම යාවත්කාලීන කරනු ඇත. මධ්‍යම පරිසර අධිකාරිය මඟින් අනුමත කරන ලද දක්ෂ අධීක්ෂණ ආයතන වල සහභාගිත්වයෙන් කොන්ත්‍රාත්කරු මැනුම් කටයුතු කළ යුතු වේ.

### 7.3.3. ගොඩනැගිලි වල ඇති ඉරිතැලීම්, වාතය දූෂණය වීම, ශබ්දය, කම්පන සහ ජලයේ ගුණාත්මකභාවය සඳහා විශේෂ සැලකිල්ලක් යොමු කරවමින් අධීක්ෂණ කටයුතු සිදු කිරීම

සැලකිල්ලට ගනු ලබන අවම කිරීමේ ස්ථාන වල බෑවුම් අස්ථාවර වීම් වලින් දැනටමත් හානියට පත් නිවාස පවතී. එම නිසා නිවාස වල පැළුම් තිබීම සමාන්‍ය දෙයක් වේ. ඉදිකිරීම් අදියරේදී විශාල යන්ත්‍ර මඟින් ඇති කරනු ලබන කම්පන හේතුවෙන් මෙම පැළුම් වර්ධනය විය හැක. එමෙන්ම පෙර පැවති පිපිරීම් පෙන්වා ඒවා ඉදිකිරීම් කටයුතු සිදු කිරීමේදී ඇති වූ පැළුම් බව පවසා හිමිකරුවන් වන්දි ඉල්ලීමට පුළුවන. මෙම ගැටළු නැති කර ගැනීම සඳහා අදාල ස්ථානයට සමීපව ගොඩනැගිලි පිහිටා තිබේ නම් පැළුම් සමීක්ෂණ සිදු කළ යුතුය. අදාල ස්ථානයේ සිට මීටර් 52ක් දුරින් පිහිටා ඇති ගොඩනැගිලි මෙම පැළුම් සමීක්ෂණය සඳහා අදාල වේ. පැළුම් සමීක්ෂණ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට පෙර හා විශාල කම්පන ඇති කරනු ලබන වැඩ කරන අතරතුරදී සිදු කළ යුතුය.

ජනාවාස, මාර්ග, වනාන්තර, ඇළවල් අසල තිබෙන වැඩබිම් වල වාතයේ ගුණාත්මකභාවය, ශබ්දය හා කම්පන, ජලයේ ගුණාත්මකභාවය යනාදිය සැමවිටම මැනීම සිදු කළ යුතුය. පහත

දැක්වෙන්නේ නිර්දේශිත අධීක්ෂණ කාල සටහනයි. නමුත් මෙයටම පමනක් සිමා වීම සිදු නොකළ යුතුය.

**වගුව 13: ඉදිකිරීම් අදියර සඳහා සාම්ප්‍රදායික පාරිසරික ගුණාත්මකභාවය අධික්ෂණය කිරීමේ කාලසටහනක්**

| අධීක්ෂණය සඳහා ඇති අවශ්‍යතා | පරාමිතීන් | සංඛ්‍යාතය |
|---|---|---|
| i. මූලික අධීක්ෂණ | i. ඇළවල් වල ජලයේ ගුණාත්මකභාවය<br>ii. අධි අවදානම් නිවස සඳහා පූර්ව පැළුම් සමීක්ෂණයක්<br>iii. භූමියේ සිදුවන කම්පන<br>iv. පසුබිම් ශබ්දය මැනීම<br>v. වාතයේ ගුණාත්මකභාවය: අංශු | වරක්* |
| | vi. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා වාර්තා කළ යුතු ක්ෂුද්‍ර වාසස්ථාන තක්සේරුව | අධික පරිසර සංවේදී ස්ථාන සඳහා එක් වරක්<br>*** |
| ii. ඉදිකිරීම් අතරතුර | i. ඇළවල් වල ජලයේ ගුණාත්මකභාවය | බෑවුම් කැනීම් අතරතුර, පස් කැනීමේ කටයුතු අතරතුර (සෑම මසකම)* |
| | ii. අධි අවදානම් නිවස සඳහා පැළුම් සමීක්ෂණයක් | ඉදිකිරීම් අතරතුර සැලකිය යුතු චලනයක් සිදු වී ඇත්නම්:** |
| | iii. භූමියේ සිදුවන කම්පන | විදුම් යන්ත්‍ර, හිල් කිරීමේ යන්ත්‍ර හෝ පොලවේ කම්පන ඇති කළ හැකි ඕනෑම ක්‍රියාවක් සිදුවන අවස්ථාවකදී* |
| | iv. ඉදිකිරීම් මඟින් ඇතිවන ශබ්දය | මසකට වරක් අධික ශබ්දය ඇති වන අවස්ථාවක* |
| | v. වාතයේ ගුණාත්මකභාවය: අංශු | මසකට වරක්* |
| vi. වාහන වලින් පිටවන දුම් | සියලුම යන්ත්‍ර/ වාහන සඳහා විමෝචන පාලන සහතික පත්‍රයක් තිබිය යුතුය. උපදේශකවරයාගේ ස්ථානීය පාරිසරික හා සමාජයීය නිලධාරියා මඟින් පරික්ෂා කර බැලිය යුතුය. | |
| vi. අධීක්ෂණ ආයතන | * පැළුම් සමීක්ෂණය හැර අන් සියලුම පරාමිතීන් මිනුම් කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි වී ඇති දක්ෂ ස්වාධින අධික්ෂණ ආයතනයක් මගින්.<br>*** ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් අනුමත කරන ලද දක්ෂ ආයතනයක් මඟින් පැළුම් සමීක්ෂණය සිදු කළ යුතුය.<br>*** ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් අනුමත ජෛව විවිධත්ව/ පරිසර පද්ධති විශේෂඥයෙකු මඟින් | |

| | |
|---|---|
| ii. වාර්තා කිරීමේ අවශ්‍යතා | ***ඇළවල් වල ජලයේ ගුණාත්මකභාවය-*** *2017 දී මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ප්‍රකාශයට පත් කළ පරිවේෂී ජල ගුණාත්මකභාවය සමඟ සංසන්දනය කිරීම*<br>***අධි අවදානම් නිවාස වල පූර්ව පැළුම් සමීක්ෂණය***- *වෘත්තීය වාර්තාවක් විය යුතුය*<br>***පොලවේ සිදුවන කම්පන***- *යන්ත්‍රසූත්‍ර, ඉදිකිරීමේ කටයුතු සහ රථවාහන ගමනාගමනය සඳහා වන අන්තර් ප්‍රමිතීන්, මධ්‍යම පරිසර අධිකාරිය*<br>***පසුබිම් ශබ්ද මැනීම***- *1996 මැයි 23 අංක 924 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය , , මධ්‍යම පරිසර අධිකාරිය*<br>***අංශුමය ද්‍රව්‍ය හා සම්බන්ධ වායු තත්ත්ව*** *- 2008 අගෝස්තු 15 අංක 1562/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ පනවන ලද ජාතික සංසරණ වායුගෝලීය ගුණාත්මක ප්‍රමිතීන් - ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරිය*<br>***ක්ෂුද්‍ර වාසස්ථාන තක්සේරු වාර්තා***- *වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව / වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව /ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි ES විශේෂඥයන් මඟින් ඇගයීම් සිදු කළ යුතු වේ.* |

## 7.4 කොන්ත්‍රාත්කරු සඳහා වන චර්යා සංග්‍රහය

කොන්ත්‍රාත් ශ්‍රම බලකාය සඳහා අදාල වන චර්යා සංග්‍රහයක් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතුය. චර්යා සංග්‍රහය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ මූලික අදහසක් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතුය.

ආවරණය කළ යුතු කරුණු වන්නේ:

i. නායයෑම් ආපදාවක් සිදුවිය හැකි අවස්ථාවකදී ස්ථානීයව ඇතිවිය හැකි අවදානම් තත්වය පිළිබඳව සලකා මේ සඳහා අදාළ වන සියලුම සෞඛ්‍ය හා ආරක්ෂක ක්‍රියාමාර්ග වලට අනුගත වීම

ii. එම ප්‍රදේශයේ ජනතාවගේ (අවදානම් තත්වයේ පසුවන හා මේ හේතුවෙන් අවාසිදායක තත්වයට පත්ව ඇති), උපදේශකවරයාගේ කාර්ය මණ්ඩලයෙහි, සේවාදායකයාගේ කාර්ය මණ්ඩලයෙහි, උප කොන්ත්‍රාත්කරුවන් සහ දෛනික සේවයකයන් ගේ ආරක්ෂාව තහවුරු කිරීම

iii. අනතුරු සිදුවීම වැලැක්වීම සඳහා පූර්ණ කාලීන නිරීක්ෂකයෙකු හා අනතුරු ඇඟවීමේ පද්ධති වැනි අවශ්‍ය කරන ආරක්ෂිත මට්ටම පවත්වා ගැනීම සඳහා කටයුතු යෙදීම. නියම කරන ලද ආරක්ෂිත උපකරණ පැලඳීම, වැළක්විය හැකිඅනතුරු වැලැක්වීම, අනතුරු හා සර්පයින් දෂ්ට කිරීම සිදුවිය හැකි ස්ථාන වල අවශ්‍ය මට්ටමට ප්‍රථමාධාර සේවා පිහිටුවිම, , රෝහල්ගත කිරීමේ කඩිනම් සැලසුම් සහ ආරක්ෂක උවදුරක් හෝ පරිසරයට තර්ජනයක් වන දේවල් වාර්තා කිරීමට බැඳී සිටීම

iv. සෑම විටම මත්කුඩු වැනි නිත්‍යානුකූල නොවන ද්‍රව්‍ය භාවිතය ද වැඩෙහි යෙදී ඇති වේලාවට මත්පැන් පානය කිරීම ද තහනම් කිරීම

v. එම ප්‍රදේශවල ජනතාව සමඟ කටයුතු කිරීමේදී ඔවුන්ව එකා මෙන් සලකා වැඩ කිරීම (අවදානමට පත් වී ඇති හා අවාසිදායක තත්වයන්ට මුහුණ දී ඇති) සිදු කළ යුතුය. උදාහරණයක් වශයෙන් පවුල් පසුබිම, ජනවාර්ගිකත්වය, ජාතිය, ස්ත්‍රී/පුරුෂභාවය, ආගම, භාෂාව, විවාහක/අවිවාහක බව, වයස, අබාධිත (ශාරීරිකව හා මානසිකව), ලිංගික හැඩ ගැස්ම, ස්ත්‍රී/පුරුෂභාවය, දේශපාලන විශ්වාස හෝ සමාජ, සිවිල් හෝ සෞඛ්‍ය තත්ත්ව යන කරුණු දැක්විය හැක.

vi. ප්‍රදේශයේ ප්‍රජාව සමඟ, ප්‍රජාවේ සාමාජිකයන් සමඟඅන්තර්සම්බන්ධතා පවත්වා ගැනීම, සහ බලපෑමට ලක් වූ පුද්ගලයින් (උදාහරණයක් ලෙස ඔවුන්ගේ සංස්කෘතික හා සාම්ප්‍රදායික ක්‍රම කෙරෙහි ආචාරශීලී ආකල්ප බෙදා හැරීමට)

vii. ලිංගික අතවර (උදාහරණයක් ලෙස, තහනම් කිරීම, විශේෂයෙන්ම කාන්තාවන් සහ/හා ළමයින් කෙරෙහි නුසුදුසු ආකාරයේ, හිරිහැරදායක, අපවාදාත්මක, ලිංගිකව

අවුස්සන සුළු, අවමන් කරන සුළු හෝ සංස්කෘතියට නොගැලපෙන භාෂාවක් භාවිතා කිරීම හෝ චර්යාවෙහි යෙදීම)

viii. ලිංගික සහ/හෝ ස්ත්‍රී පුරුෂභාවය හේතුපාදක කරගෙන සිදු කරන හිංසන ඇතුළු වෙනත් හිංසන . (උදාහරණයක් ලෙස ශාරීරිකව, මානසිකව හෝ ලිංගිකව හිරිහැර හෝ පීඩා ඇතිවිය හැකි ආකාරයට හැසිරීම, එවැනි ක්‍රියා සිදු කරන බව පවසා තර්ජනය කිරීම, බලහත්කාරකම් කිරීම හා නිදසහ අවම කිරීම)

ix. ලිංගික අපයෝජන හා හිංසන ඇතුලත් වෙනත්විවිධ සූරාකෑම් (උදාහරණයක් ලෙස මුදල් , රැකියා, ද්‍රව්‍ය හෝ සේවා ලිංගික කටයුතු සඳහා, එනම් ලිංගික වශයෙන් බලාපොරොත්තු වන උපකාර හෝ වෙනත් ආකාරයක නින්දා පමුණුවන සුළු, අවමන් කරවන සුළු, අපයෝජනකාරී හැසිරීම් හෝ බලය අයුතු ලෙස භාවිතා කිරීම වෙනුවට හුවමාරු කිරීම) ළමා රැකවරණය(මේ සඳහා ලිංගික ක්‍රියාකාරකම් සහ අපචාර හෝ දරුවන් කෙරෙහි වෙනත් අනිසි හැසිරීම් වලට තහංචි පැනවීම, , දරුවන් හා ඇති අන්තර්සබඳතා සීමා කිරීම සහ ව්‍යාපෘති භූමිය තුල ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම යන කරුණු ඇතුලත් වේ)

x. සනීපාරක්ෂක අවශ්‍යතා (උදාහරණයක් ලෙස සේවකයන් සඳහා අවශ්‍ය වන සනිපාරක්ෂක පහසුකම් විවෘත ස්ථානවල නොවන ආකාරයට සපයා දීම)

xi. බැදියා පිළිගැටුම් වැලැක්වීම(එනම් මුල්‍යමය, පවුල් හෝ පුද්ගලික සබඳතාවක් සහිත කිසිදු පාර්ශවයක් වෙත ප්‍රතිලාභ, කොන්ත්‍රාත්තු හෝ රැකියා අවස්ථා හෝ කිසිදු අයුරේ විශේෂ සැලකීමක් හෝ උපකාර කිරීමක් සිදු නොවන පරිදි)

xii. වැඩ සඳහා ලබා දෙන පාරිසරික හා සමාජයීය රීති ද ඇතුළු) සාධාරණ උපදෙස් වලට ගරු කිරීම

xiii. දේපල ආරක්ෂා කිරීම සහ නිසියාකාරව භාවිතයට ගැනීම (උදාහරණයක් ලෙස සොරකම් කිරීමට ඉඩ ලබා නොදීම, නොසැලකිලිමත්බව හෝ අපද්‍රව්‍ය බැහැර කිරීම තහනම් කිරීම දැක්විය හැක)

xiv. මෙම චර්යා සංග්‍රහය උල්ලංඝනය වන්නේ නම් එය වාර්තා කිරීමට ඇති යුතුකම

xv. මෙම චර්යා සංග්‍රහය උල්ලංඝනය කිරිමක් පිළිබඳව යහපත් පරමාර්ථයෙන් කරන ලද පැමිණිලි කිරීම් වලට පැමිණිලිකරුවන් ගෙන් පලිගැනීම් නොකිරීම

මෙම චර්යාධර්ම සංග්‍රහය පැහැදිලි භාෂාවකින් ලිවිය යුතු අතර පහත දෑ සඳහා එකඟ වන බව පෙන්වීමට සියලුම අවශ්‍ය පුද්ගලයන් අත්සන් තබා තිබිය යුතුය. ඒවා නම්: මෙම වර්තාවේ පිටපතක් ඔවුන්ට ලැබී තිබේ; මෙම වර්තාව ඔවුන්ට පැහැදිලි කර දෙන ලදී; මෙම කොන්දේසි වලට එකඟ වීම හා එයට අනුව ක්‍රියා කිරීම තම රාජකාරියේ කොටසේ බව වටහා ගෙන ඇත; මෙම කොන්දේසි කඩ කිරීම ඉතා බරපතල විපාක ගෙන දෙන බව හා එය රාජකාරියෙන් ඉවත් කිරීමට හෝ නිතිය ඉදිරියට පැමිණවීමට හෝ හේතු විය හැකි බව වටහා ගෙන ඇත.

කොන්ත්‍රාත්කරුගේ වැඩබිම් කාර්යාලයේ මෙම චර්යාධර්ම වාර්තාවේ පිටපතක් ප්‍රදර්ශනය කෙරේ. එය සුදුසු භාෂා වලින් ඉදිරිපත් කෙරෙනු ඇත.

# 8 වන පරිච්ඡේදය- දුක්ගැනවිලි සාධනීය ලෙස විසඳීම සඳහා වන යාන්ත්‍රණය

දුක්ගැනවිලි විසඳීම සඳහා වන යාන්ත්‍රණය යනු AIIB මඟින් ආධාර සපයනු ලබන ව්‍යාපෘති වල කොටසක් වේ. දුක්ගැනවිලි විසඳීම සඳහා වන යාන්ත්‍රණයක් යනු පහල සිට ඉහලට විහිදෙන බහු ස්ථර ව්‍යුහයකි. මෙම ව්‍යාපෘතිය සඳහා ස්ථර 3ක දුක්ගැනවිලි විසඳීමේ ව්‍යුහයක් යෝජනා කර ඇත. ලැබෙන සියලුම වාචික හෝ ලිඛිත පැමිණිලි ව්‍යාපෘති

කළමනාකරණ ඒකකය, උපදේශකවරයා විසින් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් ලබා ගනී. දුක්ගැනවිලි පිළිබඳ ක්‍රියාකිරීම සඳහා ව්‍යාපෘතිය විසින් දැනට පවතින ආයතනික ව්‍යුහය භාවිතා කරනු ලැබේ. ඒවා වන්නේ NBRO හි දිස්ත්‍රික් කාර්යාලයි. නායයෑම් අවදානම් ප්‍රදේශවල සිටින වගකිව යුතු ආයතන, ග්‍රාම නිලධාරී, අවදානමේ සිටින ජනතාව සහ පොදු ජනයාට වඩාත් හුරුපුරුදු ස්ථානය වන්නේ මෙම දිස්ත්‍රික් කාර්යාලයි. ව්‍යාපෘතිය හේතුවෙන් ඇති වන දුක්ගැනවිලි හඳුනා ගත හැකි ආකාරයෙන් මෙම ස්ථර දැනටමත් ක්‍රියාත්මක කර ඇත. සෑම ව්‍යාපෘති කාර්යාලයකම පැමිණිලි පෙට්ටියක් පවත්වාගෙන යනු ලැබේ. පැමිණිලි සටහන් කිරීම සඳහා ලේඛනයක් සෑම ව්‍යාපෘති කාර්යාලයකම පවත්වා ගෙන යයි. සෑම පැමිණිල්ලක්ම සඳහාම ගෞරවයෙන්, අචරශිලිව සහ සංවේදීභාවයකින් සලකනු ලැබේ.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් සෑම ව්‍යාපෘති පැකේජයක් සඳහාම දුක්ගැනවිලි විසඳීම සඳහා වන යාන්ත්‍රණයක් ස්ථාපිත කරනු ලබන අතර දුක්ගැනවිලි විමසීමේ කමිටුවක් ද පත් කරනු ලැබේ. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන පාරිසරික හා සමාජයීය බලපෑම් නිසා ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන පාර්ශව සඳහා ඇති දුක්ගැනවිලි භාර ගැනීම හා ඒවා සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම දුක්ගැනවිලි විමසීමේ කමිටුවෙහි රාජකාරියයි. මීට අමතරව දිස්ත්‍රික් කාර්යාල මඟින්ද පැමිණිලි භාර ගනු ලබන අතර ඒවා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත යොමු කෙරේ.

i. **ව්‍යාපෘති කාර්යාල මට්ටමින් පැමිණිලි විභාග කිරීම**: උපදේශකගේ හෝ කොන්ත්‍රාත්කරුගේ පාරිසරික හා සමාජයීය කටයුතු පිළිබඳ අංශය විසින් ඔවුන්ට හැකි පරිදි පැමිණිලි විසඳීම සඳහා අවශ්‍ය සියලු පියවර ගනු ඇත.

ii. **ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මට්ටමින් පැමිණිලි විභාග කිරීම**: ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් නිතිපතා දුක්ගැනවිලි විසඳීමේ ක්‍රියාවලිය පිළිබඳ සමාලෝචනය කරනු ලැබේ. ප්‍රගති සමාලෝචනයේදී ඉහල මැදිහත් වීමක් අවශ්‍ය පැමිණිලි විසඳීම සඳහා පහත සමාජිකයන්ගෙන් යුතු කමිටුවකට භාර දේ. එම කමිටුවේ සාමාජිකයන් වන්නේ, ව්‍යාපෘති අධ්‍යක්ෂක, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ජ්‍යෙෂ්ඨ පාරිසරික හා සමාජයීය විශේෂඥයන්, උපදේශක පාර්ශවයේ ජ්‍යෙෂ්ඨ පාරිසරික හා සමාජයීය විශේෂඥයන් වේ. මෙම කමිටුව මඟින් පැමිණිලි විභාග කර බලන අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මට්ටමින් ලබා දිය හැකි විසඳුම් නිර්දේශ කෙරේ.

iii. **දුක්ගැනවිලි විමසීමේ පිළිබඳ කමිටුව මට්ටමින් පැමිණිලි විභාග කිරීම**: ඇතිවිය හැකි සමහරක් ගැටළු ඉතා සංකීර්ණ විය හැකි අතර ඒවා ව්‍යාපෘති මට්ටමින් විසඳිය නොහැකි වනු ඇත. එවැනි පැමිණිලි දුක්ගැනවිලි විමසීමේ පිළිබඳ කමිටුව වෙත යොමු කරනු ලැබේ. එවැනි අවස්ථාවකදී බලපෑමට ලක් වූ පාර්ශවයේ දුක්ගැනවිලි, ග්‍රාම නිලධාරී, ප්‍රාදේශීය ලේකම්, පළාත් පාලන ආයතන වල නියෝජිතයන්, ආගමික නායකයින් සහ වෙනත් අදාළ වන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවකින් විභාග කෙරෙනු ඇත. මෙම පැමිණිලි විභාග කිරීමට වඩාත්ම සුදුසු ස්ථානය වන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයයි. නමුත් ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන පාර්ශව ට ඇති පහසුව මත ස්ථානය වෙනස් විය හැක. දුක්ගැනවිලි වල ස්වභාවය අනුව ඒවා විසඳිම සඳහා කමිටුව හැකි සෑම උත්සාහයක්ම ගනු ඇත. පැමිණිලි සති 4ක් තුල විසඳනු ලබන අතර ලබා දෙන විසඳුම GR මඟින් ලිඛිතව පැමිණිලිකරු වෙත ලබා දේ.

iv. **පැමිණිලි වාර්තා කර ගැනීම හා තොරතුරු හෙළිදරව් කිරීම: දුක්ගැනවිලි විමසීමේ පිළිබඳ කමිටු** ලේකම් විසින් සෑම පැමිණිල්ලක්ම වාර්තා කර ඒවා

අධ්‍යනය කෙරේ. ලබා ගත් තීරණ ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන පාර්ශව සඳහා සාධාරණ නොවන්නේ නම් එම තීරණ ගැනීමට හේතුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් පහදා දෙනු ලැබේ. මෙම ක්‍රියාවලිය තුලදී අවශ්‍ය ප්‍රමාණයේ විනිවිදභාවයක් පවත්වා ගනී.

# 9 වන පරිච්ඡේදය - ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනික සැකැස්ම හා මූලික සේවක මණ්ඩලයේ කාර්යභාරය හා වගකීම්

## 9.1 ව්‍යාපෘතිය සඳහා මුල්‍ය පහසුකම් සපයන ආයතනය

ව්‍යාපෘතිය සඳහා මුල්‍ය පහසුකම් සපයන ආයතනය වන්නේ **AIIB** වේ. මෙම මුදල් ණයක් ආකාරයෙන් ශ්‍රී ලංකා රජය වෙත ලබා දේ. භාණ්ඩාගාරය හරහා මෙම මුදල්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ආයතයන (වාරිමාර්ග, ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය) වෙත ලබා දේ. පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව හා පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීමට අදාළ සංඝටකය **AIIB** හි මුල්‍ය ආයෝජන සැලසුමට ඇතුලත් වේ. **AIIB** හි පාරිසරික හා සමාජයීය අංශය විසින්, පාරිසරික හා සමාජයීය සුරැකිනා විධිවිධාන පිළිපැදෙන බව තහවුරු කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට සහය වනු ඇති අතර පාරිසරික හා සමාජයීය සුරැකිනා විධිවිධාන ක්‍රියාවට නැංවීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙතද, සාර්ථකව පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම් ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය පරිදි පාරිසරික සමාජයීය හා සෞඛ්‍යාරක්ෂක අංශය වෙතද උපදේශ ලබා දීම සිදු කෙරෙනු ඇත.

## 9.2 ක්‍රියාත්මක කිරීමේ ආයතනය හා ක්‍රියාවට නැංවීමේ ආයතන

මුළු ව්‍යාපෘතිය සඳහාම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන්නේ වාරිමාර්ග, ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යි . ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ කිරීමේ ආයතනය වන්නේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයයි. මුළු ව්‍යාපෘතියේම සැලසුම්කරණ, ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණ කටයුතු සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය හා ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ ආයතනය වගකිව යුතු වේ. ව්‍යාපෘතියේ සමස්ත පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව හා නැවත පදිංචි කිරීම් සැලසුම්කරණය කිරීමේ රාමුව ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ ආයතනය ආයතනය මඟින් සකස් කෙරෙනු ඇත. මීට අමතරව ලංසු ලියකියවිලි සඳහා අවශ්‍ය පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම සඳහා කොන්ත්‍රාත්කරුට ඇති වගකීම පිළිබඳ ලියකියවිලි හා ස්ථාන 27 සඳහා අවශ්‍ය ස්ථානීය පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම් ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ ආයතනය මඟින් සකස් කරයි.

## 9.3 ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (Project Management Unit – PMU)

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය යටතේ ව්‍යාපෘති කළමනාකරණ අංශයක් ස්ථාපිත කරනු ලැබේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි ප්‍රධානියා ව්‍යාපෘති අධ්‍යක්ෂක වේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය යටතේ පාරිසරික හා සමාජයීය ඒකකයක් ද ස්ථාපිත කෙරේ. කොළඹ පිහිටා ඇති ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි පාරිසරික හා සමාජයීය ඒකකයමඟින් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය සුරැකිනා ප්‍රතිපත්ති, සුරැකිනා වලට අනුකූල වීම පිළිබඳව උපදෙස් ලබා ගත හැකි වේ. ව්‍යාපෘති අධ්‍යක්ෂක යටතේ පාරිසරික හා සමාජයීය ආරක්ෂක ක්‍රම පිළිබඳව පසුබිමක් සහිත විශේෂඥයන් දෙදෙනකු පත් කරන අතර එමඟින් පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව සහ නැවත පදිංචි කිරීම් සැලසුම්කරණය කිරීමේ රාමුව ක්‍රියාත්මක වීම තහවුරු කර ගනු ලැබේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි පාරිසරික හා සමාජයීය විශේෂඥයන් අවශ්‍ය පරිදි වෙනත් පාරිසරික හා සමාජයීය නිලධාරීන් ගේ සහය ලබා ගනී.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය හි පාරිසරික අංශය පහත කරුණු සඳහා වගකිව යුතු වේ.

i. ලියකියවිලි සූදානම් කිරීම (ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගෙන යෑමේදී එහි විෂය පථයේ හෝ තවදුරත් අධ්‍යනය කළ යුතු වෙනස්කම් හමුවුවහොත්)

ii. පාරිසරික ගැටළු තක්සේරකරණ වාර්තා, පූර්ව පාරිසරික පරීක්ෂණ වාර්තා ක්‍රියාත්මක කිරීම හා ස්ථානීය පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම් සෑදීම
iii. විවිධ ආයතන මඟින් ලබා ගත යුතු පාරිසරික යෝග්‍යතා ලබා ගැනීම
iv. පාරිසරික හා සමාජයීය ගැටළු පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සන්නිවේදනය කිරීම/ උපදේශන ලබා ගැනීම, ඔවුන්ගේ අනුමැතිය ලබා ගැනීම හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම, විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා වාර්තා සහ තොරතුරු හෙළිදරව් කිරීම
v. ව්‍යාපෘතිය පිළිබද කරුණු පහදා දීම, දිස්ත්‍රිකයක් එක් ඒකකයක් ලෙස සලකා ක්‍රියාත්මක කරනු ලබන අවම කිරීමේ පැකේජ ක්‍රියාත්මක කරගෙන යාම සඳහා අවශ්‍ය අනුමැතිය හා වෙනත් කරුණු සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් ලේකම්වරු සමඟ ඉතාසමීප සම්බන්ධතාවයක් පවත්වා ගත යුතුවේ.
vi. දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා වගකිව යුතු ආයතන සමඟ ප්‍රමාණවත් උපදේශන පැවැත්වීම
vii. තත්ත්ව විශ්ලේෂණ පැවැත්වීම හා වාර්තා සැකසීම
viii. ආරක්ෂක ක්‍රමෝපායන් අධීක්ෂණය කිරීම
ix. දුක්ගැනවිලි සම්බන්ධයෙන් ක්‍රියාකිරීම හා අවශ්‍යතාවය මත දුක්ගැනවිලි සඳහා කමිටුවක් පත් කිරීම
x. පාරිසරික/සමාජයීය ආරක්ෂක ක්‍රියා පිළිබඳව දැනුවත් කිරීම් සිදු කිරීම සහ පුහුණු වැඩමුළු පැවැත්වීම. එවැනි වැඩ කටයුතු බාහිර පුද්ගලයන් වෙත භාර දිය හැක. නමුත් ඒවා ක්‍රියාත්මක කිරීමේ වගකීම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සතු වේ.
xi. කොන්ත්‍රාත් ලියකියවිලි වල ස්ථානීය පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම් වල අදාල කොටස් ඇතුලත් බවට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි පාරිසරික ඒකකය වගකිව යුතුය. එමෙන්ම ව්‍යාපෘතියේ පාරිසරික කළමනාකරණ සැලසුම් වල අඩංගු ක්‍රියාවට නැංවීමේ හා අවම කිරීමේ ක්‍රමවේද සඳහා කොන්ත්‍රාත්කරු වගකීම දරණ බවටද එම ඒකකය තහවුරු කර ගත යුතු වේ.

## 9.4 ව්‍යාපෘති අධීක්ෂණ උපදේශක අංශය

ව්‍යාපෘති උපදේශක අංශයක් ස්ථාපිත කරනු ලැබේ. මෙය ව්‍යාපෘති කළමනාකරණ ඒකකය යටතේ ස්ථාපනය වන අංශයක් වේ. මෙය ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු පිළිබඳව සොයා බැලීමට හා පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුවේ සුරැකිතා විධිවිධාන වලටඅනුව ව්‍යාපෘතිය ක්‍රියත්මක වන්නේද යන්න සොයා බැලීමට වගකියනු ලැබේ. ව්‍යාපෘති මට්ටමේ ඇති සියලුම ආරක්ෂක ගැටළු පාරිසරික හා සමාජයීය ඒකකය මඟින් සොයා බලනු ඇත. මෙම ඒකකයේ නිලධාරීන් වගකිව යුතු ආයතන හා ප්‍රාදේශීය ලේකම්වරු සමඟ සම්බන්ධතාවය පවත්වා ගනු ඇත. ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අවසරයන් හා වෙනත් යෝග්‍යතා ලබා ගැනීම සඳහා මෙම ඒකකය විසින් කොන්ත්‍රාත්කරුට සහය වනු ඇත. පාරිසරික හා සමාජයීය සුරැකිතා නිලධාරීන්ගේ කාර්යභාරය වන්නේ ව්‍යාපෘතියේ සියලු ඉදිකිරීම් පාරිසරික ආරක්ෂක ක්‍රමවේදයට අනුව සිදු වන්නේදැයි බැලීම හා පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම් කාලීනව හා සතුටුදායක අයුරින් සිදු කිරීමයි.

## 9.5 ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු

ජාතික හෝ අන්තර්ජාතික ලංසු ක්‍රියාවලියකින් තෝරා ගන්නා දක්ෂ කොන්ත්‍රාත්කරුවන් සඳහා අවම කිරීමේ ඉදිකිරීම් කටයුතු භාර දේ. ලංසු ලියකියවිලිවල අඩංගු වන පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම් වලට අනුව ක්‍රියාකිරීමට කොන්ත්‍රාත්කරු බැදී සිටී. එයට අනුව කොන්ත්‍රාත්කරු විසින් පාරිසරික ක්‍රමෝපායන් පිළිබඳ ප්‍රකාශනයක් සැකසිය යුතුය. පාරිසරික ක්‍රමෝපායන් පිළිබඳ ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් සුදුසුකම් ඇති කාර්ය මණ්ඩලයක් පත් කළ යුතුය. මෙම කාර්ය මණ්ඩලය සඳහා පාරිසරික/සමාජයීය සුරැකිතා නිලධාරියෙකු සහ ආරක්ෂක නිලධාරියෙකු ඇතුලත් වේ. ලංසුවේදී, පාරිසරික වැඩ පිළිවෙල විස්තරය ක්‍රියාවට නැංවීමේ කාර්යය කොන්ත්‍රාත්කරුගේ ව්‍යාපෘති අයවැයේ වෙනම පිරිවැයක් ලෙස සඳහන් කෙරෙනු ඇත.

## 9.6 ව්‍යාපෘතිය සඳහා වැදගත් වන රාජ්‍ය ආයතන හා ආයතනික යාන්ත්‍රණය

### i. මධ්‍යම පරිසර අධිකාරිය

ජාතික පරිසර පනතෙහි රෙගුලාසි සඳහා වගකිව යුතු වන්නේ දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරි කාර්යාලයි. දිස්ත්‍රික්කය තුල ඇති ව්‍යාපෘති වැඩබිම් වලට ඇතුළු වී පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම් ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමට එයට බලය ලබා දී තිබේ. පාරිසරික සංවේදීතාවයක් තිබෙන ව්‍යාපෘති සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙහි අනුමැතිය ලබා ගත යුතු වේ. නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති පාරිසරිකව හිතකර වන බැවින් හා නියම කරන ලද ලයිස්තුවේ නොමැති නිසා ව්‍යාපෘති වාර්තාව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ඉදිරිපත් කිරීමෙන් හා ස්ථානීය පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම් සමඟ පාරිසරික අනුමැතියන් සඳහා අවශ්‍යවන මූලික තක්සේරු ප්‍රශ්නාවලිය මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අනුමැතිය ලබා ගත හැකි වේ. මධ්‍යම පරිසර අධිකාරිය හට පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක වන ආකාරය අධික්ෂණය කළ හැකි අතර ඒ සඳහා අවශ්‍ය වාර්තා කැඳවීම සහ තවදුරටත් එය වැඩිදියුණු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම සිදු කළ හැකිය. ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන පාර්ශව වලින් ව්‍යාපෘතිය පිළිබඳව ලැබෙන පැමිණිලි සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරියට ඍජුව ක්‍රියාකළ හැකි අතර රැස්වීම් කැඳවීම, පාරිසරික ගැටළු විසඳීම මෙන්ම පාරිසරික නීති කඩකරන අවස්ථාවකදී නීතිමය පියවර ගැනීමද සිදු කළ හැකිය.

### iii. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වනාන්තර ආවරණයක් ඇති, තුරුලතා පනත මඟින් ආරක්ෂා කළ යුතු විශේෂ ලෙස නම් කර ඇති හෝ වනජීවී සංරක්ෂිත වලතිබෙන වනාන්තර රක්ෂිත වලට අයත් වන හෝ ඒවායේ සීමාවල පිහිටන ව්‍යපෘති ස්ථාන සඳහා අනුමැතියන් අවශ්‍ය වේ. අවශ්‍ය අනුමැතියන් ලබා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාපටිපාටිය ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි පාරිසරික හා සමාජයීය අංශය මඟින් සිදු කරනු ඇත. මීට අමතරව වටිනා ශාක ඉවත් කිරීමේදී, අවම කිරීමේ ක්‍රමවේද සඳහා යෝග්‍ය වගාවන් තෝරා ගැනීමේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහය ලබා ගැනේ. මෙම ආයතන දෙකටම ව්‍යාපෘතිය සඳහා මැදිහත් වීම් සිදු කළ හැකි අතර ස්ථාන පරික්ෂා කිරීම, අදාල නීති උල්ලංඝනය කරන අවස්ථාවලදී උපදෙස් ලබාදීම හෝ දැනුම්දීම් නිකුත් කිරීම සිදු කෙරේ.

### iv. ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලිය**හා සම්බන්ධ අනෙකුත් ආයතන**

